## පටුන

වගන්තිය — පිටු අංකය

1 ලුහුඬු නාමය ක්‍රියාත්මක වීමේ දිනය

### I වන කොටස

### පනත අදාළ වීම

2 පනත අදාළ වීම

### II වන කොටස

### වැරදි සහ දණ්ඩන

3 ත්‍රස්තවාදය පිළිබඳ වරද

4 ත්‍රස්තවාදය පිළිබඳ වරද සඳහා වූ දණ්ඩනය

5 ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට තැත් කිරීම යනාදිය සඳහා වූ දණ්ඩනය

6 තහනම් කළ ත්‍රස්තවාදී සංවිධානයක් ආශ්‍රිත වැරදි

7 නිශ්චිතව දක්වනු ලබන ක්‍රියා

8 ත්‍රස්තවාදය ආශ්‍රිත ක්‍රියා

9 ත්‍රස්තවාදය දිරිගැන්වීම

10 ත්‍රස්තවාදී ප්‍රකාශන ව්‍යාප්ත කිරීම

11 9 වන සහ 10 වන වගන්තිවල කාර්ය සඳහා ප්‍රකාශ සහ ප්‍රකාශන

12 ත්‍රස්තවාදය සඳහා පුහුණු වීම

13 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන සහ 12 වන වගන්ති යටතේ වන වරදක් සිදු කිරීම සඳහා වන දණ්ඩනය

14 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන සහ 12 වන වගන්ති යටතේ වන වැරදි සිදු කිරීමට තැත් කිරීම යනාදිය සඳහා වන දණ්ඩනය

15 තොරතුරු සැපයීම පැහැර හැරීම වරදක් බව

16 මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම යනාදිය වරදක් බව

17 දේපළ රාජසන්තක කිරීමෙන් දඩයක් අයකර ගැනීම

18 වැරදි, සංඥෙය වැරදි විය යුතු බව

### III වන කොටස

### වැරදි විමර්ශනය කිරීම

19 පොලිස් නිලධරයකුගේ බලතල, කර්තව්‍ය සහ කාර්ය ව්‍යාප්ත කිරීම

20 නතර කිරීමේ සහ සෝදිසි කිරීමේ බලය

21 සිරභාරයට ගනු ලබන අවස්ථාවේ දී ලබා දිය යුතු තොරතුරු

22 සිරභාරයට ගැනීම, සෝදිසි කිරීම සහ ප්‍රශ්න කිරීම පෞද්ගලිකත්වය කෙරෙහි නිසි සැලකිල්ල දක්වමින් කරනු ලැබිය යුතු බව

23 සිරභාරයට ගැනීම පොලිස් නිලධරයකු විසින් කරනු ලැබූ විට ක්‍රියාපටිපාටිය

24 සිරභාරයට ගැනීම සන්නද්ධ හමුදා සාමාජිකයකු හෝ වෙරළ ආරක්ෂක නිලධරයකු විසින් කරනු ලැබූ විට ක්‍රියාපටිපාටිය

25 සිරභාරයට ගැනීම පිළිබඳ දැනුම් දීම

26 මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කිරීම

27 මහෙස්ත්‍රාත්වරයා විසින් සැකකරු වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් කරන ලෙස විධාන කළ යුතු බව

28 රිමාන්ඩ් භාරයේ තැබිය හැකි සහ රඳවා තැබිය හැකි උපරිම කාලසීමාව

29 රඳවා තැබීමේ නියමය

30 රඳවා තැබීමේ නියමයකට යටත් සැකකරුවකු අනුමත රඳවා තැබීමේ කොන්දේසි යටතේ අනුමත රඳවා තැබීමේ ස්ථානයක තැබිය යුතු බව

31 අනුමත රඳවා තැබීමේ ස්ථානයට මහෙස්ත්‍රාත්වරයා පැමිණිය යුතු බව

32 සැකකරුට මානුෂීය ලෙස සැලකිය යුතු බව

33 රඳවා තැබීම පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම් දීම

34 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් අනුමත රඳවා තැබීමේ ස්ථානයට පැමිණීම

35 මාස දෙකක් ඉක්මවා රඳවා තැබීම මහෙස්ත්‍රාත්වරයාගේ අනුමතය ඇතිව පමණක් සිදු කළ යුතු බව

36 විමර්ශන සම්පූර්ණ කර සැකකරුවන් මුදා හැරීම

37 සැකකරු මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කළ යුතු බව

38 පොලිස් නිලධරයාට රිමාන්ඩ් භාරයේ හෝ බන්ධනාගාරයේ සිටින සැකකරු වෙත ප්‍රවේශය විය හැකි බව

39 රිමාන්ඩ් භාරයේ හෝ බන්ධනාගාරය භාරයේ තැබීම අතරතුර රඳවා තැබීම

40 රිමාන්ඩ් භාරයේ සිටින හෝ රඳවා තබා ඇති සැකකරුට නීතිඥවරයකු වෙත ප්‍රවේශ විය හැකි බව

41 අපරාධ නඩු විධාන සංග්‍රහය පනත අදාළ කර ගැනීම


## IV වන කොටස

## මේ පනත යටතේ ඇතැම් නිලධරයන්ගේ බලතල සහ කාර්ය


42 මේ පනත යටතේ වන වැරදි සිදු කිරීම වැළැක්වීම ඇතැම් නිලධරයන්ගේ කාර්යය වන බව

43 විශේෂඥවරුන් හෝ වෙනත් තැනැත්තන් පත් කිරීම

44 විමර්ශවලට පහසුකම් සැලසීම සඳහා වන බලතල

45 යාත්‍රාවක් හෝ වාහනයක් නැවැත්වීම සඳහා බලය භාවිත කිරීම

46 යම් වාහනයක්, යාත්‍රාවක් යනාදිය ස්වකීය පාලනය යටතට ගැනීම

47 යාත්‍රාවක් හෝ ගුවන්යානයක් යනාදිය පිටත්වීම හෝ යාත්‍රා කිරීම අත්හිටුවීම හෝ පමා කිරීම

48 සායනික වෝහාරික වෛද්‍ය පරීක්ෂණ

49 ආණ්ඩුවේ රස පරීක්ෂක හෝ වෙනත් විශේෂඥයකු වෙත අයිතම ඉදිරිපත් කිරීම

50 ශ්‍රී ලංකාවෙන් පිටත විමර්ශන

51 මහජනතාවගේ ආරක්ෂාව සඳහා පොලිසිය විසින් විධාන නිකුත් කළ හැකි බව

## V වන කොටස

## විමර්ශන සඳහා අවශ්‍ය වන තොරතුරු

52 බැංකු, මූල්‍ය ආයතන යනාදියෙන් තොරතුරු ලබා ගැනීම
53 සේවා සපයන්නන්ගෙන් තොරතුරු ලබා ගැනීම
54 රජයේ ආයතනවලින් තොරතුරු ලබා ගැනීම

## VI වන කොටස

## විමර්ශනවලට පහසුකම් සැලසීම සඳහා මහෙස්ත්‍රාස්වරයා විසින් ආඥා නිකුත් කළ යුතු බව

55 දත්ත සහ තොරතුරු අගුළු විවර කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයා විසින් අවසර ලබා දිය යුතු බව

## VII වන කොටස

## අපරාධ නඩු කටයුතු පැවරීම කල් තැබීම සහ අපරාධ නඩු පැවරීම අත්හිටුවීම සහ නඩු විභාගය

56 නඩු කටයුතු පැවරීම කල් තැබීම
57 අපරාධ නඩු පැවරීම අත්හිටුවීම
58 නඩු විභාගය අවසන් වන තෙක් රඳවා තබා ගැනීම
59 පනත යටතේ වන නඩු කටයුතුවලට අධිකරණයේ ප්‍රමුඛත්වය ලැබිය යුතු බව

## VIII වන කොටස

## ප්‍රකාශවල ආවේශ්‍යතාව

60 මහෙස්ත්‍රාත්වරයා විසින් ප්‍රකාශ සටහන් කළ යුතු බව
61 මහෙස්ත්‍රාත්වරයකුට ලබා දෙනු ලබන ප්‍රකාශ
62 මහෙස්ත්‍රාත්වරයකු වෙත කරනු ලැබූ ප්‍රකාශයක ආවේශ්‍යතාව සඳහා සපුරාලිය යුතු පූර්ව කොන්දේසි

## IX වන කොටස

## විවිධ නියම

63 තහනම් කිරීමේ නියම
64 සීමා කිරීමේ ආඥා
65 ඇඳිරි නීති නියම
66 තහනම් ස්ථාන

## X වන කොටස

## දඬුවම් දීමට අදාළ මාර්ගෝපදේශ

67 දඬුවම බරපතළ වන කරුණු

68 දඬුවම ලිහිල් කිරීමේ කරුණු

## XI වන කොටස

## සාමාන්‍ය විධිවිධාන

69 ළමා ආඥාපනත අදාළ විය යුතු බව

70 නඩු කටයුතුවලින් ආරක්ෂාව

71 පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි

72 නියෝග

73 විධාන

74 මේ පනත, වෙනත් ලිඛිත නීති අභිබවා බලපවත්වන බව

75 අධිකරණ සමාලෝචන

76 1979 අංක 48 දරන පනත ඉවත් කිරීම

77 අන්තර්කාලීන විධිවිධාන සහ ඉතිරි කිරීම්

78 අර්ථ නිරූපණය

79 අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පළමු උපලේඛනය

දෙවන උපලේඛනය

සිරභාරයට ගැනීම සහ අත්අඩංගුවට ගැනීම පිළිබඳ දැනුම් දීම

තුන්වන උපලේඛනය

සිරභාරයට ගැනීම පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කරනු ලබන දැනුම්දීම

හතර වන උපලේඛනය

සිරභාරයට ගැනීම පිළිබඳව පොලිස්පතිවරයාට කරනු ලබන දැනුම් දීම

පස් වන උපලේඛනය

රඳවා තැබීමේ නියෝගය

ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී සිදු කරනු ලබන ත්‍රස්තවාදී ක්‍රියාවලින්, ත්‍රස්තවාදය ආශ්‍රිත වෙනත් වැරදිවලින් සහ ත්‍රස්තවාදය පිළිබඳ වරද සංස්ථාපනය වන ඇතැම් නිශ්චිතව දක්වනු ලබන ක්‍රියාවලින් ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව සහ ශ්‍රී ලංකාවේ ජනතාව ආරක්ෂා කිරීම සඳහා ද; ශ්‍රී ලංකාවෙන් පිටත ත්‍රස්තවාදය සඳහා සූදානම් වීමට ශ්‍රී ලංකා ජනරජයේ භූමිය සහ එහි ජනතාව භාවිත කිරීම වැළැක්වීම සඳහා ද; යම් ත්‍රස්තවාදී ක්‍රියාවක් හෝ ත්‍රස්තවාදය ආශ්‍රිත වෙනත් යම් වරදක් සිදුකර ඇත්තා වූ යම් තැනැත්තකු අනාවරණය කර ගැනීම, හඳුනාගැනීම, ග්‍රහණය කර ගැනීම, සිරභාරයට ගැනීම, රඳවා තැබීම, පරීක්ෂණ පැවැත්වීම, නඩු පැවරීම සහ දඬුවම් ලබාදීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත ඉවත් කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

පූර්විකාව

ශ්‍රී ලංකාවේ ජනතාවගේ අයිතිවාසිකම් සහ නිදහස සඳහා නිසි පිළිගැනීමක් සහ ගෞරවයක් ලබා දීම සුරක්ෂිත කිරීමේ සහ ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාව සහ ශ්‍රී ලංකාවේ ජනතාවගේ ස්වෛරීභාවය ආරක්ෂා කිරීමේ කාර්ය සඳහා ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීම සුවිශේෂී වැදගත්කමකින් යුතු වන බවට ශ්‍රී ලංකා රජය විසින් සලකනු ලබන හෙයින් ද;

මහජන ආරක්ෂාව පිළිබඳ සුරක්ෂිතභාවය ළඟාකර ගැනීම නීතියේ ආධිපත්‍යය පිළිබඳ මූලධර්මවලට අනුකූලව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇති මූලික අයිතිවාසිකම්වලට සහ නිදහසට සහ ජාත්‍යන්තර මානව හිමිකම් සාධනපත්‍ර යටතේ සහතික කර ඇති තැනැත්තන්ගේ නිදහස, තැනැත්තන්ගේ ආරක්ෂාව, සාධාරණ නඩු විභාගය සහ අන්තනෝමතික ලෙස රඳවා තැබීමෙන් නිදහස් විය යුතු බවට වන අයිතිවාසිකම්වලට සම්පූර්ණයෙන් ගරු කරමින් සිදු කළ යුතු බවට පිළිගෙන ඇති හෙයින් ද;

ත්‍රස්තවාදී ක්‍රියාවල ව්‍යසනයෙන් වෙනත් ස්වෛරී ජාතීන් සහ ඒවායේ ජනතාව ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා රජය කැපවී සිටින හෙයින් ද;

ජාත්‍යන්තර මාන හා ප්‍රමිතීන් මෙන් ම දේශීය අවශ්‍යතා මත පදනම්ව ත්‍රස්තවාදයට එරෙහිව අපරාධ යුක්තිය පසිඳලීම සඳහා ඵලදායී ක්‍රමයක්

බලාත්මක කිරීම තුළින් ශ්‍රී ලංකාව විසින් දේශීය සහ ජාත්‍යන්තර ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීම සහ වැළැක්වීම සඳහා කැපවී සිටින හෙයින් සහ එය ශ්‍රී ලංකාවේ අභිලාශය වන හෙයින් ද;

ශ්‍රී ලංකාව අත්සන්කරුවකු වී සිටින යම් ත්‍රස්තවාදී ක්‍රියා සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් වැළැක්වීමට අදාළ ජාත්‍යන්තර සාධනපත්‍රවලට දේශීය වශයෙන් නෛතික බලයක් ලබා දීම සඳහා නීති පැනවීමට ශ්‍රී ලංකාව වගකීමෙන් බැඳී සිටින හෙයින් ද;

ත්‍රස්තවාදය විවිධ ආකාරවලින් සහ ස්වරූපවලින් ජාත්‍යන්තර ප්‍රජාවෙහි සාමයට සහ ආරක්ෂාවට ප්‍රබල තර්ජනයක් වී ඇති හෙයින් සහ ත්‍රස්තවාදී ක්‍රියා සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් ශ්‍රී ලංකාව සහ එහි ජනතාව හා දේපළ ආරක්ෂා කිරීම රජයේ ප්‍රමුඛ වගකීමක් වන හෙයින් ද;

ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවයට සහ භෞමික අඛණ්ඩතාවයට ත්‍රස්තවාදය බරපතළ තර්ජනයක් වී ඇති හෙයින් සහ ශ්‍රී ලංකාවේ පුරවැසියන් මරණයට පත් කිරීමට හා ඔවුන් වෙත බරපතල තුවාල සිදු කිරීමට හේතුවී ඇති හෙයින් ද; ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ පෞද්ගලික දේපළවලට එමගින් බරපතල අලාභහානි සිදුවී ඇති හෙයින් සහ ජාතික සංවර්ධනය එමගින් මන්දගාමී වී ඇති හෙයින්ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය

**1.** (1) මේ පනත 2026 අංක දරන ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තිය හැර මේ පනතේ විධිවිධාන, (මේ පනතේ "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන, පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත්වන දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

## පනත අදාළ වීම

පනත අදාළ වීම

**2.** (1) මේ පනතේ විධිවිධාන, පහත දැක්වෙන තැනැත්තන් ඇතුළුව, මේ පනත යටතේ වන වරදක් සිදු කරනු ලබන යම් තැනැත්තකුට අදාළ විය යුතු ය:-

(අ) ශ්‍රී ලංකා ජනරජයේ දේශය තුළ දී හෝ ඉන් පිටත දී මේ පනත යටතේ වන වරදක් සිදු කරනු ලබන ශ්‍රී ලංකාවේ පුරවැසියකු;

(ආ) මේ පනත යටතේ වන වරදක් -

(i) ශ්‍රී ලංකාව තුළ දී සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ සිදු කරනු ලබන යම් තැනැත්තකු;

(ii) ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය තුළ දී හෝ එයට ඉහළින් සිදු කරනු ලබන යම් තැනැත්තකු;

(iii) ශ්‍රී ලංකාවේ ගුවන් තලයෙහි සිදු කරනු ලබන යම් තැනැත්තකු;

(iv) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද හෝ ශ්‍රී ලංකා රජයට අයත් හෝ ශ්‍රී ලංකා රජය විසින් භාවිත කරනු ලබන ගුවන් යානයක හෝ යාත්‍රාවක සිට හෝ එබඳු ගුවන් යානයක් හෝ යාත්‍රාවක් සම්බන්ධයෙන් හෝ සිදු කරනු ලබන යම් තැනැත්තකු;

(v) ශ්‍රී ලංකා ජනරජයේ දේශීය ජල තීරය සහ ගුවන් තලය ඇතුළුව ශ්‍රී ලංකා ජනරජයේ දේශය තුළ යම් ගුවන් යානයක හෝ යාත්‍රාවක සිට හෝ එබඳු

ගුවන් යානයක් හෝ යාත්‍රාවක් සම්බන්ධයෙන් හෝ සිදු කරනු ලබන තැනැත්තකු;

(vi) ශ්‍රී ලංකාවේ රාජ්‍ය දූත මණ්ඩලයක හෝ කොන්සල් දූත මණ්ඩලයක පරිශ්‍රය තුළ දී හෝ එකී පරිශ්‍රය සම්බන්ධයෙන් හෝ ශ්‍රී ලංකාවේ කොන්සල් කාර්යාලයක් සම්බන්ධයෙන් හෝ එකී රාජ්‍ය දූත මණ්ඩලයේ හෝ කොන්සල් දූත මණ්ඩලයේ ප්‍රධානයාගේ පදිංචි ස්ථානය තුළ හෝ එම රාජ්‍ය දූත මණ්ඩලයේ හෝ කොන්සල් දූත මණ්ඩලයේ නිලධරයකුගේ හෝ එහි වෙනත් සේවානියුක්තයකුගේ පදිංචි ස්ථානය තුළ දී, සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ සිදු කරනු ලබන යම් තැනැත්තකු;

(vii) ශ්‍රී ලංකා රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටා ඇති යම් කාර්යාල පරිශ්‍රයක් තුළ දී හෝ එම පරිශ්‍රය සම්බන්ධයෙන් හෝ එවැනි ව්‍යවස්ථාපිත මණ්ඩලයක යම් සේවානියුක්තයකුගේ පදිංචි ස්ථානය තුළ දී සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ සිදු කරනු ලබන යම් තැනැත්තකු; සහ

(ඇ) මේ පනත යටතේ වන වරදක් -

(i) ජාත්‍යන්තර සාමය ආරක්ෂා කිරීමේ හෝ නියාමනය කිරීමේ මෙහෙවරක යෙදී සිටින පුරවැසියකු ඇතුළුව ශ්‍රී ලංකාවේ පුරවැසියකු සම්බන්ධයෙන්;

(ii) රජයට අයත් යම් දේපළක් සම්බන්ධයෙන්,

ශ්‍රී ලංකා ජනරජයේ දේශය තුළ දී හෝ ඉන් පිටත දී සිදු කරනු ලබන යම් තැනැත්තකු.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා, ''රාජ්‍යයට අයත් දේපළ'' යන්නට:-

(අ) රාජ්‍ය සංස්ථාවලට සහ ව්‍යවස්ථාපිත අරමුදල්වලට හෝ මණ්ඩලවලට;

(ආ) යම් ලිඛිත නීතියක් මගින් හෝ යම් ලිඛිත නීතියක් යටතේ ශ්‍රී ලංකා රජය සතු වූ ව්‍යාපාරවලට සහ වෙනත් ව්‍යවසායයන්ට; සහ

(ඇ) යම් සමාගමක කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් රජය විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් දරනු ලබන, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝ සංස්ථාගත කරනු ලැබූ යම් සමාගමකට,

අයත් දේපළ ද ඇතුළත් වේ.

## II වන කොටස

## වැරදි සහ දණ්ඩන

ත්‍රස්තවාදය පිළිබඳ වරද

**3.** (1) (අ) භීෂණකාරී තත්ත්වයක් ඇති කිරීමේ;

(ආ) මහජනතාව හෝ මහජනතාවගෙන් යම් කොටසක් බිය ගැන්වීමේ;

(ඇ) යම් ක්‍රියාවක් සිදු කිරීමට හෝ සිදු කිරීමෙන් වැළකී සිටීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හෝ වෙනත් යම් ආණ්ඩුවක් හෝ ජාත්‍යන්තර සංවිධානයක් වෙත බල කිරීමේ; හෝ

(ඇ) යුද්ධය ව්‍යාප්ත කිරීමේ හෝ ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් ස්වෛරී රාජ්‍යයක භෞමික අඛණ්ඩතාව උල්ලංඝනය කිරීමේ හෝ එහි ස්වෛරීභාවය කඩ කිරීමේ,

කාර්යය සඳහා, (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් ප්‍රතිඵලයක් ඇති කිරීමට සලස්වනු ලබන යම් ක්‍රියාවක් චේතනාන්විතව හෝ දැන දැන ම සිදු කරනු ලබන යම් තැනැත්තකු ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කරනු ලබන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති යම් ප්‍රතිඵලයක් පහත දැක්වෙන පරිදි විය යුතු ය:-

(අ) යම් තැනැත්තකුගේ මරණය;

(ආ) තුවාල සිදු කිරීම;

(ඇ) ප්‍රාණ ඇපයට ගැනීම;

(ඈ) පැහැර ගැනීම හෝ අපහරණය කිරීම;

(ඉ) යම් මහජන භාවිත ස්ථානයකට, යම් පොදු දේපළකට, යම් පොදු හෝ පෞද්ගලික ප්‍රවාහන පද්ධතියකට හෝ යම් යටිතල පහසුකමකට හෝ පරිසරයට බරපතළ අලාභ හානි සිදු කිරීම;

(ඊ) පොදු හෝ පෞද්ගලික දේපළ සම්බන්ධයෙන් කොල්ලකෑමේ, ත්‍රාසද්ග්‍රහණය කිරීමේ හෝ සොරකම් කිරීමේ වරද සිදු කිරීම;

(උ) මහජනතාවගේ හෝ මහජනතාවගෙන් යම් කොටසකගේ සෞඛ්‍යය සහ ආරක්ෂාවට බරපතළ අවදානමක් ඇති කිරීම;

(ඌ) යම් ඉලෙක්ට්‍රොනික හෝ ස්වයංක්‍රීය හෝ පරිගණකගත පද්ධතියකට හෝ ජාලයකට හෝ ශ්‍රී ලංකාවට පවරා දී ඇති වසම්වල සයිබර් අවකාශයට හෝ ශ්‍රී ලංකාවට පවරා දී ඇති වසම්වල ලියාපදිංචි වී සිටින වෙබ් අඩවිවලට

බරපතළ බාධා ඇති කිරීම හෝ අලාභ හානි සිදු කිරීම හෝ එවැන්නකට මැදිහත් වීම;

(එ) යම් ආගමික හෝ සංස්කෘතික දේපළක් විනාශ කිරීම හෝ එවැනි දේපළකට බරපතළ අලාභ හානි සිදු කිරීම;

(ඒ) සංඥා සම්ප්‍රේෂණයක් සහ වෙනත් යම් සංඛ්‍යාත මත පදනම් වූ සම්ප්‍රේෂණ පද්ධතියක් ඇතුළුව යම් ඉලෙක්ට්‍රොනික, ඇනලොග්, ඩිජිටල් හෝ වෙනත් රැහැන් සහිත හෝ රැහැන් රහිත සම්ප්‍රේෂණ පද්ධතියකට බරපතළ බාධා ඇති කිරීම හෝ අලාභහානි සිදු කිරීම හෝ එවැනි පද්ධතියකට මැදිහත් වීම;

(ඔ) නීත්‍යානුකූල බලයක් නොමැතිව:-

(i) ගිනි අවි, පීඩාකාරී ආයුධ, වෙඩි බෙහෙත්, පුපුරණ ද්‍රව්‍ය;

(ii) පුපුරණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා භාවිත කරන හෝ භාවිත කිරීමට අරමුණු කරන යම් ද්‍රව්‍යයක් හෝ දෙයක් හෝ ගිනිගන්නා ද්‍රව්‍ය හෝ මළ බැඳෙන ද්‍රව්‍ය හෝ;

(iii) යම් ජීව විද්‍යාත්මක, රසායනික, විද්‍යුත්, ඉලෙක්ට්‍රොනික හෝ න්‍යෂ්ටික අවියක්, වෙනත් න්‍යෂ්ටික පිපිරුම් උපකරණයක්, න්‍යෂ්ටික ද්‍රව්‍යයක්, විකිරණශීලී ද්‍රව්‍යයක් හෝ විකිරණ විමෝචන උපකරණයක්,

ආනයනය කිරීම, අපනයනය කිරීම, නිෂ්පාදනය කිරීම, රැස් කිරීම, ලබා ගැනීම, සැපයීම, වෙළෙඳාම් කිරීම, සන්තකයේ තබා ගැනීම හෝ භාවිත කිරීම.

(3) (2) වන උපවගන්තියේ කාර්යය සඳහා "මහජන භාවිත ස්ථානය" යන්නට, අදාළ වේලාවේ දී මහජනතාවට අයිතියක් ලෙස හෝ අනාගාකාරයෙන් ප්‍රවේශ විය හැකි හෝ ප්‍රවේශ වීමට අවසරය ඇති යම් මහා මාර්ගයක් සහ වෙනත් යම් පරිශ්‍රයක් හෝ ස්ථානයක් ඇතුළත් වේ.

(4) හුදෙක් ම යම් තැනැත්තකු විසින් යම් විරෝධතාවක, මහජන සහාය ලබා ගැනීමක හෝ විරුද්ධ මතයක් පළ කිරීමක යෙදී සිටීම හෝ යම් වැඩවර්ජනයක, පිටමං කිරීමක හෝ වෙනත් කාර්මික ක්‍රියාමාර්ගයක යෙදී සිටීම යන කරුණම එම තැනැත්තා විසින්:-

(අ) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති චේතනාව හෝ දැනීම ඇතිව එම ක්‍රියාව සිදු කරනු ලබන බවට හෝ සිදු කිරීමට තැත් කරන බවට, අනුබල දෙන බවට, කුමන්ත්‍රණය කරන බවට හෝ සූදානම් වන බවට; හෝ

(ආ) (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රතිඵලයක් ඇති කිරීමට අදහස් කරනු ලබන බවට හෝ දැන දැන ම ඇති කරනු ලබන බවට,

නිගමනය කිරීම සඳහා ප්‍රමාණවත් පදනමක් නොවන්නේ ය.

(5) පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් ගිවිසුමක විෂය පථය තුළ හෝ අර්ථ නිරූපණය තුළ වරදක් සංස්ථාපනය වන යම් ක්‍රියාවක් සිදු කරනු ලබන යම් තැනැත්තකු විසින් ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කරනු ලබන්නේ ය.

ත්‍රස්තවාදය පිළිබඳ වරද සඳහා වූ දණ්ඩනය

**4.** (අ) 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු, 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති වරදක් සිදු කරනු ලබන යම් තැනැත්තකුට මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කරනු ලැබිය යුතු ය;

(ආ) 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ), (ඇ, (ඈ), (ඉ), (ඊ), (උ), (ඌ), (එ), (ඒ) හෝ (ඔ) ඡේද සමග කියවිය යුතු, 3

වන වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති වරදක් සිදු කරනු ලබන යම් තැනැත්තකු, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, අවුරුදු විස්සක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් මිලියන විස්සක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය;

(ඇ) 3 වන වගන්තියේ (5) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති වරදක් සිදු කරනු ලබන යම් තැනැත්තකු, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, අදාළ ප්‍රඥප්තියේ නියම කරනු ලැබ ඇති බන්ධනාගාරගත කිරීමට ම, දඩයට ම හෝ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය:

එසේ වුව ද, එම ප්‍රඥප්තිය යටතේ එම වරද සඳහා මරණීය දණ්ඩනය නියම කර ඇති අවස්ථාවක දී, මේ පනතේ කාර්ය සඳහා එම දණ්ඩනය, ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට තැත් කිරීම යනාදිය සඳහා වූ දණ්ඩනය

**5.** (1) 3 වන වගන්තිය යටතේ ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට තැත් කරනු ලබන, අනුබල දෙනු ලබන හෝ කුමන්ත්‍රණය කරනු ලබන හෝ 3 වන වගන්තිය යටතේ වරදක් සිදු කිරීමට සූදානමින් යම් ක්‍රියාවක් කරනු ලබන සහ එම තැත් කිරීමේ, අනුබල දීමේ, කුමන්ත්‍රණය කිරීමේ හෝ සූදානම් වීමේ ප්‍රතිඵලයක් ලෙස 3 වන වගන්තිය යටතේ ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කරනු ලබන යම් තැනැත්තකු ත්‍රස්තවාදය පිළිබඳ වරද සඳහා පනවන ලද දණ්ඩනයට ම යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් තැත් කිරීමේ, අනුබල දීමේ, කුමන්ත්‍රණය කිරීමේ හෝ සූදානම් වීමේ ප්‍රතිඵලයක් ලෙස 3 වන වගන්තිය යටතේ ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කරනු ලැබූ විට, එම තැනැත්තා අවුරුදු පහළොවක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් මිලියන පහළොවක් නොඉක්මවන දඩයකට යටත්විය යුතු ය.

තහනම් කළ ත්‍රස්තවාදී සංවිධානයක් ආශ්‍රිත වැරදි

**6.** ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී, දැන දැනම, යම් තහනම් කළ ත්‍රස්තවාදී සංවිධානයක නැතහොත් එවැනි යම් තහනම් කළ ත්‍රස්තවාදී සංවිධානයක් නියෝජනය කරන, එම සංවිධානය වෙනුවෙන් කටයුතු කරන, එම සංවිධානය හා සම්බන්ධ හෝ එම සංවිධානයට අදාළ වෙනත් යම් සංවිධානයක: -

(අ) සාමාජිකයකු වන;

(ආ) නායකයකු, සාමාජිකයකු හෝ සක්‍රීය සාමාජිකයකු ලෙස එකතුවන, කටයුතු කරන හෝ සේවය කරන;

(ඇ) සාමාජිකයකු හෝ සක්‍රිය සාමාජිකයකු ලෙස යම් තැනැත්තකු බඳවා ගන්නා හෝ සාමාජිකයකු වීමට හෝ සක්‍රීය සාමාජිකයකු වීමට යම් තැනැත්තකු පොළඹවන හෝ දිරිගන්වන;

(ඈ) ඒ සඳහා නායකත්වය ලබා දෙන;

(ඉ) නිල ඇඳුම, ඇඳුම, සලකුණ, ලාංඡනය හෝ ධජය අඳින, ප්‍රදර්ශනය කරන, ඔසවන හෝ සන්තකය දරන;

(ඊ) යම් රැස්වීමක් කැඳවන, රැස් කරන, පවත්වන හෝ ඊට සහභාගී වන;

(උ) සාමාජිකත්වය ලබා ගන්නා හෝ ඊට එකතු වන;

(ඌ) යම් සාමාජිකයකුට, සක්‍රීය සාමාජිකයකුට හෝ වෙනත් යම් සාහායකයකුට රැකවරණය දෙන, සඟවන හෝ සහාය වන;

(එ) ප්‍රවර්ධනය කරන, දිරිගන්වන, සහයෝගය දෙන, උපදෙස් දෙන, සහාය වන හෝ එම සංවිධානය වෙනුවෙන් ක්‍රියා කරන;

(ඒ) යම් ක්‍රියාකාරකමක් හෝ ඉසව්වක් සංවිධානය කරන හෝ ඊට සහභාගී වන;

(ඔ) ඒ සඳහා මුදල් හෝ ද්‍රව්‍ය පරිත්‍යාග කරන හෝ ලබා දෙන;

(ඕ) ඒ සඳහා යම් ද්‍රව්‍යයක් සපයන, ගබඩා කරන, ප්‍රවාහනය කරන, සන්තකය දරන හෝ බෙදාහරින හෝ එවැනි යම් සංවිධානයක යම් දෙයක් සපයන, ගබඩා කරන, ප්‍රවාහනය කරන, සන්තකය දරන හෝ බෙදාහරින;

(ක) අරමුණ පිළිගන්නා හෝ නියෝජනය කරන;

(ග) ඒ සමග යම් ගනුදෙනුවක නිරත වන; හෝ

(ච) ඒ වෙනුවෙන් තොරතුරු ප්‍රචාරණය කිරීමට කටයුතු සලස්වන,

යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන්නේ ය:

එසේ වුව ද, මේ උපවගන්තියේ සඳහන් කිසිවක් මගින් නීතිඥවරයකු විසින් තහනම් කළ ත්‍රස්තවාදී සංවිධානයක් සම්බන්ධයෙන් ස්වකීය වෘත්තීය කාර්ය ඉටු කිරීම සීමා කරන ලෙස තේරුම් ගනු නොලැබිය යුතු ය.

නිශ්චිතව දක්වනු ලබන ක්‍රියා

**7.** (අ) මේ පනත යටතේ වන වරදක වින්දිතයකු හෝ මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම පිළිබඳ සාක්ෂිකරුවකු සම්බන්ධයෙන්, 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ III වන කොටස (අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට එරෙහි වැරදි) යටතේ වන වරදක් සිදු කරනු ලබන; හෝ

(ආ) මේ පනතේ 3 වන වගන්තියේ දක්වා ඇති ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීම, එම වරද සිදුකිරීමට තැත් කිරීම, අනුබල දීම,

කුමන්ත්‍රණය කිරීම හෝ සූදානම් වීම යන කාර්යය සඳහා යම් ද්‍රව්‍යයක් හෝ දෙයක් සන්තකයේ තබාගනු ලබන,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

ත්‍රස්තවාදය ආශ්‍රිත ක්‍රියා

**8.** (1) යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කර ඇති බව හෝ එවැනි වරදක් සිදු කිරීමට සම්බන්ධ වී ඇති බව දැන දැන ම හෝ ඒ බව විශ්වාස කිරීමට සාධාරණ හේතු තිබිය දී ඒ තැනැත්තාට රැකවරණය දෙන, ඒ තැනැත්තා වසන් කරන හෝ වෙනත් යම් ආකාරයකින් සාවද්‍ය ලෙස ඒ තැනැත්තා හඳුනා ගැනීම, සිරභාරයට ගැනීම, අත්අඩංගුවට ගැනීම හෝ රඳවා තැබීම වළක්වන, ඊට අවහිර කරන හෝ මැදිහත්වන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

(2) වෙනත් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ වන වරදක් සිදු කිරීමට, එවැනි වරදක් සිදු කිරීමට තැත් කිරීමට, අනුබල දීමට, කුමන්ත්‍රණය කිරීමට හෝ එවැනි වරදක් සිදු කිරීමට සූදානම් වීමට යම් රහස්‍ය තොරතුරු භාවිත කරනු ලබන බව දැන දැන ම හෝ ඒ බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු තිබිය දී:-

(අ) එම තොරතුරු යම් තැනැත්තකු වෙත සැපයීමේ අරමුණ ඇතිව එම තොරතුරු රැස් කරනු ලබන; හෝ

(ආ) එම තොරතුරු යම් තැනැත්තකු වෙත සපයනු ලබන,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

ත්‍රස්තවාදය දිරිගැන්වීම

**9.** (1) ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට, ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට තැත් කිරීමට, අනුබල දීමට, කුමන්ත්‍රණය කිරීමට හෝ ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට සූදානම් වීමට ජනතාව හෝ ජනතාවගෙන් යම් කොටසක් සෘජුව ම හෝ වක්‍රව දිරි ගැන්වීමේ හෝ පෙළඹවීමේ චේතනාවෙන් යම් ප්‍රකාශයක් පළ කරනු ලබන හෝ පළ කිරීමට කටයුතු සලස්වනු ලබන හෝ යම් වචනයක් හෝ වචන කථා කරනු ලබන හෝ යම් සංඥාවක් හෝ දෘශ්‍ය නිරූපණයක් සිදු කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

(2) ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට, ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට තැත් කිරීමට, අනුබල දීමට, කුමන්ත්‍රණය කිරීමට හෝ ත්‍රස්තවාදය පිළිබඳ පිළිබඳ වරද සිදු කිරීමට සූදානම් වීමට ජනතාව හෝ ජනතාවගෙන් යම් කොටසක් ඍජුව ම හෝ වක්‍රව දිරිගැන්වීමේ හෝ පෙළඹවීමේ දැනීම ඇතිව යම් ප්‍රකාශයක් පළ කරන හෝ පළ කිරීමට කටයුතු සලස්වන හෝ එවැනි යම් වචනයක් හෝ වචන කතා කරන හෝ එවැනි යම් සංඥාවක් හෝ දෘශ්‍ය නිරූපණයක් සිදු කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

(3) ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට, ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට තැත් කිරීමට, අනුබල දීමට, කුමන්ත්‍රණය කිරීමට හෝ ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට සූදානම් වීමට ජනතාව හෝ ජනතාවගෙන් යම් කොටසක් ඍජුව ම හෝ වක්‍රව දිරිගන්වන්නේ ද නැතහොත් පොළඹවන්නේ ද යන්න පිළිබඳ අනවධානීව යම් ප්‍රකාශයක් පළ කරනු ලබන හෝ පළ කිරීමට කටයුතු සලස්වනු ලබන හෝ එවැනි යම් වචනයක් හෝ වචන කතා කරන හෝ එවැනි යම් සංඥාවක් හෝ දෘශ්‍ය නිරූපණයක් සිදු කරනු ලබන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

ත්‍රස්තවාදී ප්‍රකාශන ව්‍යාප්ත කිරීම

**10.** (1) ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට, ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට තැත් කිරීමට, අනුබල දීමට, කුමන්ත්‍රණය කිරීමට හෝ ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට සූදානම් වීමට, ජනතාව හෝ ජනතාවගෙන් යම් කොටසක් හෝ යම් තැනැත්තකු ඍජුව ම හෝ වක්‍රව දිරිගැන්වීමේ හෝ පෙළඹවීමේ චේතනාව හෝ දැනීම ඇතිව:-

(අ) ත්‍රස්තවාදී ප්‍රකාශනයක් බෙදා හරිනු ලබන, නැතහොත් සංසරණය කරනු ලබන;

(ආ) ත්‍රස්තවාදී ප්‍රකාශනයක් ලබා දෙනු ලබන, විකුණනු ලබන හෝ තාවකාලිකව ලබා දෙනු ලබන;

(ඇ) ත්‍රස්තවාදී ප්‍රකාශනයක් විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලබන;

(ඇ) ත්‍රස්තවාදී ප්‍රකාශනයක් ලබා ගැනීමට, කියවීමට, සවන් දීමට හෝ බැලීමට හෝ නැතහොත් අත්කර ගැනීමට හැකියාව ලැබෙන යම් සේවාවක් වෙනත් තැනැත්තන්ට සපයනු ලබන;

(ඉ) ත්‍රස්තවාදී ප්‍රකාශනයක අන්තර්ගත දේ සම්ප්‍රේෂණය කරනු ලබන; හෝ

(ඊ) ත්‍රස්තවාදී ප්‍රකාශනයක් තම සන්තකයේ තබා ගනු ලබන,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

(2) ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට, ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට තැත් කිරීමට, අනුබල දීමට, කුමන්ත්‍රණය කිරීමට හෝ ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට සූදානම් වීමට ජනතාව හෝ ජනතාවගෙන් යම් කොටසක් හෝ යම් තැනැත්තකු සෘජුව ම හෝ වක්‍රව දිරිගන්වන්නේ ද නැතහොත් පෙළඹවන්නේ ද යන්න පිළිබඳ අනවධානීව:-

(අ) ත්‍රස්තවාදී ප්‍රකාශනයක් බෙදා හරිනු ලබන, නැතහොත් සංසරණය කරනු ලබන;

(ආ) ත්‍රස්තවාදී ප්‍රකාශනයක් ලබා දෙනු ලබන, විකුණනු ලබන හෝ තාවකාලිකව ලබා දෙනු ලබන;

(ඇ) ත්‍රස්තවාදී ප්‍රකාශනයක් විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලබන;

(ඇ) ත්‍රස්තවාදී ප්‍රකාශනයක් ලබා ගැනීමට, කියවීමට, සවන් දීමට හෝ බැලීමට හෝ නැතහොත් අත්කර ගැනීමට හැකියාව ලැබෙන යම් සේවාවක් වෙනත් තැනැත්තන්ට සපයනු ලබන; හෝ

(ඉ) ත්‍රස්තවාදී ප්‍රකාශනයක අන්තර්ගත දේ ඉලෙක්ට්‍රොනිකව සම්ප්‍රේෂණය කරනු ලබන,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවල කාර්ය සඳහා “ත්‍රස්තවාදී ප්‍රකාශය” යනු:-

(අ) ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට, ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට තැත් කිරීමට, අනුබල දීමට, කුමන්ත්‍රණය කිරීමට හෝ ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට සූදානම් වීමට ඔවුන් ඍජුව හෝ වක්‍රව දිරිගන්වන්නක් ලෙස හෝ වෙනත් ආකාරයෙන් පොළඹවන්නක් ලෙස; හෝ

(ආ) ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට, ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට තැත් කිරීමට, අනුබල දීමට, කුමන්ත්‍රණය කිරීමට හෝ ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට සූදානම් වීමට උපකාරී වන්නක් ලෙස,

තේරුම්ගත හැකි ප්‍රකාශයක් වන්නේ ය.

9 වන සහ 10 වන වගන්තිවල කාර්යය සඳහා වන ප්‍රකාශ සහ ප්‍රකාශන

**11.** (1) 9 වන සහ 10 වන වගන්තිවල කාර්යය සඳහා, අවස්ථාවෝචිත පරිදි, ප්‍රකාශයක් හෝ ප්‍රකාශනයක් යන්නට:-

(අ) ජනතාවගේ ප්‍රතිලාභය සඳහා හෝ ජාතික යහපත පිණිස නිසි උද්යෝගයෙන් යුතුව සද්භාවයෙන් පළ කරන ලද යමක්; හෝ

(ආ) සද්භාවයෙන් සිදු කරන ලද යම් මතයක්, සාධාරණ විවේචනයක්, උපහාසයක්, හාස්‍යමය අනුකරණයක්, අවවාදයක් හෝ අධ්‍යාරෝපණයක්,

ඇතුළත් නොවිය යුතු ය.

(2) 9 වන සහ 10 වන වගන්තිවල කාර්යය සඳහා, අවස්ථාවෝචිත පරිදි, ප්‍රකාශයක් හෝ ප්‍රකාශනයක් යන්නට:-

(අ) ලියවිල්ලක්;

(ආ) දෘශ්‍ය නිරූපණ;

(ඇ) මුද්‍රිත මාධ්‍ය;

(ඈ) අන්තර්ජාලය;

(ඉ) ඉලෙක්ට්‍රොනික මාධ්‍ය; හෝ

(ඊ) වෙනත් ආකාරයක ප්‍රසිද්ධ දැන්වීමක් හෝ ප්‍රචාරණයක්,

ඇතුළුව යම් ආකාරයකින් සිදු කරන ලද යම් සන්නිවේදනයක් ඇතුළත් වේ.

(3) 9 වන සහ 10 වන වගන්තිවල කාර්යය සඳහා:-

(අ) ප්‍රකාශයක් තේරුම් ගැනීමට ඉඩ ඇත්තේ කෙලෙස ද යන්න සහ 9 වන වගන්තිය යටතේ ඉන් ජනතාව විසින් වටහා ගනු ඇති බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැක්කේ කුමක් ද යන්න;

(ආ) යම් ප්‍රකාශනයක් 10 වන වගන්තිය යටතේ ත්‍රස්තවාදී ප්‍රකාශනයක් ද යන්න,

නිශ්චය කිරීමේ දී, අවස්ථාවෝචිත පරිදි, යම් ප්‍රකාශයක හෝ ප්‍රකාශනයක අන්තර්ගතය සමස්ථයක් වශයෙන් සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

ත්‍රස්තවාදය සඳහා පුහුණු වීම

**12.** (1) යම් තැනැත්තකු විසින් උපදෙස් හෝ පුහුණුව ලබා දෙන අවස්ථාවේ දී, එම උපදෙස් හෝ පුහුණුව ලබා ගන්නා තැනැත්තා විසින්, ඔහු එම උපදෙස් හෝ පුහුණුව ලබන්නේ යම් නිපුණතා සම්බන්ධයෙන් ද, එම නිපුණතා 3 වන වගන්තිය යටතේ ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීම, ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට තැත් කිරීම, අනුබල දීම, කුමන්ත්‍රණය කිරීම හෝ ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට සූදානම් වීම සඳහා හෝ ඒ සම්බන්ධයෙන්, භාවිත කිරීමට අදහස් කරන බව හෝ භාවිත කිරීමට ඉඩ ඇති

බව දන්නේ නම් හෝ ඒ බවට විශ්වාස කිරීමට හේතු ඇත්නම්, එම තැනැත්තා මේ වගන්තිය යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

(2) යම් තැනැත්තකු විසින්, උපදෙස් හෝ පුහුණුව ලබා ගැනීමේ දී එම තැනැත්තකා විසින්, තමා එම උපදෙස් හෝ පුහුණුව ලබන්නේ යම් නිපුණතා සම්බන්ධයෙන් ද, එම නිපුණතා ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීම, ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට තැත් කිරීම, අනුබල දීම, කුමන්ත්‍රණය කිරීම හෝ ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට සූදානම් වීම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් භාවිත කිරීමට අදහස් කරනු ලබන අවස්ථාවක දී, එම තැනැත්තා 6 වන වගන්තිය යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා "උපදෙස් හෝ පුහුණුව" යන්නෙන් -

(අ) ගිනි අවි, පුපුරණ ද්‍රව්‍ය හෝ රසායනික, ජීව විද්‍යාත්මක හෝ න්‍යෂ්ටික ආයුධ සෑදීම හෝ භාවිත කිරීම; හෝ

(ආ) ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමේ කාර්යය සඳහා හෝ ඒ සම්බන්ධයෙන් යම් දෙයක් කිරීම සඳහා වූ යම් ක්‍රමවේදයක් හෝ ශිල්පක්‍රමයක් භාවිත කිරීම, සැලසුම් කිරීම හෝ යොදා ගැනීම,

සම්බන්ධයෙන් වන උපදෙස් හෝ පුහුණුව අදහස් වේ.

6 වන , 7 වන, 8 වන, 9 වන , 10 වන සහ 12 වන වගන්ති යටතේ වරදක් සිදු කිරීම සඳහා වන දණ්ඩනය

**13.** 6 වන , 7 වන, 8 වන, 9 වන , 10 වන සහ 12 වන වගන්ති යටතේ වන වරදක් සිදු කරනු ලබන තැනැත්තකු, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, එම තැනැත්තා අවුරුදු පහළොවක් නොඉක්මවන කාලයක් සඳහා බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන පහළොවක් නොඉක්මවන දඩයකට හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම යටත් විය යුතු ය.

6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන සහ 12 වන වගන්ති යටතේ වන වැරදි සිදු කිරීමට තැත්

**14.** (1) යම් තැනැත්තකු විසින්, 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන හෝ 12 වන වගන්ති යටතේ වන යම් වරදක් සිදු කිරීමට තැත් කරන්නේ නම්, අනුබල දෙන්නේ නම් හෝ කුමන්ත්‍රණය කරන්නේ නම් හෝ එම වගන්ති යටතේ වන යම් වරදක් සිදු කිරීමට සූදානම් වීමේ යම් ක්‍රියාවක් සිදු කරන්නේ

කිරීම යනාදිය සඳහා වන දණ්ඩනය

නම් සහ එම තැත් කිරීමේ, අනුබල දීමේ, කුමන්ත්‍රණය කිරීමේ හෝ සූදානම් වීමේ ප්‍රතිඵලයක් වශයෙන්, 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන, හෝ 12 වන වගන්ති යටතේ වන වරදක් සිදු කර ඇත්නම් එම තැනැත්තා එම වරදට නියම කර ඇති දණ්ඩනයට ම යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් එම තැත් කිරීමේ, අනුබල දීමේ, කුමන්ත්‍රණය කිරීමේ හෝ සූදානම් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන හෝ 12 වන වගන්ති යටතේ වන යම් වරදක් සිදු කර නොමැති නම්, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, එම තැනැත්තා අවුරුදු දහයක් නොඉක්මවන කාලයක් සඳහා බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන දහයක් නොඉක්මවන දඩයකට හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

තොරතුරු සැපයීම පැහැර හැරීම වරදක් බව

**15.** (1) (අ) යම් තැනැත්තකු විසින් -

(i) වෙනත් යම් තැනැත්තකු මේ පනත යටතේ වන වරදක් සිදු කිරීමට සූදානම් වන බවට, තැත් කරන බවට, අනුබල දෙන බවට හෝ කුමන්ත්‍රණය කරන බවට; හෝ

(ii) වෙනත් යම් තැනැත්තකු මේ පනත යටතේ වන වරදක් සිදු කර ඇති බවට,

දනිමින් හෝ එසේ විශ්වාස කිරීමට හේතු තිබිය දී, පොලිස් නිලධරයකුට එම තොරතුරු සැපයීම පැහැර හරින හෝ එම පොලිස් නිලධරයාට අසත්‍ය හෝ නොමග යවන සුළු තොරතුරු සපයනු ලබන අවස්ථාවක දී; හෝ

(ආ) ත්‍රස්තවාදය පිළිබඳ වරද හෝ ත්‍රස්තවාදය ආශ්‍රිත වරදක් සිදු කර ඇති බවට ඔහු දන්නා යම් තැනැත්තකු සිටින ස්ථානය සම්බන්ධයෙන් වන තොරතුරු තම සන්තකයේ තිබිය දී ඒ තොරතුරු පොලිස් නිලධරයකුට සැපයීම පැහැර හරින

හෝ එම පොලිස් නිලධරයාට අසත්‍ය හෝ නොමඟ යවන සුලු තොරතුරු සපයනු ලබන අවස්ථාවක දී,

එවැනි යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, අවුරුදු හතක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන හතක් නොඉක්මවන දඩයකට හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(2) (අ) ඡේදය යටතේ නියම කර ඇති පරිදි වාර්තා කිරීම පැහැර හැරීම හෝ (ආ) ඡේදය යටතේ නියම කර ඇති පරිදි තොරතුරු සැපයීම පැහැර හැරීම සම්බන්ධයෙන් තමාට සාධාරණ හේතුවක් ඇති බව ඔප්පු කිරීම, (1) වන උපවගන්තිය යටතේ වන වරදකට චෝදනා ලැබූ තැනැත්තකු සඳහා විත්තිවාචකයක් විය යුතු ය.

මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම යනාදිය වරදක් බව

**16.** (අ) මේ පනත ප්‍රකාර සිදු කරන ලද යම් නීත්‍යනුකූල විධානයක් හෝ නියමයක් හිතාමතාම කඩ කරන හෝ උල්ලංඝනය කරමින් ක්‍රියා කරන;

(ආ) මේ පනත ප්‍රකාර සිදු කරන ලද විධානයකට අනුකූලව ක්‍රියා කිරීම හිතාමතාම පැහැර හරින හෝ නොසලකා හරින;

(ඇ) මේ පනත යටතේ විමර්ශනයක් සිදු කරන පොලිස් නිලධරයකුට තොරතුරු ලබා දීම හිතාමතා ම පැහැර හරින හෝ එවැනි නිලධරයකු අසන ප්‍රශ්නයකට පිළිතුරු ලෙස අසත්‍ය හෝ නොමඟ යවන සුලු තොරතුරු හිතාමතා ම ලබා දෙන:

එසේ වුව ද, එවැනි යම් තැනැත්තකුට අපරාධාරෝපණය කරනු ලබන ආකාරයේ ප්‍රකාශයක් මේ ඡේදය යටතේ ලබා දෙන ලෙස එම තැනැත්තාට බලකිරීමක් සිදු කරනු නොලැබිය යුතු ය;

(ඈ) මේ පනත යටතේ නිකුත් කරන ලද යම් නීත්‍යානුකූල නියෝගයක් හෝ විධානයක් ක්‍රියාත්මක කිරීම හිතාමතා ම වළක්වන හෝ ඊට බාධා කරන; හෝ

(ඉ) මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීම හිතාමතා ම වළක්වන හෝ ඊට බාධා කරන,

යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට සහ රුපියල් මිලියන දෙකක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

දේපළ රාජසන්තක කිරීමෙන් දඩයක් අයකර ගැනීම

**17**. මේ පනත යටතේ පනවන ලද යම් දඩයක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක දී, මහාධිකරණය විසින්, එම දඩ මුදලේ වටිනාකමට සමාන බවට මහාධිකරණය විසින් සලකනු ලබන පරිදි වූ එම පැහැර හරින්නාගේ යම් චංචල හෝ නිශ්චල දේපළක් ජනරජය වෙත රාජසන්තක කරන ලෙස ආඥාවක් කරනු ලැබිය හැකි ය. එම දේපළ විකිණීමෙන්, එම දඩ මුදලේ ප්‍රමාණය ඉක්මවා ලැබෙන යම් මුදලක්, එම දේපළ රාජසන්තක කරනු ලැබුවේ යම් තැනැත්තකුගේ ද, එම තැනැත්තා වෙත ආපසු ගෙවනු ලැබිය යුතු ය.

වැරදි, සංඥෙය වැරදි විය යුතු බව

**18.** මේ පනත යටතේ වූ යම් වරදක් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සංඥෙය වරදක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## III වන කොටස

## වැරදි විමර්ශනය කිරීම

පොලිස් නිලධරයකුගේ බලතල, කර්තව්‍ය සහ කාර්ය ව්‍යාප්ත කිරීම

**19.** වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් වරදක සැකකරුවකු සෝදිසි කිරීම සහ සිරභාරයට ගැනීමට අදාළව අපරාධ නඩු විධාන සංග්‍රහය පනත යටතේ පොලිස් නිලධරයකු වෙත පිරිනමන ලද හෝ පනවන ලද සියලු බලතල, කර්තව්‍ය සහ කාර්ය, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ පනත යටතේ සිදු කරන ලද වරදකට අදාළව යම් සන්නද්ධ හමුදා

සාමාජිකයකු සහ වෙරළ ආරක්ෂක නිලධරයකු වෙත පිරිනමනු ලැබූ නැතහොත් පනවනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

නතර කිරීමේ සහ සෝදිසි කිරීමේ බලය

**20.** (1) මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් සාධාරණ සැකයක් පවතින අවස්ථාවක දී, (මේ කොටසේ මින්මතු "සිරභාරයට ගන්නා නිලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් පොලිස් නිලධරයකු, සන්නද්ධ හමුදා සාමාජිකයකු හෝ වෙරළ ආරක්ෂක නිලධරයකු විසින්,-

(අ) යම් සැකකරුවකු, වාහනයක්, යාත්‍රාවක්, දුම්රියක් හෝ රියදුරකු රහිත වාහනයක් හෝ ගුවන්යානයක් නැවැත්වීම සහ සෝදිසි කිරීම;

(ආ) යම් සැකකරුවකුගෙන් ප්‍රශ්න කිරීම;

(ඇ) යම් පරිශ්‍රයකට හෝ ඉඩමකට ඇතුළු වීම සහ සෝදිසි කිරීම; සහ

(ඈ) මේ පනත යටතේ වන යම් වරදක් සිදු කිරීමේ දී භාවිත කරනු ලැබූ, ඉන් ව්‍යුත්පන්න වූ, ඊට සම්බන්ධ වූ හෝ ඒ සඳහා සම්බන්ධතාවක් දක්වන හෝ එවැනි වරදක් සිදු කිරීමේ දී සඳහා භාවිත කරනු ලැබූ බවට, ඉන් ව්‍යුත්පන්න වූ බවට, ඊට සම්බන්ධ වූ බවට හෝ ඒ සඳහා සම්බන්ධතාවක් දක්වන ලද බවට සාධාරණ ලෙස සැක කරනු ලබන යම් ලේඛනයක්, දෙයක් හෝ ද්‍රව්‍යයක් ස්වකීය භාරයට ගැනීම,

කරනු ලැබිය හැකි ය.

(2) 47 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධාන, යාත්‍රාවකට හෝ ගුවන්යානයකට අදාළව මේ වගන්තිය යටතේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී අදාළ බලධරයන් වෙත දැන්වීමක් කිරීම සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය ප්‍රකාරව ප්‍රකාරව පොලිස් නිලධරයකු විසින් එසේ භාරයට ගනු ලැබූ යම් ලේඛනයක්, දෙයක් හෝ ද්‍රව්‍යයක්, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින් අදාළ පොලිස් නිලධරයා අනුයුක්ත කර ඇති පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත හෝ ආසන්නත ම පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය ප්‍රකාරව යම් සන්නද්ධ හමුදා සාමාජිකයකු හෝ වෙරළ ආරක්ෂක නිලධරයකු විසින් භාරයට ගනු ලැබූ යම් ලේඛනයක්, දෙයක් හෝ ද්‍රව්‍යයක් ආසන්නත ම පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත භාරදිය යුතු ය.

(5) (3) වන සහ (4) වන උපවගන්තිවල දක්වා ඇති පොලිස් ස්ථානය භාර නිලධරයා විසින්, මහෙස්ත්‍රාත්වරයා වෙත ඒ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එකී මහෙස්ත්‍රාත්වරයා විසින්, එසේ භාරයට ගනු ලැබූ යම් ලේඛනයක්, දෙයක් හෝ ද්‍රව්‍යයක් සන්තකයෙහි තබා ගැනීම හෝ මුදා හැරීම සම්බන්ධයෙන් උචිත ආඥාවක් කරනු ලැබිය යුතු ය.

සිරභාරයට ගනු ලබන අවස්ථාවේ දී ලබා දිය යුතු තොරතුරු

**21.** (1) සිරභාරයට ගැනීම සිදු කරනු ලබන අවස්ථාවේ දී, සිරභාරයට ගන්නා නිලධරයා විසින්, එසේ සිරභාරයට ගනු ලබන සැකකරු වෙත:-

(අ) සිරභාරයට ගන්නා නිලධරයාගේ අනන්‍යතාව;

(ආ) සිරභාරයට ගැනීමට හේතුව; සහ

(ඇ) යම් ලිඛිත නීතියක විධිවිධාන සලස්වා ඇති පරිදි නීතිඥවරයකු මුණගැසීම සඳහා සැකකරුට ඇති අයිතිවාසිකම,

සම්බන්ධයෙන් තොරතුරු ලබා දෙනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති තොරතුරු සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා අතුරින් සැකකරුට අවබෝධ වන කවර හෝ භාෂාවකින් ලබා දීම සඳහා සෑම සාධාරණ පියවරක්ම ගනු ලැබිය යුතු ය.

(3) සිරභාරයට ගන්නා වේලාවේ දී, (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි සැකකරුට එකී තොරතුරු ලබා දීම ප්‍රායෝගික නොවන අවස්ථාවක දී, එකී තොරතුරු එම සැකකරුට අවබෝධ වන යම් භාෂාවකින් ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින් ලබා දෙනු ලැබිය යුතු ය.

සිරභාරයට ගැනීම, සෝදිසි කිරීම සහ ප්‍රශ්න කිරීම පෞද්ගලිකත්වය කෙරෙහි නිසි සැලකිල්ලක් දක්වමින් කරනු ලැබිය යුතු බව

**22.** (1) සෑම සිරභාරයට ගැනීමක් ම සැකකරුගේ පෞද්ගලිකත්වය සම්බන්ධයෙන් නිසි සැලකිල්ල දක්වමින් සිදු කරනු ලැබිය යුතු ය.

(2) සැකකාර ස්ත්‍රියකගෙන් ප්‍රශ්න කිරීම සහ සැකකාර ස්ත්‍රියක් සිරභාරයට ගැනීම සිරභාරයට ගන්නා නිලධාරිනියක විසින් හෝ නිලධාරිනියක ඉදිරිපිට දී සිදු කරනු ලැබීමට වගබලා ගැනීම සඳහා හැකි සෑම පියවරක් ම ගනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ යම් තැනැත්තකු සෝදිසි කිරීමට සැලැස්වීම අවශ්‍යයවන කවර හෝ අවස්ථාවක දී, එම තැනැත්තාගේ පෞද්ගලිකත්වය සම්බන්ධයෙන් නිසි සැලකිල්ල දක්වමින් එම සෝදිසි කිරීම සිදු කරනු ලැබිය යුතු ය.

(4) යම් සැකකාර ස්ත්‍රියක් සෝදිසි කිරීමට සැලැස්වීම අවශ්‍ය වන්නා වූ කවර හෝ අවස්ථාවක දී, එම සෝදිසි කිරීම ස්ත්‍රියක විසින් සිදු කළ යුතු ය.

සිරභාරයට ගැනීම පොලිස් නිලධරයකු විසින් කරනු ලැබූ විට ක්‍රියාපටිපාටිය

**23.** (1) මේ පනත යටතේ සිරභාරයට ගැනීමක් කරනු ලැබූ පොලිස් නිලධරයකු විසින්, සිරභාරයට ගනු ලැබූ සැකකරු, ඒ පොලිස් නිලධරයා අනුයුක්තව සිටින පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත නොපමාව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ එසේ ඉදිරිපත් කිරීම ප්‍රායෝගික නොවන අවස්ථාවක දී, එම පොලිස් නිලධරයා විසින්, එසේ සිරභාරයට ගනු ලැබූ සැකකරු ආසන්නත ම පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත ප්‍රකාර සිරභාරයට ගැනීමක් සිදු කිරීමට හෝ සිරභාරයට ගනු ලැබූ සැකකරු පොලිස් ස්ථානයකට ගෙන යාමට යම් සන්නද්ධ හමුදා

සාමාජිකයකුගේ හෝ වෙරළ ආරක්ෂක නිලධරයකුගේ සහාය පොලිස් නිලධරයකු විසින් ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතු ය.

සිරභාරයට ගැනීම සන්නද්ධ හමුදා සාමාජිකයකු හෝ වෙරළ ආරක්ෂක නිලධාරියකු විසින් කරනු ලැබූ විට ක්‍රියාපටිපාටිය

**24.** (1) මේ පනත යටතේ සිරභාරයට ගැනීමක් කරනු ලැබූ සන්නද්ධ හමුදා සාමාජිකයකු හෝ වෙරළ ආරක්ෂක නිලධරයකු විසින්, එසේ සිරභාරයට ගනු ලැබූ සැකකරු, අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව සහ කවර අවස්ථාවක දී වුව ද, පැය විසිහතරක් නොඉක්මවන කාලසීමාවක් තුළ ආසන්නත ම පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත හෝ පොලිස්පතිවරයා විසින් තත්කාර්ය සඳහා, කලින් කල, නම් කරනු ලබන පොලිස් නිලධරයකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ශ්‍රී ලංකා ජනරජයේ දේශයෙන් බැහැර දී හෝ යම් ගුවන් යානයක දී හෝ යාත්‍රාවක දී ඒ සැකකරු සිරභාරයට ගනු ලැබ ඇති අවස්ථාවක දී, සිරභාරයට ගත් ස්ථානයේ සිට අදාළ පොලිස් ස්ථානයට ගමන් කිරීම සඳහා අවශ්‍ය කාලය ඒ පැය විසිහතරේ කාලසීමාව ගණනය කිරීමේ දී බැහැර කරනු ලැබිය යුතු ය:

එසේ ම තවදුරටත්, ආසන්නත ම පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත සිරභාරයට ගනු ලැබූ සැකකරු ඉදිරිපත් කිරීම, එකී සිරභාරයට ගැනීම සිදු කරන ලද තැනැත්තාගේ පාලනයෙන් බැහැර හේතු නිසා ප්‍රායෝගික නොවන අවස්ථාවකදී, එම සැකකරු ඊළඟට ආසන්නත ම පොලිස් ස්ථානය භාර නිලධරයාගේ භාරයට පත් කරනු ලැබිය යුතු ය.

(2) (අ) සිරභාරයට ගැනීම කරන ලද සන්නද්ධ හමුදා සාමාජිකයකු විසින්, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින්, එකී සිරභාරයට ගැනීම පිළිබඳව අදාළ අණදෙන නිලධරයාට හෝ තත්කාර්ය සඳහා එම අණදෙන නිලධරයා විසින් බලය දෙන ලද වෙනත් යම් අධිකාරීලත් නිලධරයකුට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(ආ) සිරභාරයට ගැනීම කරන ලද වෙරළ ආරක්ෂක නිලධරයකු විසින්, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින්, එකී සිරභාරයට ගැනීම පිළිබඳව වෙරළ ආරක්ෂක අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ තත්කාර්ය සඳහා වෙරළ ආරක්ෂක අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකුට දැනුම්දෙනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ, අවස්ථාවෝචිත පරිදි, අණදෙන නිලධරයා හෝ වෙරළ ආරක්ෂක අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ එම අණදෙන නිලධරයා හෝ වෙරළ ආරක්ෂක අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින්, නොපමාව ඒ සිරභාරයට ගැනීම පිළිබඳව, එම සැකකරු ඉදිරිපත් කරනු ලබන්නේ යම් පොලිස් ස්ථානයක් භාර නිලධරයකු වෙත ද එම පොලිස් ස්ථානය භාර නිලධරයාට හෝ තත්කාර්ය සඳහා පොලිස්පතිවරයා විසින් නම් කරන ලද පොලිස් නිලධරයකුට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි, පොලිස් ස්ථානය භාර නිලධරයාගේ අත්අඩංගුවට එසේ සිරභාරයට ගත් සැකකරු පත් කරනු ලබන වේලාවේ දී, ඒ සිරභාරයට ගැනීම සිදු කරන ලද සන්නද්ධ හමුදා සාමජිකයා හෝ වෙරළ ආක්ෂක නිලධරයා විසින්, ඒ පොලිස් ස්ථානය භාර නිලධරයාට එම සිරභාරයට ගැනීමට අදාළ අවස්ථානුගත කරුණු දක්වමින් ප්‍රකාශයක් කරනු ලැබිය යුතු ය.

(5) සිරභාරයට ගැනීම කරන ලද සන්නද්ධ හමුදා සාමාජිකයා හෝ වෙරළ ආරක්ෂක නිලධරයා විසින්, සැකකරුගේ සන්තකයේ තිබී සොයා ගනු ලැබූ හෝ සිරභාරයට ගන්නා ස්ථානයේ තිබී හෝ එම සිරභාරයට ගැනීම කරගෙන යාමේ දී සොයා ගනු ලැබූ සියලු අයිතම ඒ පොලිස් ස්ථානය භාර නිලධරයාට භාර දීම ද සිදු කරනු ලැබිය යුතු ය.

සිරභාරයට ගැනීම පිළිබඳ දැනුම් දීම

**25.** (1) මේ පනත යටතේ යම් සැකකරුවකු සිරභාරයට ගනු ලැබූ අවස්ථාවක දී, සිරභාරයට ගන්නා නිලධරයා විසින්, එසේ සිරභාරයට ගත් බව පිළිගනිමින් වහාම හෝ, කවර විටක දී වුව ද සිරභාරයට ගනු ලැබූ අවස්ථාවේ සිට පැය විසිහතරක් පසු නොවන කාලයක් තුළ දී, සැකකරුගේ ළඟම ඥාතියාට දෙවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව වූ දැනුම් දීමක් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, යම් සැකකරුවකු අත්අඩංගුවට ගෙන ඇත්තා වූ ද, මේ උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් දැනුම් දීමක් නිකුත් කිරීමට නොහැකි වූ ද අවස්ථාවක, සිරභාරයට ගන්නා නිලධරයා පොලිස් නිලධරයකු වන්නේ නම්, එකී දැනුම් දීම නිකුත් කිරීමට නොහැක්කේ මන්ද යන්න පිළිබඳ හේතු දක්වමින් තොරතුරු සටහන් පොතේ සටහනක් ඇතුළත් කිරීම එම

සිරභාරයට ගන්නා නිලධරයාගේ කාර්යය විය යුතු ය. තව ද සිරභාරයට ගන්නා නිලධරයා සන්නද්ධ හමුදා සාමාජිකයකු නම් හෝ වෙරළ ආරක්ෂක නිලධරයකු නම්, එකී දැනුම්දීම නිකුත් කිරීමට නොහැක්කේ මන්ද යන්න පිළිබඳ හේතු එකී සැකකරු ඉදිරිපත් කරනු ලැබුවේ යම් පොලිස් ස්ථානයක් භාර නිලධරයකු වෙත ද ඒ පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත වාර්තා කිරීම එකී සන්නද්ධ හමුදා සාමාජිකයාගේ හෝ වෙරළ ආරක්ෂක නිලධරයාගේ කාර්යය විය යුතු අතර, එකී පොලිස් ස්ථානය භාර නිලධරයා විසින්, ඒ සඳහා වූ හේතු ද සමඟ ඒ පිළිබඳව, තොරතුරු සටහන් පොතේ සටහනක් ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(2) එම සැකකරුගේ ළඟම ඥාතියා නොසිටී නම්, (1) වන උපවගන්තියේ සඳහන් දැනුම් දීම භාරදිය යුතු වන්නා වූ යම් තැනැත්තකුගේ අනන්‍යතාවය සහ එම තැනැත්තා සිටින ස්ථානය සම්බන්ධයෙන් සිරභාරයට ගන්නා නිලධරයා විසින් එම සැකකරුගෙන් විමසනු ලැබිය යුතු අතර සැකකරු විසින් එකී තොරතුරු ලබා දෙන්නේ නම්, එම දැනුම් දීම එකී තැනැත්තා වෙත භාරදීම සඳහා හැකි සෑම පියවරක්ම ගනු ලැබිය යුතු ය. එකී දැනුම් දීමෙහි පිටපතක් සැකකරුට භාර දෙනු ලැබිය යුතු ය.

(3) සැකකරු අත්අඩංගුවේ තබා ගනු ලබන්නා වූ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින් සහ කවර විටක දී වුව ද සැකකරු තමා වෙත ඉදිරිපත් කිරීමෙන් පැය විසිහතරක් පසු නොවන කාලයක් තුළ දී, එම සිරභාරයට ගැනීම සම්බන්ධයෙන් තුන්වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම් දෙනු ලැබිය යුතු අතර, හතරවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව, පොලිස්පතිවරයා වෙත හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ දැනුම්දීම කර ඇත්තේ යම් තැනැත්තකු වෙත ද, එම තැනැත්තා විසින්, එම සිරභාරයට ගනු ලැබූ සැකකරු අත්අඩංගුවෙන් මුදාහරිනු ලබන අවස්ථාවේ දී එම දැනුම්දීම උචිත බලධරයා වෙත භාරදෙනු හෝ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) මේ පනත යටතේ සිරභාරයට ගනු ලැබූ යම් සැකකරුවකු, එම සැකකරු මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් තොරව මුදාහරිනු

නොලැබිය යුතු අතර, එම මුදාහැරීම පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දන්වනු ලැබිය යුතු ය.

මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කිරීම

**26.** (1) (අ) මේ පනත ප්‍රකාර යම් පොලිස් නිලධරයකු විසින් සිරභාරයට ගෙන අත්අඩංගුවේ තබා ගෙන ඇත්තා වූ; හෝ

(ආ) 24 වන වගන්තිය ප්‍රකාර පොලිස් නිලධරයකු නොවන යම් නිලධරයකු විසින් සිරභාරයට ගෙන පොලිස් ස්ථානය භාර නිලධරයකු වෙත හෝ නම් කරන ලද පොලිස් නිලධරයකු වෙත ඉදිරිපත් කර ඇත්තා වූ,

යම් සැකකරුවකු, එකී සිරභාරයට ගැනීම සිදු කළ වේලාවේ සිට පැය හතළිස් අටක් පසු නොවන කාලයක් තුළ දී, ආසන්නත ම මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, සිරභාරයට ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ දේශය තුළ දී සිදු කරනු ලැබ ඇති අවස්ථාවක දී, සිරභාරයට ගන්නා ලද ස්ථානයේ සිට අදාළ මහෙස්ත්‍රාත්වරයා වෙත ගමන් කිරීම සඳහා අවශ්‍ය කාලසීමාව, එම පැය හතළිස් අට ගණනය කිරීමේ දී බැහැර කරනු ලැබිය යුතු ය:

එසේ ම තවදුරටත්, සිරභාරයට ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ දේශයෙන් පිටත දී හෝ යම් ගුවන්යානයක දී හෝ යාත්‍රාවක දී සිදු කරනු ලැබ ඇති අවස්ථාවක දී, සිරභාරයට ගන්නා ලද ස්ථානයේ සිට අදාළ මහෙස්ත්‍රාත්වරයා වෙත ගමන් කිරීම සඳහා අවශ්‍ය කාලසීමාව, එම පැය හතළිස් අට ගණනය කිරීමේ දී බැහැර කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ යම් සැකකරුවකු මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කිරීමෙන් පසු, වැඩිදුර විමර්ශන සිදු කිරීමේ කාර්යය සඳහා සැකකරු වැඩිදුරටත් දීර්ඝ කරන ලද කාලයක් අත්අඩංගුවේ තබා ගැනීමට අවශ්‍ය බවට විශ්වාස කිරීමට එම විමර්ශනය සිදු කරනු ලබන පොලිස් නිලධරයාට සාධාරණ හේතු ඇති අවස්ථාවක දී, මහෙස්ත්‍රාත්වරයා විසින්, ලිඛිතව හේතු වාර්තා කරමින්, පැය විසිහතරක් නොඉක්මවන වැඩිදුර කාලසීමාවකට එම සැකකරු අත්අඩංගුවේ තැබීම සඳහා බලය දෙනු ලැබිය හැකි ය.

(3) (1) වන හෝ (2) වන උපවගන්ති යටතේ සැකකරු මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු ලබන විට සහ:-

(අ) 29 වන වගන්තිය ප්‍රකාර රඳවා තැබීමේ නියමයක් නිකුත් කරනු ලැබ එය පරීක්ෂා කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ විට දී, මහෙස්ත්‍රාත්වරයා විසින්, 27 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, එම රඳවා තැබීමේ නියමය බලාත්මක කිරීම සඳහා ආඥාවක් කරනු ලැබිය යුතු අතර, එම රඳවා තැබීමේ නියමයේ පිටපතක්, රඳවා තැබීමේ ස්ථානය පිහිටා ඇති ස්ථානයට ආසන්නතම මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය; හෝ

(ආ) රඳවා තැබීමේ නියමයක් මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කර නොමැති විට දී, මහෙස්ත්‍රාත්වරයා විසින්, අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින්, සැකකරු රිමාන්ඩ් භාරයේ තැබීම සඳහා ආඥාවක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන්නේ නම්, අවස්ථානුගත කරුණු අනුව සාධාරණ බවට එකී මහෙස්ත්‍රාත්වරයා විසින් සලකනු ලබන හේතු මත පදනම්ව, සැකකරු රිමාන්ඩ් භාරයේ තබන ලෙස ආඥාවක් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, එවැනි සාධාරණ හේතු නොමැති බවට මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් වන අවස්ථාවක දී, 1997 අංක 30 දරන ඇප පනතේ විධිවිධාන යටතේ සැකකරු ඇප මත මදාහරිනු ලැබිය හැකි ය:

එසේම තවදුරටත්, සැකකරුවකු තමා විසින් ම දෙනු ලබන බැඳුම් ඔප්පුවක් මත හෝ අවශ්‍ය වූ විට අධිකරණයේ පෙනී සිටීම සඳහා එම සැකකරු

විසින් දෙන ලද පොරොන්දුවක් මත, ඇප මත මුදාහරිනු නොලැබිය යුතු ය.

(4) සැකකරු ඉදිරිපත් කරනු ලබන්නේ යම් මහෙස්ත්‍රාත්වරයකු වෙත ද, එම මහෙස්ත්‍රාත්වරයා විසින්, පෞද්ගලිකව, සැකකරු රහසිගතව හමු වී, ඔහුගේ යහපැවැත්ම පිළිබඳව සොයා බලා සැකකරු විසින් ලබා දෙනු ලබන යම් ප්‍රකාශයක් වාර්තා කරනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ සඳහන් රහසිගත නඩු කටයුත්තේ දී, සිරභාරයට ගැනීමට සහභාගී වූ හෝ සැකකරු විසින් සිදු කර ඇතැයි කියනු ලබන වරද සම්බන්ධයෙන් විමර්ශනය කරන ලද යම් පොලිස් නිලධරයකු බැහැර කරනු ලැබිය යුතු ය.

මහෙස්ත්‍රාත්වරයා විසින් සැකකරු වෝහාරික වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් කරන ලෙස විධාන කළ යුතු බව

**27.** (1) සැකකරු වධහිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකීමකට හෝ දඬුවමකට භාජනය වී ඇති බවට විශ්වාස කිරීමට මහෙස්ත්‍රාත්වරයාට සාධාරණ හේතු ඇති ඕනෑම අවස්ථාවක, මහෙස්ත්‍රාත්වරයා විසින්-

(අ) සැකකරු අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කරන ලෙසට විධාන කිරීම;

(ආ) සැකකරු පරීක්ෂා කිරීම සඳහා අධිකරණ වෛද්‍ය නිලධරයකු වෙත ඉදිරිපත් කර ඒ පිළිබඳ මහෙස්ත්‍රාත්වරයාට වාර්තා කරන ලෙස විධාන කිරීම; සහ

(ඇ) සැකකරු රඳවා තබා ඇති ස්ථානය වෙනස් කරන ලෙස ආඥාවක් කිරීම,

කරනු ලැබිය යුතු ය.

(2) සැකකරු වධහිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකීමකට හෝ දඬුවමකට භාජනය වී ඇති බවට විශ්වාස කිරීමට

මහෙස්ත්‍රාත්වරයාට සාධාරණ සැකයක් ඇති ඕනෑම අවස්ථාවක, මහෙස්ත්‍රාත්වරයා විසින් -

(අ) සැකකරු වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කරන ලෙස විධාන කිරීම; සහ

(ආ) සැකකරු පරීක්ෂා කිරීම සඳහා අධිකරණ වෛද්‍ය නිලධරයකු වෙත ඉදිරිපත් කර ඒ පිළිබඳ මහෙස්ත්‍රාත්වරයාට වාර්තා කරන ලෙස විධාන කිරීම,

කරනු ලැබිය යුතු ය.

(3) සැකකරු වධහිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට හෝ දඬුවමකට භාජනය වී තිබීමට ඉඩ ඇති බව හෙළිදරව් වන අධිකරණ වෛද්‍ය නිලධරයාගේ වාර්තාවක් ලැබුණු විට දී, මහෙස්ත්‍රාත්වරයා විසින්, පොලිස් ස්ථානය භාර නිලධරයාගේ කරුණු දැක්වීම් සැලකිල්ලට ගැනීමෙන් පසු, සැකකරු රඳවා තබා ඇති ස්ථානය වෙනස් කරන ලෙස ආඥාවක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය හෝ (3) වන උපවගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් කරනු ලබන අවස්ථාවක දී, කලින් සැකකරු වෙත ප්‍රවේශවීමට හැකියාව තිබූ යම් පොලිස් නිලධරයකුට එසේ සැකකරු වෙත ප්‍රවේශවීමට නොහැකි විය යුතු ය.

(5) එකී සැකකරු සම්බන්ධයෙන් වන විමර්ශනය පොලිස්පතිවරයා විසින් විධාන කරනු ලබන පරිදි වෙනත් යම් පොලිස් නිලධරයන් විසින් අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(6) වධහිංසා සිදු කරන ලද බවට චෝදනා ලද තැනැත්තාට විරුද්ධව අපරාධ නඩු කටයුතු පැවරීමට නීතිපතිවරයාට හැකි කරවීම සඳහා, කරන ලදැයි කියනු ලබන වධහිංසා සිදු කිරීම සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කරන ලෙස ද මහෙස්ත්‍රාත්වරයා විසින් පොලිස්පතිවරයාට විධාන කරනු ලැබිය යුතු ය.

රිමාන්ඩ් භාරයේ තැබිය හැකි සහ රඳවා තැබිය හැකි උපරිම කාලසීමාව

**28.** (1) යම් සැකකරුවකු, ඔහු පළමු වරට රිමාන්ඩ් භාරයට පත් කරන ලද දිනයේ සිට වසරක් ඉක්මවන කාලසීමාවක් සඳහා, මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් රිමාන්ඩ් භාරයේ නොතැබිය යුතු ය.

(2) මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් රිමාන්ඩ් භාරයේ තැබිය හැකි සහ රඳවා තැබිය හැකි මුළු කාලසීමාව, සිරභාරයට ගනු ලැබූ දින සිට වසර දෙකක කාලසීමාවක් නොඉක්මවිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් කාලසීමාව ඇතුළත යම් අධිචෝදනා පත්‍රයක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක දී, මහෙස්ත්‍රාත් අධිකරණ විසින්, සැකකරු 1997 අංක 30 දරන ඇප පනතේ විධිවිධාන යටතේ ඇප මත මුදා හරිනු ලැබිය යුතු ය:

එසේ වුව ද, සැකකරුවකු, තමා විසින් ම දෙනු ලබන බැඳුම් ඔප්පුවක් මත හෝ අවශ්‍ය වූ විට අධිකරණයේ පෙනී සිටීම සඳහා එම සැකකරු විසින් දෙන ලද පොරොන්දුවක් මත, ඇප මත මුදාහරිනු නොලැබිය යුතු ය.

රඳවා තැබීමේ නියමය

**29.** (1) පොලිස්පතිවරයා හෝ තත්කාර්යය සඳහා පොලිස්පතිවරයා විසින් බලය දෙන ලද නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන යම් නිලධරයකු විසින්, (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් කාර්යයක් සඳහා සහ (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති හේතු මත, මේ පනත යටතේ වරදක් සිදු කිරීමට සම්බන්ධ වී ඇති හෝ එවැනි වරදක් සිදු කිරීමට අදාළ සැකකරුවකු රඳවා තැබීම සඳහා, අවස්ථාවෝචිත පරිදි, රඳවා තැබීමේ නියමයක් නිකුත් කිරීම සඳහා හෝ රඳවා තැබීමේ නියමයක් දීර්ඝ කිරීම සඳහා ලේකම්වරයා වෙත ලිඛිතව ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, රඳවා තැබීමේ නියමයක්, එක් වරකට මාස දෙකකට වැඩි කාලසීමාවකට දීර්ඝ කරනු නොලැබිය යුතු අතර ඒසේ දීර්ඝ කිරීම, ඒ වගන්තිය යටතේ මුල් වරට රඳවා තැබීමේ නියමය කරන ලද දින සිට එක් වසරක් නොඉක්මන මුළු කාලසීමාවක් දක්වා පමණක් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබීමෙන් පසු, (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති හේතුවලින් කිසිවක් මත සැකකරු රඳවා

තැබිය යුතු බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති බවට ලේකම්වරයා සෑහීමට පත්වන අවස්ථාවක දී, ඔහු විසින්, එකී හේතු වාර්තාගත කිරීමෙන් පසු, සැකකරු රඳවා තැබීම සඳහා බලය දෙමින් පස්වන උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයේ සාරානුකූලව රඳවා තැබීමේ නියමයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වන රඳවා තැබීමේ නියමයක, එය නිකුත් කිරීම සඳහා වූ හේතු ඇතුළත් විය යුතු අතර -

(අ) සැකකරු සම්බන්ධයෙන් විමර්ශන සිදු කිරීමට පහසුකම් සැලසීම සඳහා;

(ආ) මේ පනත යටතේ වන වරදක් සිදු කිරීමට අදාළ විමර්ශනයක් සඳහා තොරතුරු සහ ලබා ගත හැකි සාක්ෂි ලබා ගැනීම සඳහා;

(ඇ) රඳවා තබා සිටින සැකකරුගෙන් ප්‍රශ්න කිරීම සඳහා; හෝ

(ඇ) මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් වන සාක්ෂි සුරක්ෂිත කිරීම සඳහා,

අවශ්‍ය වන විට දී නිකුත් කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ වන රඳවා තැබීමේ නියමයක්, පළමුවෙන් මාස දෙකක් නොඉක්මවන කාලසීමාවක් සඳහා නිකුත් කරනු ලැබිය හැකි ය.

(5) 26 වන වගන්තිය යටතේ අදාළ සැකකරු මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාව වන විට, මේ වගන්තිය යටතේ වන රඳවා තැබීමේ නියමයක් නිකුත් කර ඇති විට දී, රඳවා තැබීමේ නියමයේ සහතික කළ පිටපතක් පරීක්ෂා කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ වන සෑම රඳවා තැබීමේ නියමයක ම පිටපතක්, රඳවා තබා ඇති සැකකරුට, එම රඳවා තැබීමේ නියමය නිකුත්

කිරීමෙන් පැය හතළිස් අටක කාලසීමාවක් ඇතුළත භාර දිය යුතු අතර, සැකකරු විසින් එය භාරගත් බවට වන පිළිගැනීමක් ලබාගෙන එය අදාළ මහෙස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කරනු ලැබිය යුතු ය.

(7) රඳවා තැබීමේ නියමයෙහි පිටපතක් සැකකරුගේ ළඟම ඥාතියාට එම රඳවා තැබීමේ නියමය නිකුත් කිරීමෙන් පැය හතළිස් අටක කාලසීමාවක් ඇතුළත භාර දිය යුතු අතර, එකී පිටපත භාරදෙනු ලබන ආකාරය සම්බන්ධයෙන් 25 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

රඳවා තැබීමේ නියමයකට යටත් සැකකරුවකු අනුමත රඳවා තැබීමේ කොන්දේසි යටතේ අනුමත රඳවා තැබීමේ ස්ථානයක තැබිය යුතු බව

**30.** (1) 29 වන වගන්තිය යටතේ රඳවා තැබීමේ නියමයක් නිකුත් කර ඇත්තේ යම් සැකකරුවකුට අදාළව ද, එම සැකකරු අනුමත රඳවා තැබීමේ කොන්දේසි යටතේ අනුමත රඳවා තැබීමේ ස්ථානයක රඳවා තැබිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා:-

(අ) ජනාධිපතිවරයා විසින්, පොලිස්පතිවරයාගේ නිර්දේශය මත, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, “අනුමත රඳවා තැබීමේ ස්ථාන” ලෙස යම් ස්ථාන සංඛ්‍යාවක් නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය; සහ

(ආ) පොලිස්පති සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විමසා, ජනාධිපතිවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, “අනුමත රඳවා තැබීමේ කොන්දේසි” ලෙස යම් රඳවා තැබීමේ කොන්දේසි නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

අනුමත රඳවා තැබීමේ ස්ථානයට මහෙස්ත්‍රාත්වරයා පැමිණිය යුතු බව

**31.** (1) අනුමත රඳවා තැබීමේ ස්ථානයක් පිහිටා ඇත්තේ යම් මහෙස්ත්‍රාත්වරයකුගේ අධිකරණ බල ප්‍රදේශයක් ඇතුළත ද, එම මහෙස්ත්‍රාත්වරයා විසින්, එකී රඳවා තැබීමේ ස්ථානය භාර බලධරයාට පූර්ව දැනුම් දීමක් ලබා දීමෙන් තොරව -

(අ) එකී අනුමත රඳවා ගැනීමේ ස්ථානයට මසකට වරක් පැමිණීම;

(ආ) සැකකරුවන් සම්මුඛ සාකච්ඡාවකට භාජනය කර ඔවුන්ගේ යහපැවැත්ම පිළිබඳ සොයා බැලීම; සහ

(ඇ) රඳවා තැබීමේ නාමලේඛන, රඳවා තැබීමේ නියම සහ එකී අනුමත රඳවා තැබීමේ ස්ථානයේ පවත්වාගෙන යා යුතු වෙනත් පොත්පත් සහ ලේඛන ඉල්ලා පරීක්ෂා කිරීම,

කරනු ලැබිය යුතු ය.

(2) සැකකරුවකු මුල් වරට ඉදිරිපත් කරන ලද්දේ යම් මහෙස්ත්‍රාත්වරයකු වෙත ද, එම මහෙස්ත්‍රාත්වරයාට ද අනුමත රඳවා තැබීමේ ස්ථානයකට පැමිණ (1) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති බලතල ක්‍රියාත්මක කිරීමට හිමිකම තිබිය යුතු ය.

(3) යම් අනුමත රඳවා තැබීමේ ස්ථානයක් භාර බලධරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ සඳහන් මහෙස්ත්‍රාත්වරයාට ඉක්මනින් සහ බාධාවකින් තොරව ප්‍රවේශ වීමට ඉඩ ලබා දිය යුතු ය.

(4) සැකකරු වධහිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකීමකට හෝ දඬුවමකට භාජනය වී ඇති බව මහෙස්ත්‍රාත්වරයා විසින් නිරීක්ෂණය කරනු ලබන්නේ නම් හෝ තමා වධහිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකීමකට හෝ දඬුවමකට භාජනය වූ බවට සැකකරු චෝදනා කරනු ලබන්නේ නම්, සැකකරු අධිකරණ වෛද්‍ය නිලධරයකු විසින් පරීක්ෂා කරනු ලැබීම සඳහා ඉදිරිපත් කර ඒ පිළිබඳව වාර්තාවක් තමා වෙත ඉදිරිපත් කරන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් වහාම ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(5) සැකකරුට සහ අදාළ පොලිස් නිලධරයාට කරුණු දැක්වීම සඳහා අවස්ථාවක් ලබා දීමෙන් පසු, සැකකරු වධහිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකීමකට හෝ දඬුමකට භාජනය වී ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති බවට මහේසත්‍රාත්වරයා සෑහීමට පත්වන්නේ නම්, ඔහු විසින්, 27 වන වගන්තිය ප්‍රකාර කටයුතු කරනු ලැබිය යුතු ය.

සැකකරුට මානුෂීය ලෙස සැලකිය යුතු බව

**32.** (1) රැඳවියන්ට මානුෂීය ලෙස සැලකීම සඳහා අවශ්‍ය වන අවශ්‍යතා අනුමත රඳවා තැබීමේ ස්ථානයට ලබා දිය යුතු අතර, එකී අනුමත රඳවා තැබීමේ ස්ථානය භාර නිලධරයාගේ පූර්ව අවසරය ඇතිව රැඳවියාගේ ළඟම ඥාතියාට සහ ඔහුගේ නීතිඥවරයාට එම අනුමත රඳවා තැබීමේ ස්ථානයට ප්‍රවේශ වීමට හැකි විය යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන යටතේ අනුමත රඳවා තැබීමේ ස්ථානය පරීක්ෂා කිරීමක දී, එම අනුමත රඳවා තැබීමේ ස්ථානය (1) වන උපවගන්තියේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූල නොවන බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට හෝ මහෙස්ත්‍රාත්වරයාට පෙනී යන්නේ නම්, එම කරුණ, රඳවා තැබීමක් සම්බන්ධයෙන් වන විට පොලිස්පතිවරයාට දැනුම් දෙනු ලැබිය යුත ය.

රඳවා තැබීම පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම් දීම

**33.** (1) සැකකරුවකු රඳවා තබනු ලබන්නේ යම් අනුමත රඳවා තැබීමේ ස්ථානයක ද, එම අනුමත රඳවා තැබීමේ ස්ථානය භාර නිලධරයා විසින්, ප්‍රායෝගික හැකි තාක් ඉක්මණින්, එහෙත් කවර අවස්ථාවක දී වුව ද, රඳවා තැබීම ආරම්භ වීමේ සිට පැය හැත්තෑ දෙකක් පසු නොවන කාලයක් තුළ දී, 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත ප්‍රකාරව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් බලය පවරා ඇති තැනැත්තන්ට එකී අනුමත රඳවා තැබීමේ ස්ථානයට පැමිණීම සඳහා එම රඳවා තැබීම පිළිබඳ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) රඳවා තැබීමේ නියමයේ පිටපතක් ප්‍රායෝගිකව හැකි තාක් ඉක්මණින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත භාරදෙනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් අනුමත රඳවා තැබීමේ ස්ථානයට පැමිණීම

**34.** පූර්ව දැනුම් දීමක් ලබා දීමෙන් තොරව -

(අ) යම් අනුමත රඳවා තැබීමේ ස්ථානයකට ඇතුළු වී පරීක්ෂා කිරීමට;

(ආ) රඳවා තැබීමේ නාමලේඛන, රඳවා තැබීමේ නියමය සහ එකී රඳවා තබා ගැනීමේ ස්ථානයේ පවත්වාගෙන යනු

ලැබිය යුතු වෙනත් පොත්පත් හා ලේඛන ඉල්ලා සිටීමට සහ පරීක්ෂා කිරීමට; සහ

(ඇ) එකී අනුමත රඳවා තැබීමේ ස්ථානයේ රඳවා තබා ඇති සැකකරුවන් සම්මුඛ සාකච්ඡාවට භාජනය කිරීමට,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ යම් බලයලත් නිලධරයකුට හිමිකම තිබිය යුතු ය.

මාස දෙකක් ඉක්මවා රඳවා තැබීම මහෙස්ත්‍රාත්වරයාගේ අනුමතය ඇතිව පමණක් සිදු කළ යුතු බව

**35.** (1) 29 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ලබාගත් රඳවා තැබීමේ නියමයක කාලසීමාව අවසන් වීමෙන් පසු සැකකරු මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) 29 වන වගන්තියේ (4) වන උපවගන්තියේ සඳහන් මාස දෙකක කාලසීමාව ඉක්මවා සැකකරු රඳවා තැබීමට අවශ්‍ය වන අවස්ථාවක දී, අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින්, 29 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද රඳවා තැබීමේ නියමයේ සහතික කළ පිටපතක් ද සමග:-

(අ) සැකකරුට විරුද්ධව ඇති චෝදනාව;

(ආ) විමර්ශනයේ දී අනාවරණය වූ කරුණු; සහ

(ඇ) වැඩිදුර රඳවා තැබීමට අවශ්‍ය වන හේතු,

සඳහන් කරමින් මහෙස්ත්‍රාත් අධිකරණයේ රහස්‍ය වාර්තාවක් ගොනුකර, එම සැකකරු සම්බන්ධයෙන් වන දීර්ඝ කරන ලද රඳවා තැබීමේ නියමය බලාත්මක කිරීම සඳහා ආඥාවක් කිරීම සඳහා ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(3) යුක්තියේ යහපත පිණිස එකී වාර්තාව සැකකරුට හෙළිදරව් කරනු ලැබිය හැකි බව මහෙස්ත්‍රාත්වරයාගේ මතය වන්නේ නම් මිස, එකී රහස්‍ය වාර්තාව කිසිදු තැනැත්තකුට හෙළිදරව් කරනු නොලැබිය යුතු ය:

එසේ වුව ද, මහෙස්ත්‍රාත්වාරයා විසින්, එකී වාර්තාවේ තොරතුරු හෙළිදරව් වීම විමර්ශනයට බලනොපාන බවට වගබලා ගනු ලැබිය යුතු ය.

(4) මහෙස්ත්‍රාත්වරයා විසින්, රඳවා තැබීමේ කලාසීමාවේ දීර්ඝ කිරීමක් ඉල්ලා සිටින පොලිස් නිලධරයාගේ යම් වැඩිදුර කරුණු දැක්වීම් ද එකී රඳවා තැබීමේ නියමය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් සැකකරු හෝ ඔහුගේ නීතිඥවරයා විසින් ඉදිරිපත් කරන ලද විරෝධතා ද වාර්තාගත කරනු ලැබිය යුතු ය.

(5) (2) වන උපවගන්තියේ සඳහන් රහස්‍ය වාර්තාව සහ ඉල්ලීම සහ (4) වන උපවගන්තිය යටතේ කරන ලද කරුණු දැක්වීම් සලකා බැලීමෙන් පසු, මහෙස්ත්‍රාත්වරයා විසින්, දීර්ඝ කරන ලද රඳවා තැබීමේ නියමයේ නිශ්චිතව දක්වා ඇති වැඩිදුර කාලසීමාව සඳහා එකී දීර්ඝ කරන ලද රඳවා තැබීමේ නියමය බලාත්මක කිරීම සඳහා ආඥාවක් කරනු ලැබිය ය හැකි ය.

(6) මහෙස්ත්‍රාත්වරයා විසින්, සැකකරු රඳවා තැබීමේ නියමයේ යම් දීර්ඝ කිරීමක් පිළිබඳව වහාම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(7) (අ) මහෙස්ත්‍රාත්වරයා විසින්, හේතු දක්වමින්, දීර්ඝ කරන ලද රඳවා තැබීමේ නියමය බලාත්මක කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(ආ) දීර්ඝ කරන ලද රඳවා තැබීමේ නියමය බලාත්මක කිරීම මහෙස්ත්‍රාත්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක දී, එකී මහෙස්ත්‍රාත්වරයා විසින්, පරීක්ෂණයකින් පසු, සැකකරු රිමාන්ඩ් භාරයේ තැබීම හෝ 1997 අංක 30 දරන ඇප පනතේ විධිවිධාන යටතේ ඇප මත මුදා හැරීම කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, සැකකරුවකු, තමා විසින් ම දෙනු ලබන බැඳුම් ඔප්පුවක් මත හෝ අවශ්‍ය වූ විට අධිකරණයේ පෙනී සිටීම සඳහා එම සැකකරු විසින් දෙන ලද පොරොන්දුවක් මත, ඇප මත මුදා හරිනු නොලැබිය යුතු ය.

(8) මේ වගන්තිය යටතේ වන නඩු කටයුතු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 106 වන ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනවලට යටත්ව, රහසිගතව පවත්වනු ලැබිය හැකි ය.

විමර්ශන සම්පූර්ණ කර සැකකරුවන් මුදා හැරීම

**36.** (1) මේ පනත යටතේ වන සෑම විමර්ශනයක් ම අනිසි ප්‍රමාදයකින් තොරව සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ වන විමර්ශනයක් සම්පූර්ණ කිරීමෙන් පසු, එකී විමර්ශනය භාර නිලධරයා විසින්, නියම කරනු ලැබිය හැකි ආකෘති පත්‍රයකට අනුව එකී විමර්ශනයට අදාළ වාර්තාවක් මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) සැකකරු විසින්, මේ පනත යටතේ වන වරදක් සිදු කර ඇති බවට හෝ සිදු කිරීමට සම්බන්ධවී ඇති බවට වූ කිසිදු චෝදනාවක් වාර්තාවෙහි අන්තර්ගත නොවන්නේ නම්, මහෙස්ත්‍රාත්වරයා විසින්, එම සැකකරු නිදහස් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මහෙස්ත්‍රාත්වරයා විසින්, මේ පනත යටතේ අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද සැකකරුවකු, නීතිපතිවරයාගේ කැමැත්ත ඇතිව, ඊට පෙර ඕනෑම විටක දී නිදහස් කරනු ලැබිය හැකි ය.

(4) විමර්ශන සම්පූර්ණ කරණු ලැබ ඇත්තේ යම් සැකකරුවකු සම්බන්ධයෙන් ද, එවැනි යම් යම් සැකකරුවකු සම්බන්ධයෙන් මේ පනත යටතේ රඳවා තැබීමේ නියමයක් නිකුත් කිරීම හෝ දීර්ඝ කිරීම කරනු නොලැබිය යුතු ය.

(5) මේ පනත යටතේ නිදහස් කරනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් විමර්ශනයක් නැවත ආරම්භ කරනු ලැබිය යුතු ඕනෑම විටක දී, එකී විමර්ශනය නැවත ආරම්භ කිරීම සහ වැඩිදුර විමර්ශන සම්පූර්ණ කිරීම පිළිබඳව මහෙස්ත්‍රාත්වරයාට සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට දැනුම් දෙනු ලැබිය යුතු ය.

සැකකරු මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කළ යුතු බව

**37.** රඳවාතැබීමේ නියමයක් ක්‍රියාත්මක වන අතරතුර, සෑම දින දාහතරකට වරක් ම සැකකරු මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

පොලිස් නිලධරයාට රිමාන්ඩ් භාරයේ හෝ බන්ධනාගාරයේ සිටින සැකකරු වෙත ප්‍රවේශ විය හැකි බව

**38.** (1) මේ පනත යටතේ යම් විමර්ශනයක් සිදු කරන පොලිස් නිලධරයකුට, මහෙස්ත්‍රාත්වරයා විසින් නිකුත් කරනු ලබන ආඥාවක අධිකාරය යටතේ -

(අ) රිමාන්ඩ් භාරයේ තබනු ලැබූ සැකකරුවකු සමඟ සම්මුඛ සාකච්ඡා කිරීම සඳහා එම සැකකරුවකු වෙත ප්‍රවේශ වීමට;

(ආ) ප්‍රකාශ සටහන් කර ගැනීමට;

(ඇ) වැඩිදුර විමර්ශන පැවැත්වීමේ කාර්යය සඳහා සැකකරු රිමාන්ඩ් භාරයෙන් ඉවතට ගැනීමට,

හිමිකම තිබිය යුතු ය:

එසේ වුව ද, මේ උපවගන්තියේ දක්වා ඇති සෑම අවස්ථාවක ම, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයකු ඊට සහභාගී විය යුතු ය.

(2) සැකකරුවකු, යම් වරදක් සඳහා වරදකරු කර ඇති සහ යම් කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනය විඳිමින් සිටින අවස්ථාවක දී, මේ පනත යටතේ විමර්ශනයක් පවත්වනු ලබන පොලිස් නිලධරයකුට, මහෙස්ත්‍රාත්වරයා විසින් නිකුත් කරනු ලබන ආඥාවක අධිකාරය යටතේ -

(අ) බන්ධනාගාරයේ සිටින එකී සැකකරු සමඟ සම්මුඛ සාකච්ඡා කිරීම සඳහා එම සැකකරු වෙත ප්‍රවේශ වීමට;

(ආ) ප්‍රකාශ සටහන් කර ගැනීමට; සහ

(ඇ) වැඩිදුර විමර්ශන පැවැත්වීමේ කාර්යය සඳහා සැකකරු බන්ධනාගාරයෙන් ඉවතට ගැනීමට,

හිමිකම තිබිය යුතු ය:

එසේ වුව ද, මේ උපවගන්තියේ දක්වා ඇති සෑම අවස්ථාවකම, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයකු ඊට සහභාගී විය යුතු ය.

රිමාන්ඩ් භාරයේ හෝ බන්ධනාගාරය භාරයේ තැබීම අතරතුර රඳවා තැබීම

**39.** (1) මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වන වරදකට රිමාන්ඩ් භාරයේ හෝ බන්ධනාගාරය භාරයේ තබනු ලැබූ යම් තැනැත්තකු:-

(අ) මේ පනත යටතේ යම් වරදක් සිදු කර ඇති බවට;

(ආ) මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීමට තැත් කර ඇති බවට අනුබල දී ඇති බවට හෝ කුමන්ත්‍රණය කර ඇති බවට හෝ මේ පනත යටතේ වන යම් වරදක් සිදු කිරීමට සූදානමින් යම් ක්‍රියාවක් සිදු කර ඇති බවට; හෝ

(ඇ) සිරභාරයට ගැනීමට පෙරාතුව, මේ පනත යටතේ යම් වරදක් සිදු කර ඇති බවට සහ එකී පොලිස් ස්ථානය භාර නිලධරයා එම කරුණ දැන නොසිටි බවට,

පොලිස් ස්ථානයක් භාර නිලධරා වෙත විශ්වසනීය තොරතුරු ලැබුණු අවස්ථාවක දී, එම පොලිස් ස්ථානය භාර නිලධරයා විසින්, එම තොරතුරු නීතිපතිවරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

(2) මහාධිකරණයේ විනිශ්වයකාරවරයකු විසින්, නීතිපතිවරයා විසින් කරනු ලබන ඉල්ලීමක් මත, එම තොරතුරු පිළිබඳ වහාම පරීක්ෂා කරනු ලැබිය යුතු අතර, පරීක්ෂණය අවසානයේ දී, සැකකරුට විරුද්ධව ඇති චෝදනාව ප්‍රබල සාක්ෂි මත සිදු කර ඇති බව පෙනී යන බවට මහාධිකරණයේ විනිශ්වයාරවරයා සෑහීමට පත් වන්නේ නම් සහ සැකකරු වැඩි දුර විමර්ශන සඳහා රැඳවුම් භාරයේ තැබීම යෝග්‍ය බවට මහාධිකරණයේ විනිශ්වයකාරවරයා විසින් සලකනු ලබන්නේ නම්, මහාධිකරණයේ

විනිශ්චයකාරවරයා විසින්, රඳවා තැබීමේ නියමයක් ඉදිරිපත් කරනු ලැබූ විට, රඳවා තැබීමේ නියමය බලාත්මක කිරීම සඳහා ආඥාවක් කර:-

(අ) සැකකරුගේ භාරය යම් අනුමත රඳවා තැබීමේ ස්ථානයකට මාරු කිරීම;

(ආ) සැකකරු රිමාන්ඩ් භාරයෙන් ඉවත් කිරීමට;

(ඇ) එකී රඳවා තැබීමේ නියමය ප්‍රකාරව එම සැකකරු රඳවා තබා ගැනීමට; සහ

(ඈ) සැකකරු හුදෙකලා කොට තබන ලෙසට හෝ ආරක්ෂාව යටතේ තබන ලෙස නියෝග කිරීමට,

අවසර දෙනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන රඳවා තැබීමේ නියමය -

(අ) ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබිය යුතු ය;

(ආ) වරකට සති දෙකක කාලසීමාවක් බැගින් මාස තුනක් නොඉක්මවන සමුච්චිත කාලසීමාවක් සඳහා විය යුතු ය; සහ

(ඇ) සෑම දින දහහතරකට වරක් ම මහාධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් සමාලෝචනයට ලක් කරනු ලැබිය යුතු අතර ඒම සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් 25 වන සහ 34 වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(4) සැකකරු රිමාන්ඩ් භාරයේ සිට හෝ බන්ධනාගාරය භාරයේ සිට රඳවුම් භාරයට මාරු කිරීම පිළිබඳව, මහාධිකරණය විසින්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(5) (අ) බන්ධනාගාරය භාරයේ සිටි තැනැත්තකු විසින් මේ පනත යටතේ රැඳවුම් භාරයේ ගත කළ කාලසීමාව, එම තැනැත්තාගේ දණ්ඩන නියමයේ කාලසීමාවේ කොටසක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(ආ) රිමාන්ඩ් භාරයේ සිටි තැනැත්තකු විසින් මේ පනත යටතේ රැඳවුම් භාරයේ ගත කළ කාලසීමාව, අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 238අ වන වගන්තියේ කාර්ය සඳහා ඔහුගේ රිමාන්ඩ් භාරයේ සිටින කාලසීමාවේ කොටසක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) මාස තුනක කාලසීමාව අවසන් වූ පසු හෝ ඊට පෙර ඕනෑම විටක දී විමර්ශන අවසන් වී ඇති බවට නීතිපතිවරයා විසින් මහාධිකරණයට දැනුම් දෙනු ලබන්නේ නම්, මහාධිකරණයේ විනිශ්චයකාරවරයා විසින්, සැකකරු නැවතත්, අවස්ථාවෝචිත පරිදි, රිමාන්ඩ් භාරයට හෝ බන්ධනාගාරයේ භාරයට පත් කිරීම සඳහා ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(7) බන්ධනාගාරය භාරයේ සිටින තැනැත්තකු මේ පනත යටතේ වන යම් විමර්ශනයක සැකකරුවකු වන අවස්ථාවක දී, බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින්, දණ්ඩන නියමයේ කාලසීමාව අවසන් වූ විට, එම සැකකරු රිමාන්ඩ් භාරයේ තැබීමේ හෝ මේ පනතේ විධිවිධාන ප්‍රකාර වෙනත් යම් සුදුසු ආඥාවක් කිරීමේ කාර්යය සඳහා, ඔහු සැකකරුවකු බවට පත් කර ඇත්තේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක් මගින් ද, එම අදාළ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත එම සැකකරු ඉදිරිපත් කරනු ලැබි ය යුතු ය.

රිමාන්ඩ් භාරයේ සිටින හෝ රඳවා තබා ඇති සැකකරුට නීතිඥවරයකු වෙත ප්‍රවේශ විය හැකි බව

**40.** මේ පනත යටතේ රිමාන්ඩ් භාරයේ තබා ඇති හෝ රඳවා තබා ඇති සැකකරුවකුට, ලිඛිත නීතියෙන් පනවා ඇති කොන්දේසිවලට යටත්ව, ස්වකීය ඥාතීන්, නීතිඥවරයා හෝ ඔහුගේ කැමැත්ත අනුව වෙනත් යම් තැනැත්තකු සමග සන්නිවේදනය කිරීමේ සහ ඔවුන්ට සැකකරු වෙත පැමිණීමේ අයිතිවාසිකම තිබිය යුතු ය.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනත අදාළ කර ගැනීම

**41.** (1) මේ පනතේ විධිවිධාන සමග අනනුකූල නොවන්නා වූ, අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ පනත යටතේ වන යම් විමර්ශනයක් හෝ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් අදාළ කර ගනු ලැබිය යුතු ය.

(2) අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 115 වන සහ 116 වන වගන්තිවල විධිවිධාන මේ පනත යටතේ වන සැකකරුවකුට අදාළ නොවිය යුතු ය.

(3) අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, ඒ පනතේ 306 වන වගන්තියේ විධිවිධාන, මේ පනත යටතේ වන යම් වරදක් සඳහා අධිකරණය විසින් හෝ අධිකරණය ඉදිරියෙහි තමා වරදකරු බවට උත්තරවාද දෙන හෝ වරදකරු බවට තීරණය කරනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

## IV වන කොටස

### මේ පනත යටතේ ඇතැම් නිලධරයන්ගේ බලතල සහ කාර්ය

මේ පනත යටතේ වන වැරදි සිදු කිරීම වැළැක්වීම ඇතැම් නිලධරයන්ගේ කාර්යය වන බව

**42.** (1) මේ පනත යටතේ වන යම් වරදක් සිදු කිරීම වැළැක්වීම සඳහා උචිත විය හැකි යම් පියවරක් ගැනීම, සෑම පොලිස් නිලධරයකුගේ ම, සෑම සන්නද්ධ හමුදා සාමාජිකයකුගේ ම සහ වෙරළ ආරක්ෂක නිලධරයකුගේ ම කාර්යය විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා එවැනි යම් නිලධරයකු විසින් -

(අ) සද්භාවයෙන්;

(ආ) වරද සිදු කිරීම මගින් පැමිණවිය හැකි හානියට සමානුපාතිකව; සහ

(ඇ) මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීම වළක්වනු ලැබීමට හෝ මේ පනත යටතේ යම් වරදක් සිදු කරනු ලැබූ තැනැත්තන් ග්‍රහණය කර ගැනීම සඳහා එම පියවර අවශ්‍ය විය හැකි ප්‍රමාණයට පමණක්,

එම පියවර ගනු ලැබිය යුතු ය.

විශේෂඥවරුන් හෝ වෙනත් යම් තැනැත්තන් පත්කිරීම

**43.** (1) පොලිස්පතිවරයා විසින්, එම විශේෂඥවරයාගේ හෝ සේවා සපයන වෙනත් යම් තැනැත්තාගේ කැමැත්ත ඇතිව, විමර්ශන කණ්ඩායමට සහායවීම සඳහා ඔහු විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි යම් විශේෂඥවරුන් හෝ වෙනත් යම් තැනැත්තන් සංඛ්‍යාවක් පත්කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත්කරන ලද විශේෂඥවරයා හෝ වෙනත් යම් තැනැත්තා, ඔවුන් වෙත පවරන ලද තර්තව්‍ය කිරීමේ කාර්යය සඳහා සාම නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

විමර්ශනවලට පහසුකම් සැලසීම සඳහා වන බලතල

**44.** (1) මේ පනතේ කාර්ය සඳහා, මේ පනත ප්‍රකාරව විමර්ශනයක් සිදු කිරීම පොලිස් ස්ථානයක් භාර නිලධරයකු විසින් ලිඛිතව බලය ලබා දී ඇති උප පොලිස් පරීක්ෂකවරයකුට නොඅඩු නිලයක් දරන්නා වූ පොලිස් නිලධරයකුට, මේ පනත යටතේ වරදක් සිදු කරන ලදැයි චෝදනාව ලැබූ යම් සැකකරුවකුට -

(අ) (2) වන, (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සහකාර පොලිස් අධිකාරිවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයකුට දිවුරුම් ප්‍රකාශයක් ලබා දෙන ලෙස නියම කිරීම සඳහා;

එසේ වුව ද, දිවුරුම් ප්‍රකාශයක්, මහෙස්ත්‍රාත්වරයකුගේ ආඥාවක් මත ලබා ගත යුතු ය;

(ආ) එම තැනැත්තා සන්තකයේ හෝ පාලනයේ පැවතිය හැකි විමර්ෂනයට අදාළ යම් ලේඛනයක් හෝ දෙයක් භාර දෙන ලෙස නියම කිරීම සඳහා;

එසේ වුව ද:-

(i) එම ලේඛනය හෝ දෙය භාරගත් බවට වන ප්‍රකාශයක් එම තැනැත්තාට ලිඛිතව නිකුත් කරනු ලැබිය යුතු ය; සහ

(ii) එම ලේඛනය හෝ දෙය භාර ගැනීම පිළිබඳව නොපමාව මහෙස්ත්‍රාත්වරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

බලය තිබිය යුතු ය.

(2) තමා වරදක් කළ බවට හැඟවෙන හෝ අපරාධාරෝපණය කරන දිවුරුම් ප්‍රකාශයක් කිරීමට යම් තැනැත්තකුට බැඳීමක් නොමැති විය යුතු අතර, එවැනි යම් දිවුරුම් ප්‍රකාශයක් ඒ තැනැත්තාට එරෙහිව අවේශ්‍ය කර නොගත යුතු ය.

(3) සම්මුඛ සාකච්ඡාවකට භාජනය විය යුතු සහ තමාගේ ප්‍රකාශය සටහන් කර ගනු ලැබිය යුතු හෝ තමාගේ දිවුරුම් ප්‍රකාශයක් ලබා ගනු ලැබිය යුතු යම් තැනැත්තකුට, එකී සම්මුඛ සාකච්ඡාවට හෝ දිවුරුම් ප්‍රකාශය ලබා දීමට පෙරාතුව, නීති උපදෙස් ලබා ගැනීමට ඔහු කැමති නීතිඥවරයකු වෙත ප්‍රවේශ වීමට ඔහුට ඇති අයිතිවාසිකම පිළිබඳ දැනුම් දෙනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ විධිවිධාන යටතේ ක්‍රියා කරන පොලිස් නිලධරයකු විසින්, යම් තැනැත්තකු සම්මුඛ සාකච්ඡාවට භාජනය කරනු ලැබීමට පෙරාතුව ඒ තැනැත්තාට මේ පනත යටතේ වන ඔහුගේ අයිතිවාසිකම් දැනුම් දෙනු ලැබිය යුතු ය.

(5) හැකි සෑම විටක දී ම, සම්මුඛ සාකච්ඡාව ශ්‍රව්‍ය දෘශ්‍ය ආකාරයට වාර්තා කරනු ලැබිය යුතු ය.

යාත්‍රාවක් හෝ වාහනයක් නැවැත්වීම සඳහා බලය භාවිත කිරීම

**45.** යම් වාහනයක්, යාත්‍රාවක්, දුම්රියක්, ගුවන් යානයක් හෝ මිනිසුන් රහිත වාහනයක් භාර තැනැත්තකු, මේ පනතේ කාර්ය සඳහා ඒ වාහනය, යාත්‍රාව, දුම්රිය, ගුවන් යානය හෝ මිනිසුන් රහිත වාහනය නවත්වන ලෙස පොලිස් නිලධරයකු, සන්නද්ධ හමුදා සාමාජිකයකු හෝ වෙරළ ආරක්ෂක නිලධරයකු විසින් කරන ලද යම් විධානයකට අවනත නොවන අවස්ථාවක දී, එම පොලිස් නිලධරයා, සන්නද්ධ හමුදා සාමාජිකයා හෝ වෙරළ ආරක්ෂක නිලධරයා විසින් එකී වාහනය, යාත්‍රාව, දුම්රිය, ගුවන් යානය හෝ මිනිසුන් රහිත වාහනය නැවැත්වීම සඳහා අවශ්‍ය කරනු ලැබිය හැකි බලය භාවිත කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, එවැනි යම් බලයක් භාවිත කළ හැකි වන්නේ, එකී වාහනය, යාත්‍රාව, දුම්රිය, ගුවන් යානය හෝ මිනිසුන් රහිත වාහනය නතර කිරීමේ අන් සියලු ක්‍රම අසාර්ථක වී තිබෙන අවස්ථාවක දී පමණක් වන්නේ ය.

යම් වාහනයක්, යාත්‍රාවක් යනාදිය ස්වකීය පාලනය යටතට ගැනීම

**46.** (1) මේ පනත යටතේ වන විමර්ශනයක් පවත්වාගෙන යාමේ කාර්යය සඳහා හෝ වරදක් සිදු කිරීම වැළැක්වීම සඳහා කරන ලදැයි කියනු ලබන වරදකට සම්බන්ධ යම් වාහනයක, යාත්‍රාවක, දුම්රියක, ගුවන් යානයක, මිනිසුන් රහිත වාහනයක හෝ ගුවන්යානා පද්ධතියක පාලනය තමා යටතට ගැනීමට පොලිස් නිලධරයකු හිමිකම් ලැබිය යුතු ය.

(2) එකී පාලනය තමා යටතට ගැනීම වහාම මහෙස්ත්‍රාත්වරයකු වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

යාත්‍රාවක්, ගුවන් යානයක් යනාදිය පිටත් වීම හෝ යාත්‍රා කිරීම අත්හිටුවීම හෝ පමා කිරීම

**47.** (1) මේ පනත යටතේ විමර්ශනයක් සිදු කිරීමේ කාර්යය සඳහා, පොලිස් ස්ථානයක් භාර නිලධරයකු විසින් -

(අ) යම් ගුවන් යානයක් පිටත් වීම හෝ යම් යාත්‍රාවක් යාත්‍රා කිරීම පැය හතළිස් අටක් නොඉක්මවන කාල සීමාවකට අත්හිටුවීම හෝ පමා කිරීම;

(ආ) එවැනි යම් ගුවන් යානයක් නම් කරනු ලැබූ ගුවන් තොටුපලකට හෝ වෙනත් යම් සුදුසු ස්ථානයකට ගොඩබැස්වීම; හෝ

(ඇ) යම් යාත්‍රාවක් යම් තොටුපලකට හෝ වරායකට හෝ වෙනත් සුදුසු ස්ථානයකට ගෙන ඒම,

සඳහා විධාන කරමින් ආඥාවක් නිකුත් කිරීම සඳහා යම් ගුවන්යානයක් හෝ යාත්‍රාවක් පිහිටා ඇති ප්‍රදේශයේ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර, මහෙස්ත්‍රාත්වරයා විසින්, එම ඉල්ලීම සලකා බැලීමෙන් පසු, එකී ආඥාවේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කොන්දේසියකට යටත්ව, එකී ආඥාව නිකුත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, ජාතික ආරක්ෂාවේ යහපත පිණිස එවැනි හදිසි අවශ්‍යතාවක දී, ඇති අවස්ථාවක නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයකු විසින්, එකී විධානය නිකුත් කිරීමෙන් පැය විසිහතරක් ඇතුළත මහෙස්ත්‍රාත්වරයා විසින් පසුව එකී විධානය අනුමත කරනු ලැබීමට යටත්ව, (1) වන උපවගන්තියේ (අ), (ආ) හෝ (ඇ) ඡේදවල සඳහන් යම් ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා විධාන ලබා දෙනු ලැබිය හැකි ය.

(2) ගුවන් ආරක්ෂණ නිශ්කාෂණය ලබා ගැනීමේ කාර්යය සඳහා යම් ගුවන් යානයක් සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ එවැනි යම් ආඥාවක් හෝ විධානයක් පිළිබඳව 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත යටතේ පත් කරන ලද සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාපතිවරයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(3) සිවිල් යාත්‍රාවක් සම්බන්ධයෙන් ආඥාව හෝ විධානය නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවක දී, එකී ආඥාව හෝ විධානය පිළිබඳ පූර්ව දැනුම්දීමක් 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනත යටතේ පත් කරන ලද වෙළෙඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ලබා දෙනු ලැබිය යුතු ය.

සායනික වෝහාරික වෛද්‍ය පරීක්ෂණ

**48.** (1) විමර්ශනයක් සිදු කිරීම සඳහා අත්අඩංගුවේ සිටින සැකකරුවකු හෝ වරදක වින්දිතයකු වෛද්‍ය වෘත්තිකයකු විසින් පරීක්ෂා කරනු ලැබීම අවශ්‍ය බවට යම් පොලිස් ස්ථානයක් භාර නිලධරයකු විසින් සලකනු ලබන අවස්ථාවක දී, ඔහු විසින්, එකී සැකකරුගේ හෝ වින්දිතයාගේ කැමැත්ත ඇතිව, එකී සැකකරු හෝ වින්දිතයා රජයේ වෛද්‍ය නිලධරයකු විසින් පරීක්ෂා කරනු ලැබීමට කටයුතු සලස්වනු ලැබිය හැකි ය. එකී රජයේ වෛද්‍ය නිලධරයා විසින්, එකී පරීක්ෂණයේ ප්‍රතිඵල දැක්වෙන වාර්තාවක් එකී පොලිස් නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සැකකරු හෝ වින්දිතයා එසේ පරීක්ෂා කරනු ලැබීමට කැමැත්ත පළ කරනු නොලබන අවස්ථාවක දී, පොලිස් නිලධරයා විසින්, එකී ආඥාවේ නම් කර ඇති රජයේ වෛද්‍ය නිලධරයකු විසින් එකී සැකකරු හෝ වින්දිතයා පරීක්ෂා කර ඒ පිළිබඳ වාර්තා

කිරීමට බලය ලබා දෙමින් ආඥාවක් කිරීම සඳහා එකී විමර්ශනය සිදු කරන අධිකරණ බල ප්‍රදේශයේ මහෙස්ත්‍රාත්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය. එවැනි ආඥාවක් කරනු ලැබූ අවස්ථාවක දී, එකී තැනැත්තකා විසින් එකී රජයේ වෛද්‍ය නිලධරයා විසින් පරීක්ෂා කිරීමට යටත් විය යුතු අතර, එකී පරීක්ෂණයේ ප්‍රතිඵල දැක්වෙන වාර්තාවක් එකී රජයේ වෛද්‍ය නිලධරයා විසින් මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

ආණ්ඩුවේ රස පරීක්ෂක වෙත හෝ වෙනත් විශේෂඥයකු වෙත අයිතම ඉදිරිපත් කිරීම

**49.** (1) මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම හා සම්බන්ධ විය හැකි බවට ඔහු විසින් සාධාරණව විශ්වාස කරන යම් ලේඛනයක්, දෙයක් හෝ ද්‍රව්‍යයක් පරීක්ෂා කිරීම හා විශ්ලේෂණය කිරීම සඳහා ආණ්ඩුවේ රස පරීක්ෂක වෙත හෝ වෙනත් යම් දේශීය හෝ විදේශීය විශේෂඥවරයකු වෙත ඍජුව ම ඉදිරිපත් කිරීමට පොලිස් ස්ථානයක් භාර නිලධරයකු හිමිකම් ලැබිය යුතු ය:

එසේ වුව ද, පරීක්ෂා කිරීම සහ විශ්ලේෂණය කිරීම සඳහා විදේශීය විශේෂඥවරයකු වෙත ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක දී, එකී පරීක්ෂණය හෝ විශ්ලේෂණය සඳහා ඉදිරිපත් කිරීමට පෙරාතුව මහෙස්ත්‍රාත්වරයාගේ අනුමතය ලබා ගනු ලැබිය යුතු ය.

(2) ආණ්ඩුවේ රස පරීක්ෂක හෝ වෙනත් විශේෂඥවරයා විසින්, එකී පරීක්ෂණයේ වාර්තාව, සැකකරු ඉදිරිපත් කර ඇති හෝ සැකකරු ඉදිරිපත් කිරීමට නියමිත මහෙස්ත්‍රාත්වරයාට පිටපතක් සහිතව, අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත ඍජුව ම ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකාවෙන් පිටත විමර්ශන

**50.** (1) පොලිස් නිලධරයකු විසින්, පොලිස්පතිවරයාගේ අනුමතය ඇතිව සහ අදාළ විදේශ රටෙන් ලබාගත් පූර්ව අනුමතය ඇතිව, මේ පනත ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් පිටත විමර්ශනයක් සිදු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) පොලිස්පතිවරයා විසින් බලය දෙන ලද පොලිස් නිලධරයකු විසින් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම පිළිබඳව, අදාළ විදේශ රටෙන් සහ ලේකම්වරයාගෙන් ලබා ගත් පූර්ව අනුමතය ඇතිව, වෙනත් යම් විදේශ රාජ්‍යක අපරාධ විමර්ශන ආයතනයක් හෝ නියෝජ්‍යායතනයක් හෝ විදේශ රාජ්‍යයන් හෝ විදේශ රාජ්‍යයත ආණ්ඩුව විසින් පිහිටුවන ලද ජාත්‍යන්තර සංවිධානයක් සමග ඒකාබද්ධ විමර්ශනයක් කිරීමට භාර ගැනීම සහ එය සිදු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

මහජනතාවගේ ආරක්ෂාව සඳහා පොලිසිය විසින් විධාන නිකුත් කළ හැකි බව

**51.** (1) මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් පොලිස් නිලධරයකුට තොරතුරු ලැබී ඇති අවස්ථාවක දී, සහ පැහැදිලි වූ ද, විද්‍යාමාන වූ ද, අන්තරායක් ඇති බව ද ඒ වරද හා සම්බන්ධ හානිවලින් හෝ වැඩිදුරටත් විය හැකි හානිවලින් තැනැත්තන් ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා පහත දැක්වෙන විධාන නිකුත් කිරීම අවශ්‍ය බව ද, ඔහුගේ මතය වන්නේ නම්, පොලිස් ස්ථානයක් භාර නිලධරයා විසින් පහත දැක්වෙන විධාන එකක් හෝ වැඩි ගණනක් නිකුත් කිරීම සඳහා මහේස්ත්‍රාත්වරයකු වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය:-

(අ) යම් ස්ථානයකින් යම් නිශ්චිත වස්තුවක්, වාහනයක්, යාත්‍රාවක්, දුම්රියක්, ගුවන් යානයක් හෝ මිනිසුන් රහිත වාහනයක් ඉවත් කරන ලෙස;

(ආ) වාහනයක්, යාත්‍රාවක්, දුම්රියක්, ගුවන් යානයක් හෝ මිනිසුන් රහිත වාහනයක් එහි වර්තමාන පිහිටීමෙහි ම තැබීම අවශ්‍ය බවට;

(ඇ) වැඩිදුර දැනුම් දීමක් නිකුත් කරනු ලබන තෙක් යාත්‍රාවක් හෝ නැවක් යම් නිශ්චිතව දක්වනු ලබන ප්‍රදේශයක් තුළට යාත්‍රා නොකරන ලෙස;

(ඈ) ගුවන් යානයක්, නිශ්චිතව දක්වනු ලබන ගුවන් අවකාශයක් තුළට හෝ ඉන් පිටත හෝ පියාසර නොකරන ලෙස;

(ඉ) යම් නිශ්චිත ස්ථානයක ඒකරාශී නොවන ලෙස;

(ඊ) යම් නිශ්චිත රැස්වීමක්, රැළියක් හෝ පෙළපාලියක් නොපවත්වන ලෙස; සහ

(උ) යම් නිශ්චිතව දක්වනු ලබන ක්‍රියාකාරකමක නිරත නොවන ලෙස.

(2) මහේස්ත්‍රාත්වරයා විසින්, එවැනි යම් විධානයක් නිකුත් කිරීමට පෙරාතුව, ඒ විධානය නිකුත් කිරීමට අවශ්‍ය බවට සෑහීමට පත්විය යුතු අතර

සුදුසු බවට මහේස්ත්‍රාත්වරයාට හැඟෙන කොන්දේසිවලට යටත්ව ඒ විධානය නිකුත් කිරීම සඳහා ආඥාවක් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, ජාතික ආරක්ෂාවේ යහපත පිණිස එවැනි හදිසි අවශ්‍යතාවයක් ඇති අවස්ථාවක දී, පොලිස් ස්ථානයක් භාර නිලධරයා විසින්, එකී විධානය නිකුත් කිරීමෙන් පැය විසි හතරක් ඇතුළත මහේස්ත්‍රාත්වරයකු විසින් පසුව එකී විධානය අනුමත කරනු ලැබීමට යටත්ව, (අ) ඡේදයේ සිට (උ) ඡේදය දක්වා වන ඡේදවල සඳහන් යම් ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ යම් විධානයක් පිළිබඳව, ඒ විධානය නිකුත් කරනු ලැබූ අදාළ නිලධරයා විසින් හෝ (අ) ඡේදයේ සිට (උ) ඡේදය දක්වා වන ඡේද යටතේ එවැනි යම් විධානයක් සඳහා පූර්ව අනුමතය ප්‍රදානය කළ මහෙස්ත්‍රාත්වරයා විසින්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වහාම දැනුවත් කරනු ලැබිය යුතු ය.

(4) එවැනි යම් විධානයක, හදිසි අවස්ථාවන්ට මුහුණ දීම සඳහා ද එවැනි යම් විධානයකින් බලපෑමට ලක්විය හැකි තැනැත්තන්ගේ මානුෂීය අවශ්‍යතා සපුරාලීම සඳහා ද ව්‍යතිරේඛ ඇතුළත් විය හැකි ය.

(5) එවැනි යම් විධානයක් ක්‍රියාත්මක වන කාලසීමාව, එක් වරක දී පැය විසි හතරක් නොඉක්මවිය විය යුතු අතර, එහි මුළු කාලසීමාව පැය හැත්තෑ දෙකක් නොඉක්මවිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ වන යම් විධානයක් බලාත්මක කිරීම සඳහා, පොලිස්පතිවරයා විසින්, යම් සන්නද්ධ හමුදාවක සාමාජිකයන්ගේ සහාය, අදාළ සන්නද්ධ හමුදාවේ හමුදාපතිවරයාගෙන් ලබාගත් පූර්ව අනුමතය ඇතිව, ලබාගනු ලැබිය හැකි ය.

(7) එවැනි විධානයක් බලාත්මක කිරීමේ කාර්යය සඳහා පොලිස් නිලධරයන් විසින් ඒ ප්‍රදේශය වටකර රැකවල් යෙදීම නීත්‍යානුකූල වන්නේ ය.

(8) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ විධානයකට හිතාමතාම පටහැනිව ක්‍රියා කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර,

මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, එක් වසරක් නොඉක්මවන කාල සීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

## V වන කොටස

## විමර්ශන සඳහා අවශ්‍ය වන තොරතුරු

බැංකු, මූල්‍ය ආයතන යනාදියෙන් තොරතුරු ලබා ගැනීම

**52.** වෙනත් යම් නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුවද, අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින්, මේ පනත යටතේ සිදු කරනු ලබන විමර්ශනයකට අදාළව, පහත දැක්වෙන තොරතුරු හා කරුණු එම නිලධරයාට සපයන ලෙස යම් බැංකුවකට, බැංකුවක් නොවන මූල්‍ය ආයතනයකට හෝ නාමෝද්දිෂ්ට මූල්‍යමය නොවන ව්‍යාපාරයකට නියම කිරීමට ආඥාවක් කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය:-

(අ) ඒ බැංකුව, ආයතනය හෝ ව්‍යාපාරය විසින් යම් තැනැත්තකුට සපයනු ලබන යම් මූල්‍ය සේවාවකට අදාළ තොරතුරු;

(ආ) යම් තැනැත්තකු විසින් සිදු කරනු ලැබූ යම් මුදල් ගනුදෙනුවක් පිළිබඳ විස්තර;

(ඇ) බැංකු ගිණුම්, තැන්පතු, ප්‍රේෂණ හා ආපසු ගැනීම් සම්බන්ධ විස්තර සහ එවැනි යම් බැංකුවක්, ආයතනයක් හෝ ව්‍යාපාරයක් විසින් සපයනු ලැබූ මූල්‍ය සේවා පිළිබඳ විස්තර; සහ

(ඈ) යම් තැනැත්තකු විසින් මූල්‍ය සේවා ලබා ගැනීම සම්බන්ධ විස්තර; සහ

(ඉ) යම් ගිණුමක සහතික කරනු ලැබූ ප්‍රකාශයක් හෝ යම් ගිණුමකට හෝ ගනුදෙනුවකට අදාළ වෙනත් තොරතුරක්.

(2) මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ පොලිස් නිලධරයා විසින් කරන ලද ඉල්ලීම සැලකිල්ලට ගනු ලැබිය යුතු අතර, විමර්ශනය පැවැත්වීම සඳහා ඒ ආඥාව කිරීම සාධාරණ යයි ද, අවශ්‍ය වේ යයි ද පෙනී යන අවස්ථාවක දී, (1) වන උපවගන්තිය ප්‍රකාරව ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වන ඉල්ලීමක් ඒකපාර්ශ්විකව කරනු ලැබිය හැකි අතර, එම ඉල්ලීමට අදාළ නඩුකටයුතු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 106 වන ව්‍යවස්ථාවට යටත්ව, රහසිගතව පවත්වනු ලැබිය යුතු ය.

සේවා සපයන්නන්ගෙන් තොරතුරු ලබා ගැනීම

**53.** (1) අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයාට, මේ පනත යටතේ සිදු කරනු ලබන විමර්ශනයකට අදාළව, යම් විදුලි සංදේශ, චන්ද්‍රිකා හෝ ඩිජිටල් සේවා සපයන්නකුට හෝ දත්ත සේවා සපයන්නකුට -

(අ) ඒ සේවා සපයන්නා විසින් යම් තැනැත්තකුට සපයන ලද හෝ සපයමින් පවතින සේවාවන්ට අදාළ තොරතුරු;

(ආ) ඒ සේවාවන් ලබා දී ඇත්තේ යම් තැනැත්තකුට ද, ඒ තැනැත්තා විසින් භුක්ති විඳිනු ලබන සේවාවන්ට අදාළ තොරතුරු;

(ඇ) ඒ සේවා සපයන්නා විසින් ගබඩා කරනු ලැබිය හැකි, ලේඛනාගාරගත කළ හැකි හෝ අන්‍යාකාරයකින් තබා ගත හැකි යම් තොරතුරක්, දත්තයක් හෝ ලේඛනයක් හෝ වාර්තාවක්; සහ

(ඈ) ඒ සේවා සපයන්නා විසින් සපයන ලද සේවාව හරහා යම් උපකරණයකට හෝ යම් උපකරණයකින් දත්ත හෝ තොරතුරු උඩුගත කිරීමට සහ බාගත කිරීමට අදාළ තොරතුරු, ඇතුළත් තොරතුරු,

සපයන ලෙස නියම කිරීමට ආඥාවක් කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) මහෙස්ත්‍රාත්වරයා විසින්, ඒ පොලිස් නිලධරයා විසින් සිදු කරන ලද ඉල්ලීම සැලකිල්ලට ගනු ලැබිය යුතු අතර, විමර්ශනය පැවැත්වීම සඳහා ඒ ආඥාව කිරීම සාධාරණ වේ යයි ද, අවශ්‍ය වේ යයි ද, පෙනී යන අවස්ථාවක දී, (1) වන උපවගන්තිය ප්‍රකාරව ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වන ඉල්ලීමක් ඒකපාර්ශ්විකව කරනු ලැබිය හැකි අතර, එම ඉල්ලීමට අදාළ නඩු කටයුතු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 106 වන ව්‍යවස්ථාවට යටත්ව, රහසිගතව පවත්වනු ලැබිය යුතු ය.

රජයේ ආයතනවලින් තොරතුරු ලබා ගැනීම

**54.** (1) යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින්, මේ පනත යටතේ සිදු කරනු ලබන විමර්ශනයකට අදාළව, මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කිරීමේ කාර්යය සඳහා රජයේ ආයතනයකින් යම් තොරතුරක් හෝ ලේඛනයක් ඉල්ලා සිටීමට ආඥාවක් කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) මහෙස්ත්‍රාත්වරයා විසින්, ඒ පොලිස් නිලධරයා විසින් කරන ලද ඉල්ලීම සැලකිල්ලට ගනු ලැබිය යුතු අතර, විමර්ශනයක් පැවැත්වීම සඳහා ඒ ආඥාව කිරීම සාධාරණ යයි ද, අවශ්‍ය වේ යයි ද, පෙනී යන අවස්ථාවක දී, (1) වන උපවගන්තිය ප්‍රකාරව ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වන ඉල්ලීමක්, ඒකපාර්ශ්විකව කරනු ලැබිය හැකි අතර, එම ඉල්ලීමට අදාළ නඩු කටයුතු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 106 වන ව්‍යවස්ථාවට යටත්ව, රහසිගතව පවත්වනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා, "රජයේ ආයතනය" යන්නට, ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය, අමාත්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද අමාත්‍යවරයන්ගේ කාර්යාල, අධිකරණ සේවා කොමිෂන් සභාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ වන ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා, පරිපාලනය පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා, අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු, පළාත් සභා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, යම් ලිඛිත නීතියක් යටතේ රජය සතු කළ

ව්‍යාපාර හෝ වෙනත් ව්‍යවසායන් සහ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගම් හෝ එම සමාගමේ කොටස්වලින් සියයට පනහකට වැඩි සංඛ්‍යාවක් ආණ්ඩුව, රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් දරනු ලබන්නා වූ එවැනි සමාගමක යම් පාලිත සමාගමක් ඇතුළත් වේ.

## VI වන කොටස

### විමර්ශනවලට පහසුකම් සැලසීම සඳහා මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥා නිකුත් කළ යුතු බව

දත්ත සහ තොරතුරු අගුළු විවර කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයා විසින් අවසර ලබා දිය යුතු බව

**55.** (1) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, (2) වන උපවගන්තියේ සඳහන් කාර්ය සඳහා, යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ වන වරදක් සිදු කර ඇති බවට, සිදු කරනු ලබන බවට හෝ සිදු කිරීමට ඉඩ ඇති බවට සැක කිරීමට සාධාරණ හේතු ඇති අවස්ථාවක දී පොලිස් ස්ථානයක් භාර නිලධරයකු විසින්:-

(අ) යම් දත්තවල හෝ තොරතුරුවල හෝ වෙනත් දෙයක යම් සන්නිවේදනයක් හෝ ගබඩා කිරීමේ සේවා හෝ උපකරණ අගුළු දැමීමේ හෝ කේත යෙදීමේ සේවා සපයනු ලබන යම් තැනැත්තකුට ඒ සේවාවේ හෝ උපකරණයේ අගුළු හෝ කේත විවර කර එහි අඩංගු තොරතුරු ඒ පොලිස් නිලධරයාට සැපයීමට විධාන කරමින්;

(ආ) (i) යම් තැපැල් පණිවිඩයකට හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයකට හෝ යම් දුරකථනයකට, හඬ පටයකට, අන්තර්ජාල හෝ වීඩියෝ කථාබහකට, සංවාදයකට හෝ වෙනත් යම් මාධ්‍යයක් හරහා කෙරෙන වෙනත් සන්නිවේදනයකට බාධා කිරීමට, එය කියවීමට, එයට සවන් දීමට හෝ එය පටිගත කිරීමට;හෝ

(ii) ඇනලොග් හෝ ඩිජිටල් දත්ත හෝ තොරතුරු හුවමාරු හෝ මාරු කිරීමේ පද්ධතියකට ප්‍රවේශ වීමට,

එම නිලධරයාට බලය ලබා දෙමින්,

ආඥාවක් කරන ලෙස ඉල්ලා සිටිමින් මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් කරනු ලැබිය හැක්කේ -

(අ) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකුගේ අනන්‍යතාවය නිශ්චය කිරීම;

(ආ) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකු සිටින ස්ථානය නිශ්චය කිරීම;

(ඇ) මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් විමර්ශනයක් පැවැත්වීමට පහසුකම් සැලසීම;

(ඈ) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකුට එරෙහිව සාක්ෂි එකතු කිරීම;

(ඉ) එක් තැනැත්තකු හෝ තැනැත්තන් වැඩි සංඛ්‍යාවක් විසින් මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම සඳහා කුමන්ත්‍රණය කරන්නේ ද, සැලසුම් කරන්නේ ද, සූදානම් වන්නේ ද, හෝ තැත් කරන්නේ ද යන්න නිශ්චය කිරීම;

(ඊ) මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම වැළැක්වීමට පියවර ගැනීම.,

යන කාර්ය සඳහා වන්නේ ය.

(2) මහේස්ත්‍රාත්වරයා විසින්, ඉල්ලීම කරනු ලැබ ඇත්තේ සද්භාවයෙන් වන බවට සහ එවැනි ආඥාවක් කිරීම, විමර්ශනය සිදු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන බවට ඔහු සෑහීමට පත් වන්නේ නම්, එම ආඥාව නිකුත් කරනු

ලැබිය යුතු අතර, අවශ්‍ය අවස්ථාවක දී, ඒ කාර්යය සඳහා වෘත්තීය සේවා සැපයීම සඳහා වූ ඔහු විසින් සුදුසු යයි සලකනු ලබන යම් මුදල් ප්‍රමාණයක් ගෙවන ලෙස ආඥාවක් කරනු ලැබිය හැකි ය.

## VII වන කොටස

## අපරාධ නඩු කටයුතු පැවරීම කල් තැබීම, අපරාධ නඩු පැවරීම අත්හිටුවීම සහ නඩු විභාගය

අපරාධ නඩු කටයුතු පැවරීම කල් තැබීම

**56.** (1) වෙනත් යම් ලිඛිත නීතියක යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, -

(අ) යම් තැනැත්තකුට මරණය හෝ බරපතළ තුවාල සිදු වී නොමැති විට දී; හෝ

(ආ) රාජ්‍යයේ හෝ ශ්‍රී ලාංකික ජනතාවගේ ආරක්ෂාව දැඩි ලෙස අන්තරායකට හෝ බලපෑමකට ලක් වී නොමැති විට දී,

නීතිපතිවරයා විසින්, (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් නිසි සැලකිල්ලක් දක්වමින් සහ (3) වන උපවගන්තියේ දක්වා ඇති කොන්දේසි එකකට හෝ වැඩි ගණනකට යටත් ව, එම සැකකරුට එරෙහිව අපරාධ නඩු කටයුතු පැවරීම වසර විස්සක් නොඉක්මවන කාලසීමාවක් සඳහා කල් තබනු ලැබිය හැකි ය:

එසේ වුව ද, නීතිපතිවරයා සහ කල් තැබිය හැකි වරද සිදු කර ඇති බවට සැක කරනු ලබන තැනැත්තා අතර පූර්ව එකඟතා ගිවිසුමක් තිබිය යුතු අතර, මේ උපවගන්තිය යටතේ අපරාධ නඩු කටයුතු පැවරීම කල් තැබීමට පෙර මහාධිකරණය විසින් ඒ සඳහා අවසර ලබා දිය යුතු ය:

එසේ ම තවදුරටත්, එම සැකකරුට එරෙහිව අපරාධ නඩු කටයුතු පැවරීම කල් තබන කාලසීමාව, කරන ලදැයි කියනු ලබන වරද සඳහා නියම කරනු ලැබිය හැකිව තිබූ බන්ධනාගාරගත කිරීමේ කාලසීමාව නොඉක්මවිය යුතු ය.

(2) නීතිපතිවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ අපරාධ නඩු කටයුතු පැවරීම කල් තබනු ලබන අවස්ථාවේ දී, ඔහු විසින් -

(අ) රාජ්‍ය ප්‍රතිපත්තිය;

(ආ) ජාතික යහපත;

(ඇ) මහජන යහපත;

(ඈ) පොලිස්පතිවරයාගේ අදහස්;

(ඉ) වරදේ වින්දිතයන්ගේ අදහස්; සහ

(ඊ) චූදිත තැනැත්තා හෝ ඔහු වෙනුවෙන් ඔහුගේ නීතිඥවරයා විසින් සිදු කරනු ලැබිය හැකි කරුණු දැක්වීම්,

සම්බන්ධයෙන් නිසි සැලකිල්ල දක්වනු ලැබිය යුතු ය.

(3) යම් සැකකරුවකුට එරෙහිව අපරාධ නඩු කටයුතු පැවරීම, (1) වන උපවගන්තිය ප්‍රකාරව කල් තැබීමට නීතිපතිවරයා විසින් තීරණය කර ඇති අවස්ථාවක දී, එම සැකකරුට එරෙහිව අපරාධ නඩු කටයුතු පැවරීම කල් තැබීමට ප්‍රතිෂ්ඨාවක් වශයෙන්, පහත දැක්වෙන කොන්දේසි එකක් හෝ වැඩි සංඛ්‍යාවක් එම සැකකරුට පැනවීම සඳහා වන ඉල්ලීමක්, මහාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:-

(අ) මහාධිකරණය විසින් දෙනු ලබන උපදෙස් පරිදි, නීතිපතිවරයා විසින් නිකුත් කරනු ලබන භාෂා පාඨයක් භාවිත කරමින් මහාධිකරණය ඉදිරියේ, ප්‍රසිද්ධියේ පසුතැවිල්ල ප්‍රකාශ කිරීම සහ සමාව ඉල්ලීම;

(ආ) නීතිපතිවරයා විසින් නිශ්චිතව දක්වනු ලබන පරිදි වරදේ වින්දිතයන්ට හානිපූරණය ලබා දීම;

(ඈ) නිශ්චිතව දක්වනු ලබන පුනරුත්ථාපන වැඩසටහනකට සහභාගී වීම;

(ඇ) ඒ තැනැත්තා යම් වරදක් කිරීමෙන් වැළකෙන බවට ප්‍රසිද්ධියේ සහතික වීම; හෝ

(ඉ) නිශ්චිතව දක්වනු ලබන ප්‍රජා හෝ සමාජ සේවාවක නිරත වීම.

(4) මහාධිකරණය විසින්, (3) වන උපවගන්තිය යටතේ නීතිපතිවරයා විසින් කරන ලද ඉල්ලීම සලකා බැලීමෙන් පසුව, සැකකරුට මහාධිකරණය ඉදිරියේ පෙනී සිටින ලෙස ආඥාවක් කරනු ලැබිය යුතු අතර, මහාධිකරණය විසින් පනවන ලද කොන්දේසි පිළිබඳ එකී සැකකරුට දැනුම් දෙනු ලැබිය යුතු ය. තව ද, කරුණු දැක්වීමට සහ මහාධිකරණය විසින් එසේ පනවන ලද කොන්දේසිවලට කැමැත්ත පළ කිරීමට, මහාධිකරණය විසින්, එකී සැකකරුට අවස්ථාවක් ලබා දෙනු ලැබිය යුතු ය.

(5) එකී සැකකරු විසින් (4) වන උපවගන්තිය යටතේ පනවන ලද කොන්දේසි සපුරාලීමට නියම කර ඇති කාලසීමාව ඇතුළත ඒ කොන්දේසි සපුරාලන්නේ නම්, සිදු කරන ලදැයි කියනු ලබන වරද සම්බන්ධයෙන් එකී සැකකරුට එරෙහිව නීතිපතිවරයා විසින් අපරාධ නඩු කටයුතු පවරනු නොලැබිය යුතු ය.

(6) වලංගු නිදහසට කරුණකින් තොරව එකී කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කිරීම එකී සැකකරු පැහැර හරින්නේ නම්, නීතිපතිවරයා විසින් එකී සැකකරුට දැන්වීමක් කර, ඔහුට එරෙහිව අපරාධ නඩු කටයුතු පවරනු ලැබිය හැකි ය.

අපරාධ නඩු පැවරීම අත්හිටුවීම

**57.** (1) වෙනත් යම් ලිඛිත නීතියක යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද:-

(අ) යම් තැනැත්තකුට මරණය හෝ බරපතළ තුවාල සිදුවී නොමැති විට දී; හෝ

(ආ) රාජ්‍යයේ හෝ ශ්‍රී ලාංකික ජනතාවගේ ආරක්ෂාව දැඩි ලෙස අන්තරායකට හෝ බලපෑමකට ලක්වී නොමැති විට දී,

නීතිපතිවරයා විසින්, (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් නිසි සැලකිල්ලක් දක්වමින් සහ (3) වන උපවගන්තියේ සඳහන් කොන්දේසි එකකට හෝ වැඩි ගණනකට යටත්ව, මේ පනත යටතේ වන වරක් සම්බන්ධයෙන් චෝදනා ලැබූ යම් තැනැත්තකුට එරෙහිව අපරාධ නඩු පැවරීම වසර විස්සක් නොඉක්මවන කාලසීමාවක් සඳහා අත්හිටුවනු ලැබිය හැකි ය:

එසේ වුව ද, නීතිපතිවරයා සහ අත්හිටුවනු ලැබිය හැකි වරද සම්බන්ධයෙන් චෝදනා ලැබූ තැනැත්තා අතර පූර්ව එකඟතා ගිවිසුමක් තිබිය යුතු අතර, මේ උපවගන්තිය යටතේ අපරාධ නඩු පැවරීම අත්හිටුවීමට පෙර අධිකරණය විසින් ඒ සඳහා අවසර ලබා දිය යුතු ය:

එසේ ම තවදුරටත්, එම තැනැත්තාට එරෙහිව අපරාධ නඩු පැවරීම අත්හිටුවන කාලසීමාව, ඔහුට දඬුවම් පමුණුවනු ලැබිය හැක්කේ යම් වරදක් සඳහා ද, එම වරදට අදාළ බන්ධනාගාරගත කිරීමේ කාලසීමාව නොඉක්මවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නීතිපතිවරයා විසින් අපරාධ නඩු පැවරීම අත්හිටුවනු ලබන අවස්ථාවක දී, ඔහු විසින්, 56 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ සිට (ඉ) ඡේදය දක්වා වන ඡේදවල නිශ්චිතව දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් නිසි සැලකිල්ලක් දක්වනු ලැබිය යුතු ය.

(3) එම තැනැත්තාට එරෙහිව අපරාධ නඩු පැවරීම (1) වන උපවගන්තිය ප්‍රකාරව අත්හිටුවීමට නීතිපතිවරයා විසින් තීරණය කර ඇති අවස්ථාවක දී, ඔහු විසින්, එම තැනැත්තාට එරෙහිව අපරාධ නඩඩු පැවරීම අත්හිටුවීමට ප්‍රතිෂ්ඨාවක් වශයෙන්, 56 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ සිට (ඊ) ඡේදය දක්වා වන ඡේදවල නිශ්චිතව දක්වා ඇති කොන්දේසි එකක් හෝ වැඩි සංඛ්‍යාවක් එම තැනැත්තාට පැනවීම සඳහා වන ඉල්ලීමක් මහාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) 56 වන වගන්තියේ (4) වන, (5) වන සහ (6) වන උපවගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ වගන්තිය යටතේ අපරාධ නඩු පැවරීම අත්හිටුවීම සඳහා අදාළ විය යුතු ය.

නඩු විභාගය අවසන් වන තෙක් රඳවා තැබීම

**58.** (1) (අ) ජාතික ආරක්ෂාවේ හෝ මහජන සාමයේ යහපත පිණිස හෝ නඩු විභාගය පැවැත්වෙන අතරතුර චූදිතයාගේ ජීවිතයට බරපතළ අවධානමක් හෝ සැකයක් ඇති අවස්ථාවක දී මේ පනත යටතේ අධිචෝදනා පත්‍රයක් ඉදිරිපත් කර ඇත්තේ රිමාන්ඩ් භාරයේ සිටින යම් තැනැත්තකුට එරෙහිව ද, එම තැනැත්තා යම් නීත්‍යනුකූල බලධරයකුගේ භාරයේ තැබීම අවශ්‍ය බව හෝ යෝග්‍ය බව ලේකම්වරයාගේ මතය වන්නේ නම්, ඔහු විසින්, රඳවා තැබීමේ නියමයක් පිටපතක් ද සමග, රඳවා තැබීමේ නියමයක් නිකුත් කිරීම අවශ්‍ය කරන්නා වූ හේතු දක්වමින් අදාළ මහාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර, එම ඉල්ලීම සහ ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති විරෝධතා පිළිබඳ විභාග කිරීමෙන් පසු, මහාධිකරණය විසින්, සාධාරණ නඩු විභාගයක් පැවැත්වීම සහතික කිරීම සඳහා වන යම් විධානවලට යටත්ව, රඳවා තැබීමේ නියමය බලාත්මක කරන ආඥාවක් කරනු ලැබිය හැකි ය;

(ආ) එම විධානවලට, එම තැනැත්තා සම්බන්ධයෙන් සාධාරණ නඩු විභාගයක් පැවැත්වීම සහතික කිරීමට අමතරව, අධිචූදිතයා රඳවා තැබීම, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, 29 වන වගන්තිය ප්‍රකාර රඳවා තැබූ තැනැත්තකුට අදාළ වන කොන්දේසිවලට යටත් විය යුතු බවට වන ආඥාවක් ද ඇතුළත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාර කරනු ලබන රඳවා තැබීමේ නියමය බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාට සන්නිවේදනය කරනු ලැබිය යුතු අතර, එම නියමයේ නිශ්චිතව දක්වා ඇති බලධරයාට එම තැනැත්තා භාර කිරීම බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාගේ කාර්යය විය යුතු අතර, (54 වන අධිකාරය වූ) බන්ධනාගාර ආඥාපනතේ විධිවිධාන එම තැනැත්තාගේ භාරය සම්බන්ධයෙන් අදාළ වීම අවසන් විය යුතු ය.

පනත යටතේ වන නඩු කටයුතුවලට අධිකරණයේ

**59.** අවස්ථානුගත කරුණු අනුව එම අධිකරණයේ එම වෙනත් කටයුත්ත කලින් අවසන් කිරීම අවශ්‍ය කරන අවස්ථාවක දී මිස, මේ පනත යටතේ යම් තැනැත්තකු විසින් සිදු කර ඇතැයි කියනු ලබන වරදක්

ප්‍රමුඛත්වය ලැබිය යුතු බව

සම්බන්ධයෙන් යම් අධිකරණයක පැවැත්වෙන නඩු කටයුතුවලට ඒ අධිකරණයේ වෙනත් සියලු කටයුතු අභිබවා ප්‍රමුඛත්වය ලැබිය යුතු ය.

## VIII වන කොටස

### ප්‍රකාශවල ආවේශ්‍යතාව

මහෙස්ත්‍රාත්වරයා විසින් ප්‍රකාශ සටහන් කරගත යුතු බව

**60.** (1) මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරන පොලිස් නිලධරයකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත, මහෙස්ත්‍රාත්වරයා විසින්, යම් සැකකරුවකුගෙන් ප්‍රශ්න කර එම සැකකරුගේ ප්‍රකාශය සටහන් කර ගනු ලැබිය හැකි ය.

(2) එම ප්‍රකාශය සටහන් කර ගැනීම පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූලව විය යුතු ය:-

(අ) යම් ලිඛිත නීතියක් යටතේ නීතිඥවරයකු වෙත ප්‍රවේශ වීම සඳහා ඔහුට ඇති අයිතිවාසිකම් පිළිබඳව එම තැනැත්තා දැනුවත් කරනු ලැබිය යුතු ය;

(ආ) තමා වෙත ඉදිරිපත් කරන ප්‍රශ්නවලට ස්වෙච්ඡාවෙන් ම පිළිතුරු දීමට එම තැනැත්තා විසින් අපේක්ෂා කරන්නේ ද යන්න නිශ්චය කර ගැනීම සඳහා එම තැනැත්තාගෙන් ඒ පිළිබඳ විමසනු ලැබිය යුතු අතර, එම තැනැත්තා විසින් යම් පොරොන්දුවකින්, පෙළඹවීමකින් හෝ තර්ජනයකින් තොරව ස්වෙච්ඡාවෙන් ම එම ප්‍රකාශය ලබා දෙන බවට තමා සෑහීමට පත් වන්නේ නම් පමණක්, මහෙස්ත්‍රාත්වරයා විසින්, යම් ප්‍රකාශයක් සටහන් කර ගැනීම ආරම්භ කරනු ලැබිය යුතු ය;

(ඇ) එම තැනැත්තාට එරෙහිව අපරාධ නඩු පවරනු ලැබූ අවස්ථාවක දී, ඔහු විසින් ලබා දෙන්නා වූ ප්‍රකාශයේ අන්තර්ගත දේ ඔහුට එරෙහි සාක්ෂියක් ලෙස භාවිත කරනු ලැබිය හැකි බව පිළිබඳව එම තැනැත්තා දැනුවත් කරනු ලැබිය යුතු ය;

(ඇ) එම තැනැත්තා ඉදිරිපත් කරන ලද ප්‍රශ්නවලට සහ ඒ ප්‍රශ්න සඳහා ඔහු විසින් ලබා දෙන ලද පිළිතුරුවලට අමතරව, එම තැනැත්තා විසින් ලබා දීමට අපේක්‍ෂා කරන කවර වූ හෝ ප්‍රකාශයක් සටහන් කර ගනු ලැබිය යුතු ය;

(ඉ) සම්මුඛ සාකච්ඡාවට භාජනය වන තැනැත්තාට මහේස්ත්‍රාත්වරයා කතා කරන භාෂාව තේරුම් ගැනීමට නොහැකි අවස්ථාවල දී, එම ප්‍රශ්න සහ පිළිතුරු එම තැනැත්තාට සහ මහේස්ත්‍රාත්වරයාට තේරුම්ගත හැකි භාෂාවන්ට පරිවර්තනය කිරීම සඳහා භාෂණ පරිවර්තකයකුගේ සේවය ලබාගත යුතු ය; සහ

(ඊ) සම්මුඛ සාකච්ඡාවේ වීඩියෝ පටිගත කිරීමක් පිළියෙල කර අනාගතයේ දී සත්‍යාපනය කිරීම සඳහා තබා ගනු ලැබිය යුතු ය.

(3) මහේස්ත්‍රාත්වරයා විසින් ප්‍රකාශය සටහන් කර ගැනීමේ කාර්යය සඳහා පොලිස් ස්ථානය භාර නිලධරයාගෙන් වාර්තාවක් හෝ ප්‍රශ්නාවලියක් ලබා ගනු ලැබිය හැකි ය.

(4) එම ප්‍රකාශය ලබා දුන් තැනැත්තාට, පසුව මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් අධිචෝදනා ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක දී, 61 වන වගන්තියේ (2) උපවගන්තියේ සහ 62 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති විධිවිධානවලට සහ සාක්ෂි ආඥාපනතේ 24 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, එම ප්‍රකාශය, එම වරද සම්බන්ධයෙන් වන නඩු කටයුත්තක දී, එම තැනැත්තාට එරෙහිව සාක්ෂියක් ලෙස අවේශ්‍ය කර ගනු ලැබිය යුතු ය.

(5) නීතිපතිවරයා විසින්, එම ප්‍රකාශය ලබා දුන් තැනැත්තා මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් අධිචෝදනා ලැබ ඇති තැනැත්තකුට එරෙහිව සාක්ෂි දීම සඳහා සාක්ෂිකරුවකු ලෙස කැඳවනු ලබන අවස්ථාවක දී, එම සම්පූර්ණ ප්‍රකාශය ම හෝ එහි කොටසක් සලකුණු කර, එම තැනැත්තාට අදාළ මූලික පරීක්ෂණයේම කොටසක් ලෙස සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(6) (අ) සැකකරු විසින් මහෙස්ත්‍රාත්වරයාට ප්‍රකාශයක් ලබා දීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී, මහෙස්ත්‍රාත්වරයා විසින්, එම කරුණු අදාළ පොලිස් නිලධරයාට සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

(ආ) සැකකරු විසින් එසේ ප්‍රකාශයක් ලබා දීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවේ දී, ඔහු රඳවා තැබීමේ නියමයක් ප්‍රකාර රැඳවුම් භාරයේ හෝ රිමාන්ඩ් භාරයේ සිටින්නේ නම්, ඔහු, අවස්ථාවෝචිත පරිදි, රැඳවුම් භාරයට හෝ රිමාන්ඩ් භාරයට ආපසු යවනු ලැබිය යුතු අතර මහේස්ත්‍රාත්වරයා විසින්, අවශ්‍ය අවස්ථාවක දී සැකකරුගේ ආරක්ෂාව තහවුරු කිරීමට අවශ්‍ය විය හැකි වැඩිදුරටත් වූ එවැනි ආඥාවක් කරනු ලැබිය හැකි ය.

මහෙස්ත්‍රාත්වරයකුට ලබා දෙනු ලබන ප්‍රකාශ

**61.** (1) මේ පනත යටතේ සැකකරුවකු හෝ යම් තැනැත්තකු විසින් මහෙස්ත්‍රාත්වරයකුට ලබා දෙනු ලබන යම් ප්‍රකාශයක්, (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති විධිවිධානවලට සහ සාක්ෂි ආඥාපනතේ 24 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව එම තැනැත්තාට එරෙහිව ආවේශ්‍ය කරගනු ලැබිය යුතු ය.

(2) (අ) වරදක් තමා විසින් කළ බවට හැඟවෙන හෝ අපරාධාරෝපණය කරන ප්‍රකාශයක් ලබා දීමට හෝ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට කිසිදු තැනැත්තකු නීත්‍යානුකූලව බැඳී නොසිටින්නේ ය.

(ආ) සම්මුඛ සාකච්ඡාවකට භාජනය විය යුතු සහ ඔහුගේ ප්‍රකාශය සටහන් කර ගනු ලැබිය යුතු යම් තැනැත්තකු ට, ඔහු කැමති නම් එවැනි සම්මුඛ සාකච්ඡාවකට පෙර නීතිඥවරයකු වෙත ප්‍රවේශ වීමට හෝ නීතිඥවරයකු සමඟ සන්නිවේදනය කිරීමට සහ නීති උපදෙස් ලබා ගැනීමට හිමිකම් ලැබිය යුතු ය.

(ඇ) ප්‍රකාශයක් සටහන් කර ගැනීමට අපේක්ෂා කරන මහෙස්ත්‍රාත්වරයකු විසින්, එකී සම්මුඛ සාකච්ඡාවට පෙරාතුව, එකී සාකච්ඡාවට භාජනය වන තැනැත්තාට මේ පනත යටතේ ඇති අයිතිවාසිකම් පිළිබඳ ව ඔහු දැනුවත් කරනු ලැබිය යුතු ය.

(ඈ) හැකි සෑම අවස්ථාවක දී ම සම්මුඛ සාකච්ඡාව ශ්‍රව්‍ය දෘශ්‍ය ආකාරයෙන් පටිගත කරනු ලැබිය යුතු ය.

මහෙස්ත්‍රාත්වරයකු වෙත කරනු ලැබූ ප්‍රකාශයක ආවේශ්‍යතාව සඳහා සපුරාලිය යුතු පූර්ව කොන්දේසි

**62.** වෙනත් යම් ලිඛිත නීතියකට පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ වරදක් සිදු කර ඇතැයි කියනු තැනැත්තකු විසින් මහෙස්ත්‍රාත්වරයකු වෙත කරන ලද ප්‍රකාශයක් -

(අ) එවැනි ප්‍රකාශයක් සටහන් කර ගන්නා ලද මහෙස්ත්‍රාත්වරයා විසින්, ප්‍රකාශය සටහන් කර ගැනීමට පෙරාතුව ම සහ ඉන් ඉක්බිතිව ම ඒ ප්‍රකාශය කරන ලද තැනැත්තා අධිකරණ වෛද්‍ය නිලධරයකුගේ පරීක්ෂාවට ලක් කිරීමට කටයුතු සලස්වන්නේ නම් මිස; සහ

(ආ) ප්‍රකාශයේ ආවේශ්‍යතාව තහවුරු කර ගැනීම සඳහා මෙහෙයවනු ලැබිය හැකි, ප්‍රාථමික ශක්තුතා පරීක්ෂණය අතරතුර, අධිකරණ වෛද්‍ය නිලධරයාගේ වාර්තාව නඩු පවරන බලධරයා විසින් ඉදිරිපත් කරනු ලබන්නේ නම් මිස,

එම තැනැතත්තාට එරෙහි සාක්ෂි වශයෙන් අවේශ්‍ය කර ගනු නොලැබිය යුතු ය.

## IX වෙන කොටස

## විවිධ නියම

තහනම් කිරීමේ නියම

**63.** (1) වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ වරදකට හේතු වන ක්‍රියාවක යම් සංවිධානයක් නිරත වී සිටින බවට හෝ ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක ජාතික ආරක්ෂාවට අගතිගාමී වන ආකාරයට නීති විරෝධී ලෙස ක්‍රියා කරමින් සිටින බවට විශ්වාස කිරීමට ජනාධිපතිවරයාට සාධාරණ හේතු පවතින අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින්, (මින් මතු ''තහනම් කිරීමේ නියමය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින්, මේ පනතේ විධිවිධාන ප්‍රකාර ඒ සංවිධානය තහනම් කරනු ලැබිය හැකි ය.

(2) තහනම් කිරීමේ නියමයක් මගින් පහත දැක්වෙන තහනම් කිරීම් සිදු කරනු ලැබිය හැකි ය:-

(අ) යම් තැනැත්තකු එම සංවිධානයේ සාමාජිකයකු වීම හෝ එම සංවිධානයට සම්බන්ධ වීම තහනම් කිරීම;

(ආ) එකී සංවිධානය විසින් එකී සංවිධානයට සාමාජිකයන් බඳවා ගැනීම තහනම් කිරීම;

(ඇ) යම් තැනැත්තකු විසින් එකී සංවිධානයේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ක්‍රියා කිරීම තහනම් කිරීම;

(ඈ) එම සංවිධානය විසින් රැස්වීම්, ක්‍රියාකාරකම් සහ වැඩසටහන් පැවැත්වීම තහනම් කිරීම;

(ඉ) එම සංවිධානයේ බැංකු ගිණුම් සහ වෙනත් මූල්‍ය තැන්පතු භාවිතය හෝ යෙදවීම තහනම් කිරීම;

(ඊ) යම් තැනැත්තකු විසින් එම සංවිධානය සමග හෝ එම සංවිධානය වෙනුවෙන් ගිවිසුම්වලට එළඹීම තහනම් කිරීම;

(උ) අරමුදල් රැස්කිරීම සහ ප්‍රදාන සහ රික්තවරණ ලබා ගැනීම තහනම් කිරීම;

(ඌ) සංවිධානයේ අරමුදල් සහ වත්කම් පැවරීම තහනම් කිරීම;

(එ) එම සංවිධානය වෙත පොළඹවා ගැනීම සහ ඒ සංවිධානය වෙනුවෙන් යාචනය කිරීම තහනම් කිරීම;

(ඒ) යම් තැනැත්තකු විසින් එම සංවිධානයේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා මුද්‍රිත හෝ මාර්ගගත පළ කිරීමක් ද ඇතුළුව යම් දෙයක් පළ කිරීම තහනම් කිරීම;

(ඔ) එම සංවිධානය විසින් කාර්යාල පිහිටුවීම සහ පවත්වාගෙන යාම තහනම් කිරීම; හෝ

(ඕ) අවශ්‍ය විය හැකි පරිදි, එම සංවිධානයට අදාළ වෙනත් යම් ක්‍රියාකාරකමක් තහනම් කිරීම.

(3) (1) වන උපවගන්තිය යටතේ තහනම් කිරීමේ නියමයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් සංවිධානයක් සම්බන්ධයෙන් ද, ඒ සංවිධානය සම්බන්ධයෙන් වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ නිකුත් කරන ලද යම් තහනම් කිරීමක්, සීමා කිරීමක්, අත්හිටුවීමක් හෝ සම්බාධකයක්, (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද යම් තහනම් කිරීමේ නියමයකට අගතියක් නොමැතිව අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු ය.

(4) තහනම් කිරීමේ නියමයක් ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් ඉක්බිතිව ම, ඒ තහනම් කිරීමේ නියමය ශ්‍රී ලංකාව තුළ පුළුල් ලෙස බෙදා හැරෙන පුවත්පතක සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පළ කරනු ලැබීම ද කළ යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද තහනම් කිරීමේ නියමයකින් අතෘප්තියට පත් තැනැත්තකු හෝ සංවිධානයක් විසින් කරන ලද ඉල්ලීමක් මත, ජනාධිපතිවරයා විසින් එම තැනැත්තා හෝ සංවිධානය විසින් ඉදිරිපත් කරන ලද කරුණු සැලකිල්ලට ගැනීමෙන් පසුව එම නියමය සමාලෝචනයට භාජනය කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

(6) මේ වගන්තිය යටතේ කරන ලද තහනම් කිරීමේ නියමයක්, එය පරිච්ඡින්න කරනු ලබන තෙක් වලංගු විය යුතු ය.

සීමා කිරීමේ ආඥා

**64.** (1) යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ වන වරදක් සිදු කිරීමට සූදානම් වෙමින් සිටින බව ද, ඔහු සීමා කිරීමේ ආඥාවකට යටත් කිරීමෙන් තොරව ඔහුගේ ක්‍රියාකලාපය විමර්ශනය කිරීමට නොහැකි බව ද විශ්වාස කිරීමට නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයකුට සාධාරණ හේතු ඇති අවස්ථාවක දී, එම පොලිස් නිලධරයා විසින්, සීමා කිරීමේ ආඥාවක් කිරීම සඳහා මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් සලකා බැලීමෙන් පසු, මහෙස්ත්‍රාත් අධිකරණය විසින්, ඒ නියමයේ නිශ්චිතව දක්වා ඇති යම් සීමා කිරීම් පනවමින් එක් මාසයක් නොඉක්මවන කාලසීමාවක් සඳහා සීමා කිරීමේ ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන සීමා කිරීමේ ආඥාවක පහත දැක්වෙන සීමා කිරීම් ඇතුළත් විය හැකි ය:-

(අ) පදිංචි ස්ථානයෙන් බැහැරව එහා මෙහා යාම සීමා කිරීම;

(ආ) ශ්‍රී ලංකාව ඇතුළත ගමන් කිරීම සීමා කිරීම;

(ඇ) විදේශගත වීම සීමා කිරීම;

(ඈ) පදිංචි ස්ථානය සහ සේවයේ නියුක්ත ස්ථානය අතර සාමාන්‍ය ගමන් මාර්ගයෙන් බැහැරව ගමන් කිරීම සීමා කිරීම;

(ඉ) ආඥාවෙහි නිශ්චිතව දක්වනු ලබන තැනැත්තන් සමඟ සන්නිවේදනය කිරීම හෝ ආශ්‍රය කිරීම හෝ ඒ දෙක ම සිදු කිරීම සීමා කිරීම;

(ඊ) මේ පනත යටතේ වරදක් සිදු කිරීමට පහසුකම් සැලසෙන ආකාරයේ ඇතැම් නිශ්චිතව දක්වනු ලබන ක්‍රියාකාරකම්වල නිරත වීම සීමා කිරීම; හෝ

(උ) ආඥාවෙහි නිශ්චිතව දක්වා ඇති යම් ස්ථානයකට යාම සීමා කිරීම,

පිළිබඳ සීමා කිරීම් ඇතුළත් විය හැකි ය.

(4) එවැනි යම් සීමා කිරීමේ ආඥාවක් මගින්, යම් නිශ්චිතව දක්වනු ලබන දිනයක හෝ නිශ්චිතව දක්වනු ලබන කාල පරාසයන්හි දී යම් පොලිස් ස්ථානයක් වෙත වාර්තා කිරීමට එම සැකකරුට නියම කරනු ලැබිය හැකි ය.

(5) මහෙස්ත්‍රාත් අධිකරණය අධිකරණය විසින්, එවැනි යම් සීමා කිරීමේ ආඥාවක්, එම සීමා කිරීමේ ආඥාව කරනු ලබන්නේ යම් තැනැත්තකුට ද, ඒ තැනැත්තාට භාර දීමට කටයුතු සලස්වනු ලැබිය යුතු අතර, එම ආඥාව බලාත්මක කිරීමට සහ ඊට අනුකූලව කටයුතු කරන බවට වගබලා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස (1) වන උපවගන්තිය යටතේ වන ඉල්ලීම කරනු ලැබූ පොලිස් නිලධරයාට බලය දෙනු ලැබිය යුතු ය.

(6) (අ) (1) වන උපවගන්තිය යටතේ වන ඉල්ලීම කරනු ලැබූ පොලිස් නිලධරයා විසින්, එම ආඥාව කිරීමෙන් සතියක කාලයක් ඇතුළත, සීමා කිරීමේ ආඥාව කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද එම තැනැත්තාගේ ප්‍රකාශ සටහන් කර ගැනීමට කටයුතු සලස්වනු ලැබිය යුතු අතර, එකී ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය යුතු ද වෙනස් කරනු ලැබිය යුතු ද යන්න මහෙස්ත්‍රාත් අධිකරණයට තීරණය කිරීමට හැකි වන පරිදි එකී සටහන් කර ගත් ප්‍රකාශ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) ප්‍රකාශය සටහන් කර ගැනීමට පෙර, මේ පනත යටතේ ඔහුගේ අයිතිවාසිකම් පිළිබඳ අදාළ තැනැත්තා දැනුවත් කරනු ලැබිය යුතු අතර, සීමා කිරීමේ ආඥාව කිරීමට හේතු පිළිබඳව ද ඔහු දැනුවත් කරනු ලැබිය යුතු ය.

(ඇ) ප්‍රකාශය සටහන් කර ගැනීමට පෙර, අදාළ තැනැත්තා විසින් නීතිඥවරයකු වෙත ප්‍රවේශ වීමට හෝ නීතිඥවරයකු සමග රහසිගත සන්නිවේදනයක් පැවැත්වීමට ඉල්ලීමක් කරන්නේ නම්, ඔහුට ඒ සඳහා අවසර ලබා දෙනු ලැබිය යුතු ය.

(ඈ) හැකි සෑම අවස්ථාවක දී ම, සම්මුඛ සාකච්ඡාව ශ්‍රව්‍ය දෘශ්‍ය ආකාරයෙන් පටිගත කරනු ලැබිය ය යුතු ය.

(7) මේ පනත යටතේ කරනු ලබන සීමා කිරීමේ ආඥාවක් හිතාමතාම උල්ලංඝණය කරමින් ක්‍රියා කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත් අධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, වසර තුනක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් මිලියන තුනක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(8) මහේස්ත්‍රාත් අධිකරණය විසින්, මේ වගන්තිය යටතේ කරන ලද සීමා කිරීමේ ආඥාවක් සෑම මසක ම සමාලෝචනය කරනු ලැබිය යුතු අතර, අවශ්‍ය වේ නම්, එහි කාලසීමාව දීර්ඝ කරනු ලැබිය යුතු ය.

(9) යම් සීමා කිරීමේ නියමයක මුළු කාලසීමාව මාස හයක් නොඉක්මවිය යුතු ය.

ඇඳිරි නීති නියම

**65.** (1) (140 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ජනාධිපතිවරයා විසින් (මින්මතු "ඇඳිරි නීති නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින්, (2) වන උපවගන්තියේ දක්වා ඇති කාර්ය සඳහා සහ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, දේශීය ජල තීරය සහ ගුවන් අවකාශය ද ඇතුළුව මුළු ශ්‍රී ලංකාවට ම හෝ ශ්‍රී ලංකාවෙන් කොටසකට එකී නියමයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාවක් සඳහා මේ පනත යටතේ ඇඳිරි නීතිය ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) ජනාධිපතිවරයා විසින්, ජාතික ආරක්ෂාව, මහජන ආරක්ෂාව, මහජන සාමය හෝ මහජන සුරක්ෂිතතාව ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ඇඳිරි නීති නියමයක් කරනු ලැබිය හැකි ය.

(3) (අ) යම් ඇඳිරි නීති නියමයක උපරිම කාලසීමාව එක් වරකට පැය විසි හතරක් නොඉක්මවිය යුතු ය.

(ආ) ඇඳිරි නීති කාලසීමාවන් දෙකක් අතර, අවම වශයෙන් පැය තුනක කාලසීමාවක කාල පරතරයක් පැවතිය යුතු ය.

(4) එවැනි යම් ඇඳිරි නීති නියමයක -

(අ) එම නියමය අදාළ වීමෙන් නිදහස් කරනු ලබන තැනැත්තන් ප්‍රභේද නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය;

(ආ) (i) යම් තැනැත්තකු හෝ තැනැත්තන් ඇඳිරි නීති නියමයට අනුකූලව ක්‍රියා කිරීමෙන් නිදහස් කරමින්; සහ

(ii) බලපත්‍රයෙහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි අත්‍යවශ්‍ය සේවා සහ සැපයුම්, හදිසි අවශ්‍යතා සහ මානුෂීය අවශ්‍යතා පවත්වා ගෙන යාමේ අවශ්‍යතාව හේතුවෙන් එවැනි තැනැත්තකු හෝ තැනැත්තන්ට එක් ස්ථානයකින් තවත් ස්ථානයකට ගමන් කිරීමට බලය ලබා දෙමින්,

බලපත්‍ර නිකුත් කිරීමට බලය ලබා දී ඇති යම් තැනැත්තකු නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(5) ඇඳිරි නීති නියමයකින් සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසකින් නිදහස් වීමට අවශ්‍ය යම් තැනැත්තකු, (4) වන උපවගන්තියේ දක්වා ඇති බලධරයාට, නියම කරනු ලබන ආකෘතියෙන් ඉල්ලීමක් කිරීමට හිමිකම ලැබිය යුතු ය.

(6) ඇඳිරි නීති නියමයක් හිතාමතාම උල්ලංඝනය කරනු ලබන තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන තුනක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගතකිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

තහනම් ස්ථාන

**66.** (1) මේ පනතේ කාර්ය සඳහා ලේකම්වරයා විසින්, (මෙහි මින් මතු "තහනම් ස්ථානය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් මහජන භාවිත ස්ථානයක් හෝ මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම සඳහා භාවිත කරන බවට සාධාරණ ලෙස සැක කරනු ලැබිය හැකි වෙනත් යම් ස්ථානයක් තහනම් ස්ථානයක් බවට, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, කලින් කල නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන නියමයක, තහනම් ස්ථානයකට ඇතුළු වීම තහනම් කිරීම සහ අවශ්‍ය අවස්ථාවල දී තහනම් ස්ථානය ඡායාරූපගත කිරීම, වීඩියෝ පටිගත කිරීම සහ එම ස්ථානයේ දළ සටහන් සකස් කිරීම තහනම් කිරීම ද ඇතුළත් විය යුතු ය.

(3) තහනම් ස්ථානයක් සම්බන්ධයෙන් වන නියමය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් ඉක්බිතිව ම, එම නියමය, ශ්‍රී ලංකාව තුළ පුළුල් බෙදා හැරීමක් සහිත පුවත්පතක සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පළ කරනු ලැබිය යුතු ය.

(4) තහනම් ස්ථානයක් ලෙස ස්ථානයක් ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව, එම ස්ථානය තහනම් ස්ථානයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති බව සඳහන් කරමින් හැකි අවස්ථාවල දී එම ස්ථානයට ඇතුළු වන ස්ථානවල නිවේදන තැබිය යුතු ය.

(5) (අ) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් ක්‍රියාත්මක වන කාලසීමාව පැය හැත්තෑ දෙකක් නොඉක්මවිය යුතු ය.

(ආ) එවැනි යම් නියමයක් ක්‍රියාත්මක වන කාල සීමාව පැය හැත්තෑ දෙකක් ඉක්මවන කාලසීමාවක් සඳහා දීර්ඝ කරනු ලැබීමට අවශ්‍ය අවස්ථාවක දී, තහනම් ස්ථානය පිහිටි ප්‍රදේශයේ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් තත් කාර්යය සඳහා, තහනම් ස්ථානය පිහිටි ප්‍රදේශයේ අධිකරණ බලය හිමි මහෙස්ත්‍රාත්වරයාගේ පූර්ව අනුමතය ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය. එම මහෙස්ත්‍රාත්වරයා විසින්, ඒ ආඥාව නිකුත් කිරීමට පෙරාතුව ඒ ආඥාව කිරීමට ඇති අවශ්‍යතාවය පිළිබඳ සෑහීමට පත් වී ඒ ආඥාව යම් කොන්දේසිවලට යටත් ව නිකුත් කරනු ලැබිය හැකි ය.

(6) (1) වන උපවගන්තිය යටතේ නියමයක් කිරීමෙන් පසුව, තහනම් ස්ථානය පිහිටි ප්‍රදේශයේ ස්ථානය භාර නිලධරයා හෝ ලේකම්වරයා විසින් බලය ලබා දී ඇති පරිදි තහනම් ස්ථානය පිළිබඳව නීත්‍යානුකූල බලය සහ පාලනය සහිත වෙනත් තැනැත්තකු විසින් එම ස්ථානයට ඇතුළු වීමට සහ එහි රැඳී සිටීමට බලය ඇති පුද්ගල කාණ්ඩ නිශ්චිතව දක්වනු ලැබිය යුතු අතර, ඔහු විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කොන්දේසි මත එම ස්ථානයට වෙනත් යම් තැනැත්තකුට ඇතුළු වීමට අවසර ලබා දීමට ද ඔහුට හිමිකම ඇත්තේ ය.

(7) නීත්‍යානුකූල අවසරයකින් තොරව තහනම් ස්ථානයකට ඇතුළු වීමෙන් හෝ එහි රැඳී සිටීමෙන් මේ වගන්තිය යටතේ කරන ලද නියමයක් හිතාමතාම උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, අවුරුදු තුනක්

නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන තුනක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(8) තහනම් ස්ථානයක ඡායාරූප ගනු ලබන වීඩියෝ පටිගත කිරීම් සිදු කරනු ලබන සහ චිත්‍ර හෝ දළ සටහන් සකස් කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන තුනක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(9) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා "මහජන භාවිත ස්ථානය" යන්නට, අදාළ වේලාවේ දී මහජනතාවට අයිතියක් ලෙස හෝ අන්‍යාකාරයකින් ප්‍රවේශ විය හැකි හෝ ප්‍රවේශ වීමට අවසර ඇති යම් මහා මාර්ගයක් සහ වෙනත් යම් පරිශ්‍රයක් හෝ ස්ථානයක් ඇතුළත් වේ.

## X වන කොටස

### දඬුවම් දීමට අදාළ මාර්ගෝපදේශ

දඬුවම බරපතළ වන කරුණු

**67.** මේ පනත යටතේ වරදක් සිදු කර වරදකරුවකු කරන ලද තැනැත්තකු වෙත පැනවිය යුතු බන්ධනාගාරගත කිරීමේ කාලසීමාව තීරණය කිරීමේ දී, මේ පනතේ විධිවිධානවලට යටත්ව, බන්ධනාගාරගත කිරීමේ කාලසීමාව වැඩිකර ලබා දීමට හේතු වන බරපතළ කරුණු ලෙස පහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගනු ලැබිය හැකි ය :-

(අ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් විදේශීය රාජ්‍යයක භෞමික අඛණ්ඩතාවයට හෝ ස්වෛරීභාවයට අදාළ වරද සිදු කිරීමෙන් වූ බලපෑම;

(ආ) ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාවට හෝ රාජ්‍ය ආරක්ෂාවට අදාළ වරද සිදු කිරීමෙන් වූ බලපෑම;

(ඈ) වරද සිදු කිරීම හේතුවෙන් අහිමි වූ ජීවිත සංඛ්‍යාව;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකුට කරන ලද තුවාල හෝ හානි;

(ඉ) වින්දිතයන් මත වරදෙහි බලපෑම සහ ඔවුන් විසින් විඳිනු ලැබූ ප්‍රතිවිපාකයන්හි බරපතළ ස්වභාවය;

(ඊ) වරද සිදු කිරීම මහජන නොසන්සුන්තාවක් ඇති කළේ ද යන වග;

(උ) පොදු ජනතාවගේ ආරක්ෂාව මත වන බලපෑම;

(ඌ) ශ්‍රී ලංකාවේ ජනතාවගේ සාමකාමී සහජීවනය මත වන බලපෑම;

(එ) ශ්‍රී ලංකා ආණ්ඩුවට, සහ පොදු ජනතාවට හෝ යම් තැනැත්තකුට ඇති වූ මූල්‍යමය හෝ ද්‍රව්‍යමය පාඩුව;

(ඒ) ඇති වූ අලාභවලට හානිපූරණය කිරීම සහ අලාභ යථා තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය මූල්‍යමය සහ වෙනත් සම්පත්; සහ

(ඔ) දඬුවම බරපතල කිරීමේ කරුණු ලෙස සැලකිල්ලට ගනු ලැබිය යුතු බවට අධිකරණය විසින් සලකනු ලැබිය හැකි වෙනත් යම් කරුණු.

දඬුවම ලිහිල් කිරීමේ කරුණු

**68.** මේ පනත යටතේ වරදක් සිදුකර වරදකරුවකු කරන ලද තැනැත්තකු වෙත පැනවිය යුතු බන්ධනාගාරගත කිරීමේ කාලසීමාව තීරණය කිරීමේ දී, මේ පනතේ විධිවිධානවලට යටත්ව බන්ධනාගාරගත කිරීමේ කාලසීමාව ලිහිල් කිරීමට හේතුවන ලිහිල් කිරීමේ කරුණු ලෙස පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනු ලැබිය හැකි ය :-

(අ) ත්‍රස්තවාදය ප්‍රසිද්ධියේ හෙළා දැකීම;

(ආ) පසුතැවිල්ල ප්‍රකාශ කිරීම;

(ඇ) වරද සිදු කරන අවස්ථාවේ දී වරදකරුගේ වයස;

(ඈ) රැඳවුම් භාරයේ හෝ රිමාන්ඩ් භාරයේ නැතහොත් එම රැඳවුම් භාරය සහ රිමාන්ඩ් භාරය යන දෙකෙහි ම ගත කරන ලද කාලසීමාව;

(ඉ) වරද සිදු කරන ලද්දේ බලාත්කාරයෙන් හෝ උත්තර්ජනයක් යටතේ ද එසේ බලකිරීමක් හෝ උත්තර්ජනයක් යටතේ වරද සිදු කරන ලද බව;

(ඊ) චූදිතයා විසින් ස්වේච්ඡාවෙන් ම වරදෙහි වින්දිතයන්ට හානිපූරණ ලබා දීම;

(උ) චූදිතයාව වරදකරු කරනු ලැබූ ප්‍රචණ්ඩ ක්‍රියා සහ වෙනත් වැරදි සම්බන්ධයෙන් ප්‍රසිද්ධියේ හෙළා දැකීම;

(ඌ) ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවය සහ ස්වෛරීභාවය සුරක්ෂිත කිරීමට සහ ආරක්ෂා කිරීමට කැපවීම;

(එ) අධිකරණය විසින් නියම කරනු ලබන පුනරුත්ථාපන වැඩසටහනකට ස්වේච්ඡාවෙන් සහභාගී වීම සහ එම වැඩසටහන සම්පූර්ණ කිරීම; හෝ

(ඒ) දඬුවම ලිහිල් කිරීමේ කරුණක් ලෙස සැලකිල්ලට ගනු ලැබිය යුතු බවට අධිකරණය විසින් සලකනු ලැබිය හැකි වෙනත් යම් කරුණක්.

## XI වන කොටස

## සාමාන්‍ය විධිවිධාන

ළමා ආඥාපනත අදාළ විය යුතු බව

**69.** මේ පනත යටතේ වරදක් කිරීම සම්බන්ධයෙන් වරදකරු වූ සහ එවැනි වරදකට වරදකරු කරනු ලැබූ යම් ළමයකුට (23 වන අධිකාරය වූ) ළමා ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

නඩු කටයුතුවලින් ආරක්ෂාව

**70.** මේ පනත මගින් යම් නිලධරයකුට හෝ තැනැත්තකුට ලබා දී ඇති බලතල, කාර්ය සහ තර්තව්‍ය, ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී, මේ පනත යටතේ එම නිලධරයා හෝ තැනැත්තා විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, ඔහු සද්භාවයෙන් ක්‍රියා කළ බවට සහ නිසි උද්යෝගයෙන්, සාධාරණ සැලකිල්ලකින් සහ කුසලතාාවයකින් කටයුතු කළ බවට ඔහු විසින් ඔප්පු කරනු ලබන්නේ නම්, ඔහුට විරුද්ධව කිසිදු සිවිල් හෝ අපරාධ නඩු කටයුත්ක් පවරනු නොලැබිය යුතු ය.

පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි.

**71.** මේ පනත යටතේ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබූ විට, ඒ පුද්ගල මණ්ඩලය -

(අ) සංස්ථාපිත මණ්ඩලයක් නම්, ඒ සංස්ථාපිත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු සහ ප්‍රධාන විධායක නිලධරයකු ම;

(ආ) ආයතතනයක් නම් ඒ ආයතතනයේ සෑම හවුල්කරුවකු ම; හෝ

(ඇ) ආයතතනයක් නොවන සංස්ථාගත නොකළ මණ්ඩලයක් නම් එහි කළමනාකාරිත්වය හා පාලනය සඳහා වග කිව යුතු ඒ මණ්ඩලයේ සෑම නිලධරයකු ම,

එම වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, එම වරද සිදු කරන ලද්දේ තමාගේ අනුදැනුම ඇතිව නොවන බව හෝ එම වරද සිදු කිරීම වැළැක්වීම සඳහා තමා නිසි සියලු

උද්යෝගයෙන් යුතු ව ක්‍රියා කළ බව හෝ එම තැනැත්තා විසින් ඔප්පු කරනු ලබන්නේ නම්, එවැනි තැනැත්තකු එම වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

නියෝග

**72.** (1) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් මේ පනත යටතේ නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ බලතල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, නීතිපතිවරයා විසින් 56 වන වගන්තිය යටතේ නඩු කටයුතු පැවරීම කල් තැබීම හෝ 57 වන වගන්තිය යටතේ අපරාධ නඩු කටයුතු පැවරීම අත්හිටුවීමට නිර්දේශ කර ඇත්තේ හෝ නීතිපතිවරයා විසින් අධිචෝදනා ඉල්ලා අස්කර ගනු ලැබ ඇත්තේ යම් තැනැත්තන් සම්බන්ධයෙන් ද එකී තැනැත්තන් සඳහා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කාරණා ඇතුළත් නියෝග සාදනු ලැබිය හැකි ය:-

(අ) වැඩසටහන පැවැත්වීම මගින් සාක්ෂාත් කරගත යුතු අරමුණු;

(ආ) පුනරුත්ථාපනයේ ස්වභාවය;

(ඇ) සපයනු ලබන පුහුණුවේ ස්වභාවය;

(ඈ) පුනරුත්ථාපනය හෝ පුහුණුව පවත්වන අධිකාරිය හෝ අධිකාරීන්;

(ඉ) වැඩසටහන පවත්වනු ලබන ස්ථානය;

(ඊ) වැඩසටහන පවත්වනු ලබන කාල සීමාව; සහ

(උ) එවැනි යම් පුනරුත්ථාපන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අදාළ වන වෙනත් යම් කාරණා.

(3) මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දිනයෙහි හෝ එම නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට හෝ එම නියෝගය ක්‍රියාත්මක විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් මාස තුනක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක්, ඒ යටතේ නිසි ලෙස කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරන ලද ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) නියෝගයක් එසේ පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

විධාන

**73.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, ජනාධිපතිවරයා විසින්, කලින් කල, මේ පනතේ විධිවිධාන බලාත්මක කළ යුතු ආකාරයට අදාළව විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද විධාන හුදෙක් ම, කාර්යක්ෂම ආකාරයෙන් මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා විය යුතු අතර, නීතියෙන් පිළිගනු ලබන මානව හිමිකම් න්‍යායන් සහ ප්‍රමිතීන්ට අනුකූල විය යුතු ය.

(3) ඒ සෑම විධානයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

මේ පනත වෙනත් ලිඛිත නීති අභිබවා බලපවත්වන බව

**74.** වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, එය නොතකා, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු අතර, මේ පනතේ විධිවිධාන සහ එවැනි වෙනත් ලිඛිත නීතියක විධිවිධාන අතර යම් ගැටීමක් හෝ අනනුකූලතාවක් පවතින අවස්ථාවක දී, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

අධිකරණ සමාලෝචන

**75**. මේ පනත යටතේ යම් අදාළ අධිකාරියක් විසින් ලබා දෙන ලද යම් තීරණයකින්, නිශ්චය කිරීමකින්, කරන ලද නියමයකින් හෝ නිකුත් කරන ලද යම් නිර්දේශයකින් හෝ විධානයකින් අතෘප්තියට පත්වන යම් තැනැත්තකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන ප්‍රකාර සහනයක් හෝ පිළියමක් ඉල්ලීම වළක්වනු ලබන ලෙස මේ පනතේ අන්තර්ගත වන කිසිවක් කියවා තේරුම් නොගත යුතු ය.

1979 අංක 48 දරන පනත ඉවත් කිරීම

**76.** 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

අන්තර්කාලීන විධිවිධාන සහ ඉතිරි කිරීම්

**77.** (මින් මතු "ඉවත් කරන ලද පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත ඉවත් කිරීම නොතකා -

(අ) ඉවත් කරන ලද පනත යටතේ යම් අධිකරණයක හෝ වෙනත් අධිකාරයක සිදු කරනු ලැබූ, පවත්වනු ලැබූ, ඒ වෙත ඉදිරිපත් කරනු ලැබූ හෝ කරනු ලැබූ සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විභාග වෙමින් පැවති යම් විමර්ශනයක්, නඩු විභාගයක්, අභියාචනයක් හෝ ඉල්ලීමක් ප්‍රායෝගිකව හැකිතාක් දුරට කාර්ය පටිපාටිය සහ සාක්ෂිවලට අදාළ විධිවිධාන ද ඇතුළත්ව, ඉවත් කරන ලද පනතේ විධිවිධාන යටතේ විභාග කර අවසන් කිරීම, ඉදිරියට පවත්වාගෙන යාම, පවත්වාගෙන යාම හෝ ඇසීම කරනු ලැබිය යුතු ය;

(ආ) (i) නියමිත දිනයට පෙරාතුව, ඉවත් කරන ලද පනත යටතේ වරදක් කරනු ලැබූ බවට හෝ වරදක් කිරීමට සම්බන්ධ වූ බවට සැකයට භාජනය වී සිටින්නා වූ ද නියමිත දිනය වන විට නඩු පවරනු ලැබ නොමැති වූ ද යම් තැනැත්තකුහට ඉවත් කරන ලද පනතේ විධිවිධාන යටතේ නඩු පවරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, නඩු කටයුතු පැවරීම කල් තැබීම හෝ අපරාධ නඩු පැවරීම අත්හිටුවීමට අදාළව නීතිපතිවරයා

සතු බලතල මේ පනත යටතේ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය: සහ

(ii) එවැනි යම් වරදකට අදාළ නඩු කටයුතු මේ පනතේ විධිවිධාන යටතේ ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින් අවසන් කරනු ලැබිය යුතු ය.

(ඇ) නියමිත දිනයේ දී බලාත්මකව පවතින සහ ඉවත් කරන ලද පනතේ විධිවිධාන යටතේ සාදනු ලැබූ 2001 ජූලි මස 21 වන දින අංක 1193/31 දරන අතිවිශේෂ ගැසට්පත්‍රයේ පළකරන ලද 2001 අංක 4 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (ජාතික ආරක්ෂක මණ්ඩලය) නියෝග මේ පනතේ විධිවිධාන යටතේ සාදනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, පරිච්ඡින්න කරනු ලැබුවේ නම් මිස සහ පරිච්ඡින්න කරනු ලබන තෙක් දිගටම බලාත්මක විය යුතු ය සහ බලාත්මක කරනු ලැබිය යුතු ය; සහ

(ඇ) නියමිත දිනයේ දී බලාත්මකව පවතින්නා වූද, ඉවත් කරන ලද පනතේ විධිවිධාන යටතේ සාදන ලද්දා වූ ද, පහත නිශ්චිතව දක්වා ඇති සංවිධාන තහනම් කිරීම සඳහා සාදන ලද නියෝග ඇතුළුව, සංවිධාන තහනම් කිරීම සම්බන්ධයෙන් වන සියලු නියෝග මේ පනතේ අනුරූපී විධිවිධාන යටතේ සාදනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, දිගටම බලාත්මක විය යුතු ය සහ බලාත්මක කරනු ලැබිය යුතු ය. එම නියෝග මේ පනත යටතේ සාදනු ලබන නියමයක් මගින් සංශෝධනය කිරීම, පරිච්ඡින්න කිරීම හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය.

(i) 2001 ජූලි මස 6 වන දින අංක 1191/19 අතිවිශේෂ ගැසට්පත්‍රයේ පළකරන ලද 2001 අංක 2 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ නියෝග;

(ii) 2011 අගෝස්තු මස 29 වන දින අංක 1721/2 දරන අතිවිශේෂ ගැසට්පත්‍රයේ පළකරන ලද 2011 අංක 1

දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (ද්‍රවිඩ ඊළාම් විමුක්ති කොටි සංවිධානය තහනම් කිරීමේ) නියෝග;

(iii) 2011 අගෝස්තු මස 29 වන දින අංක 1721/2 දරන අතිවිශේෂ ගැසට්පත්‍රයේ පළකරන ලද 2011 අංක 2 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (දෙමළ පුනරුත්ථාපන සංවිධානය තහනම් කිරීමේ) නියෝග;

(iv) 2011 අගෝස්තු මස 29 වන දින අංක 1721/4 දරන අතිවිශේෂ ගැසට්පත්‍රයේ පළකරන ලද 2011 අංක 4 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (රැඳවියන් සහ රිමාන්ඩ් භාරයේ සිටින සිරකරුවන් පිළිබඳ) නියෝග;

(v) 2011 අගෝස්තු මස 29 වන දින අංක 1721/5 දරන අතිවිශේෂ ගැසට්පත්‍රයේ පළකරන ලද 2011 අංක 5 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (භාරවන්නන්ගේ රැකවරණය සහ පුනරුත්ථාපනය) නියෝග;

(vi) 2019 මැයි මස 13 වන දින අංක 2123/3 දරන අතිවිශේෂ ගැසට්පත්‍රයේ පළකරන ලද 2019 අංක 1 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (අන්තවාදී සංවිධාන තහනම් කිරීමේ) නියෝග; සහ

(vii) 2023 ජූලි මස 26 වන දින අංක 2342/27 දරන අතිවිශේෂ ගැසට්පත්‍රයේ පළකරන ලද නියෝග මගින් සංශෝධිත, 2021 අප්‍රේල් මස 13 වන දින අංක 2223/3 අතිවිශේෂ ගැසට්පත්‍රයේ පළකරන ලද 2021 අංක 2 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (අන්තවාදී සංවිධාන තහනම් කිරීමේ) නියෝග.

අර්ථ නිරූපණය

**78.** (1) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි -

“ගුවන් යානයක” යන්නට, හෙලිකොප්ටරයක් ඇතුළත් වේ;

“සන්නද්ධ හමුදා” යන්නෙන්, (357 වන අධිකාරය වූ) යුද්ධ හමුදා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා නාවික හමුදාව සහ (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා ගුවන් හමුදාව අදහස් වේ;

“වෙරළ ආරක්ෂක නිලධරයා” යන්නට, 2009 අංක 41 දරන වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පනතේ ඒ යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

“අපරාධ නඩු විධාන සංග්‍රහය පනත” යන්නෙන්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත අදහස් වේ;

“රහස්‍ය තොරතුරු” යන්නෙන්, -

(අ) පතුරුවා හැරීම මගින් ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව හා රාජ්‍ය ආරක්ෂාව කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කිරීමට ඉඩ ඇති යම් තොරතුරු;

(ආ) පතුරුවා හැරීම මගින් ජාතික ආරක්ෂාව හා මහජන ආරක්ෂාව කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කිරීමට ඉඩ ඇති -

(i) පොලීසියේ, සන්නද්ධ හමුදාවල හෝ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ

තැනැත්තන් හෝ ඔවුන්ගේ ආයුධ, වෙඩි බෙහෙත්, උපකරණ, වාහන, යාත්‍රා, ගුවන්යානා හෝ තාක්ෂණය සම්බන්ධයෙන් වන;

(ii) යම් නිශ්චිතව දක්වනු ලබන තැනැත්තකුගේ ක්‍රියා, ගමන් බිමන් හෝ සිටින ස්ථාන සම්බන්ධයෙන් වන;

(iii) තහනම් කළ ස්ථානයන් හෝ අනුමත කළ රඳවා තබා ගැනීමේ ස්ථාන සම්බන්ධයෙන් වන;

(iv) මේ පනත යටතේ වන වැරදිවල විමර්ශන පැවැත්වීම, එකී විමර්ශනවල දී අනාවරණය කරගත් කරුණු, සිරභාරයට ගත් හා රඳවා තබාගත් තැනැත්තන්ගේ හා විමර්ශන පවත්වනු ලබන නිලධරයන්ගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් වන,

පොදු ප්‍රවේශයක් නොමැති යම් තොරතුරු;

(ඇ) ක්‍රියාවට නැංවීමට අදහස් කරනු ලබන හෝ ක්‍රියාවට නංවනු ලබන හෝ ක්‍රියාවට නංවා ඇති යම් නීතියක

බලාත්මක කිරීමේ පියවරක් හෝ යුදමය පියවරක් ද ඇතුළත්ව යම් නිල කටයුත්තක් මෙහෙයවීම පිළිබඳ පොලීසිය හෝ සන්නද්ධ හමුදාවලට අදාළ යම් තොරතුරක්;

(ඇ) ජාතික ආරක්ෂාවට හා රාජ්‍ය ආරක්ෂාවට අදාළ යම් රහස් කේත අංකයක්, වචනයක්, මුරපදයක් හෝ දත්ත සැඟවීමේ විස්තරයක්,

අදහස් වේ.

"ඇඳිරි නීතිය" යන්නෙන්, යම් මාර්ගයක්, දුම්රිය මාර්ගයක්, උමඟක්, දේශීය මුහුදු තීරය, දිය පාරක්, උද්‍යානයක්, වෙළෙඳපොළක්, මුහුදු වෙරළ සහ විනෝද උයන් ඇතුළුව මහජන භාවිත ස්ථානයක සිටීමේ හෝ එවැනි ස්ථානයක් තුළ හෝ ඒ හරහා ගමන් කිරීමේ තහනම අදහස් වේ;

"නාමෝද්දිෂ්ට මූල්‍යමය නොවන ව්‍යාපාර" යන්නට, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ එම යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"සාක්ෂි ආඥාපනත" යන්නෙන්, (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනත අදහස් වේ;

"මහාධිකරණය" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාවෙන් පිහිටුවන ලද පළාත්බද මහාධිකරණය අදහස් වේ;

"ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව" යන්නෙන්, 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආරක්ෂක අමාත්‍යවරයා අදහස් වේ;

"බැංකු නොවන මූල්‍ය ආයතනය" යන්නට, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ ඒ යෙදුමට දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"දණ්ඩ නීති සංග්‍රහය" යන්නෙන්, (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය අදහස් වේ;

"තැනැත්තා" යන්නෙන්, තනි පුද්ගලයකු, පුද්ගල කණ්ඩායමක්, සමිතියක්, සංවිධානයක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ;

"පොලිස් ආඥාපනත" යන්නෙන්, (53 වන අධිකාරය වූ) පොලිස් ආඥාපනත අදහස් වේ;

"තහනම් කළ ත්‍රස්තවාදී සංවිධානය" යන්නට, 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනත ප්‍රකාරව සාදන ලද නියෝගයක් යටතේ නම් කරනු ලැබූ යම් අස්තිත්වයක් ද ඇතුළත් වේ;

"ලේකම්වරයා" යන්නෙන්, ආරක්ෂක අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ;

නිශ්චිතව දක්වා ඇති තැනැත්තා'' යන්නෙන්,:-

(අ) ජනාධිපතිවරයා;

(ආ)ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ, මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු, අධිකරණ නිලධරයන් සහ උපලේඛනගත රජයේ නිලධරයන්;

(ඇ) නීතිපතිවරයා සහ ඔහුගේ නිලධරයන්;

(ඈ) රජයේ නිලධරයන්;

(ඉ) විදේශීය රාජ්‍යයක යම් නියෝජිතයකු හෝ නිලධරයකු හෝ අන්තර් රාජ්‍ය ස්වභාවයෙන් වූ ජාත්‍යන්තර සංවිධානයක යම් නිලධරයකු හෝ වෙනත් යම් අනුයෝජිතයකු;

(ඊ) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු;

(උ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ වන ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කොමිෂන් සභාවක යම් සභාපතිවරයකු සහ සාමාජිකයකු, විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ හෝ පරීක්ෂණ

කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද කොමිෂන් සභාවක යම් සාමාජිකයකු;

(උ) ජූරි සභිකයකු, අධිනීතිඥවරයකු හෝ අධිකරණ නිලධරයකු; සහ

(ඌ) සන්නද්ධ හමුදාවල, පොලිසියේ සහ වෙනත් යම් හමුදාවක යම් සාමාජිකයකු සහ වෙරළ ආරක්ෂක නිලධරයකු,

අදහස් වේ;

"ශ්‍රී ලංකා ජනරජයට අයත් දේශය" යන්නට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඒ යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"මිනිසුන් රහිත වාහනය" යන්නෙන්, දුරස්ථව හැසිරවීමේ හෝ පාලනය කිරීමේ හැකියාව ඇති හෝ නොමැති යම් වස්තුවක් තුළ සිටින මනුෂ්‍යයකු මගින් ඒ වස්තුව හැසිරවීමේ හැකියාවක් නොමැති යාන්ත්‍රික හෝ ස්වයංක්‍රීය වස්තුවක් අදහස් වේ;

"වින්දිතයා" යන්නට, 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ "අපරාධයක වින්දිතයා" යන යෙදුමට ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"සාක්ෂිකරු" යන්නට, 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ එම යෙදුමට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

(2) මේ පනතේ භාවිත කර ඇත්තා වූ ද, දණ්ඩ නීති සංග්‍රහයේ හෝ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථනිරූපණය කර ඇත්තා වූ ද, එහෙත් මේ පනතේ අර්ථ නිරූපණය කර නොමැත්තා වූ ද, යම් වචනයකට හෝ යෙදුමකට, පිළිවෙලින්, දණ්ඩ නීති සංග්‍රහයේ සහ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ ඒ වචනය හෝ යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**79.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**පළමුවන උපලේඛනය**

**[3(5) වන වගන්තිය]**

1. 1970 වර්ෂයේ දෙසැම්බර් මස 16 වන දින හේග් හි දී සම්මත කර ගනු ලැබූ නීති විරෝධී ලෙස ගුවන්යානා ග්‍රහණයට ගැනීම මැඩපැවත්වීම සඳහා වූ සම්මුති ය.

2. 1971 වර්ෂයේ සැප්තැම්බර් මස 23 වන දින මොන්ට්‍රියල් හි දී සම්මත කර ගනු ලැබූ සිවිල් ගුවන් සේවාවල ආරක්ෂාවට එරෙහිව සිදු කරනු ලබන නීති විරෝධී ක්‍රියා මැඩපැවත්වීම සඳහා වූ සම්මුතිය.

3. 1973 වර්ෂයේ දෙසැම්බර් මස 14 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ රාජ්‍ය දූත නියෝජිතයන් ඇතුළු ජාත්‍යන්තර වශයෙන් ආරක්ෂිත තැනැත්තන්ට එරෙහිව සිදු කරනු ලබන අපරාධ වැළැක්වීම සහ දඬුවම් දීම සඳහා වූ සම්මුතිය.

4. 1979 වර්ෂයේ දෙසැම්බර් මස 17 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ ප්‍රාණ ඇපකරුවන් ග්‍රහණයට ගැනීමට එරෙහිව වූ ජාත්‍යන්තර සම්මුතිය.

5.1980 වර්ෂයේ මාර්තු මස 3 වන දින වියෙනා හි දී සම්මත කර ගනු ලැබූ න්‍යෂ්ටික ද්‍රව්‍යවලින් භෞතික වශයෙන් ආරක්ෂාව සඳහා වූ සම්මුතිය.

6. 1988 වර්ෂයේ පෙබරවාරි මස 24 වන දින මොන්ට්‍රියල් හි දී සම්මත කරනු ලැබූ සිවිල් ගුවන් සේවාවල ආරක්ෂාවට එරෙහිව සිදු කරනු ලබන නීති විරෝධී ක්‍රියා මැඩපැවැත්වීම සඳහා වූ සම්මුතියට අතිරේකව ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සඳහා වූ ගුවන් තොටුපොළවල දී සිදු කරනු ලබන නීති විරෝධී ක්‍රියා මැඩපැවැත්වීම සඳහා වූ ප්‍රොටොකෝලය.

7. 1988 වර්ෂයේ වර්ෂයේ මාර්තු මස 10 වන රෝමයේ දී සම්මත කර ගනු ලැබූ සමුද්‍රීය සංතරණයේ ආරක්ෂාව එරෙහිව සිදු කරනු ලබන නීති විරෝධී ක්‍රියා මැඩපැවැත්වීම සඳහා වූ සම්මුතිය.

8. 1988 වර්ෂයේ මාර්තු මස 10 වන දින රෝමයේ දී සම්මත කර ගනු ලැබූ මහද්වීපික තටකයේ පිහිටා ඇති නිශ්චිත වැඩපිළිවෙලවල ආරක්ෂාවට එරෙහිව සිදු කරනු ලබන නීති විරෝධී ක්‍රියා මැඩපැවැත්වීම සඳහා වූ ප්‍රොටොකෝලය

9. 1988 වර්ෂයේ දෙසැම්බර් මස 15 දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර මැඩපැවත්වීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය.

**දෙවන උපලේඛනය**

**[25(1) වන වගන්තිය]**

**සිරභාරයට ගැනීම සහ අත්අඩංගුවට ගැනීම පිළිබඳ දැනුම්දීම**

1. සිරභාරයට ගන්නා ලද තැනැත්තාගේ නම :-

2. සිරභාරයට ගන්නා ලද දිනය, වේලාව සහ ස්ථානය :-

3. සිරභාරයට ගැනීමට හේතු :-

4. සිරභාරයට ගනු ලැබූ තැනැත්තා අත්අඩංගුවේ තබා ගැනීමට යෝජිත ස්ථානය :-

5. සිරභාරයට ගන්නා නිලධරයාගේ නම, හඳුනාගැනීමේ අංකය සහ නිලය :-

6. සිරභාරයට ගනු ලැබූ තැනැත්තාගේ ළඟම ඥාතියාට ඔහු වෙත සාධාරණ ප්‍රවේශයක් ලබා ගැනීමට අවශ්‍ය විය හැකි වෙනත් යම් තොරතුරු :-

7. සිරභාරයට ගැනීම පිළිබඳ දැනුම්දීමක් නිකුත් කරනු ලබන තැනැත්තාගේ අනන්‍යතාවය :-

8. සිරභාරයට ගැනීම පිළිබඳ දැනුම්දීමක් නිකුත් කළ දිනය සහ වේලාව :-

9. සිරභාරයට ගැනීම පිළිබඳ දැනුම්දීමක් නිකුත් කළ නිලධරයාගේ නම, තනතුර සහ අත්සන :-

**තුන්වන උපලේඛනය**

**[25(5) වන වගන්තිය]**

**සිරභාරයට ගැනීම පිළිබඳ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට කරනු ලබන දැනුම්දීම**

1. සිරභාරයට ගන්නා ලද තැනැත්තාගේ නම :-

2. සිරභාරයට ගත් දිනය, වේලාව සහ ස්ථානය :-

3. සිරභාරයට ගැනීමට හේතු :-

4. සැකකරු රඳවා ඇති ස්ථානයේ පිහිටීම :-

5. සිරභාරයට ගන්නා නිලධරයාගේ නම, හඳුනාගැනීමේ අංකය සහ නිලය :-

6. රඳවා තැබීමේ ස්ථානය භාර නිලධරයාගේ නම සහ පදවි නාමය සහ ඔහු සම්බන්ධ කර ගත හැකි විස්තර:-

7. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට :-

(අ) සැකකරු වෙත ඉක්මණින් ප්‍රවේශ වීමට; සහ

(ආ) එම සිරභාරයට ගැනීම සහ රඳවා තැබීම මගින් සැකකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇත් ද යන්න නිශ්චය කර ගැනීමට,

හැකි කරන්නා වූ වෙනත් යම් තොරතුරු:-

**හතරවන උපලේඛනය**

**[25(3) වන වගන්තිය]**

**සිරභාරයට ගැනීම පිළිබඳ පොලිස්පතිවරයාට කරනු ලබන දැනුම්දීම**

1. සිරභාරයට ගන්නා ලද තැනැත්තාගේ නම :-

2. සිරභාරයට ගත් දිනය, වේලාව සහ ස්ථානය :-

3. සිරභාරයට ගැනීමට හේතු :-

4. සැකකරු රඳවා ඇති ස්ථානයේ පිහිටීම :-

5. සිරභාරයට ගන්නා නිලධරයාගේ නම, හඳුනාගැනීමේ අංකය සහ නිලය :-

6. රඳවා තැබීමේ ස්ථානය භාර නිලධරයාගේ නම සහ පදවි නාමය සහ ඔහු සම්බන්ධ කර ගත හැකි විස්තර:-

**පස්වන උපලේඛනය**

**[29(2) වන වගන්තිය]**

**රඳවා තැබීමේ නියමය**

1. රඳවා තැබීමේ නියමයේ අංකය :-

2. රඳවා තැබීමේ නියමය නිකුත් කරනු ලබන දිනය සහ ස්ථානය :-

3. රඳවා තැබීමේ නියමය නිකුත් කිරීම සඳහා ඉල්ලා සිටින ලද නිලධරයාගේ අනන්‍යතාවය සහ එකී ඉල්ලීමේ දිනය සහ අදාළ වන්නේ නම් යොමු අංකය :-

4. රඳවා ගැනීමට බලය දෙනු ලැබුයේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාගේ (සැකකරුගේ) නම :-

5. බලයලත් රඳවා තැබීමේ ස්ථානය :-

6. රඳවා තැබීමේ කාලසීමාව :-

7. සැකකරු රඳවා තැබීම සඳහා අවසර දී ඇති කාර්යය:-

**11.11.2025**